# පාසැල් සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයේ ප්‍රවණතා හා එහි උපනතීන්


හද්‍රානි සේනානායක

සුපුන් ප්‍රියදර්ශන

සහාය පර්යේෂක කණ්ඩායම

නිලුකා සංජීවනී

දිල්හාරා වරාගොඩ

නිලුක්ෂි තිසේරා

වසන්ත කුමාර

**පර්යේෂණ අංශය,**

**අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය,**

**ආරක්ෂක අමාත්‍යාංශය.**

# ස්තුතිය

"පාසැල් සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයේ ප්‍රවණතාවයන් හා එහි උපනතීන් - 2017" සමීක්ෂණය සාර්ථකව නිමකර ගැනීමට සහය දැක්වූ,

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සභාපති මහාචාර්ය සමන් අබේසිංහ මහතා,

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් සුනිල් හෙට්ටිආරච්චි මහතා, අතිරේක ලේකම් එච්. යු. ප්‍රේමතිලක මහතා, අධ්‍යාපන අධ්‍යක්ෂ (සෞඛ්‍ය හා පෝෂණය) රේනුකා පීරිස් මිය ඇතුලු සමීක්ෂණය සදහා සහයෝගය ලබාදුන් සියලුම නිලධාරී මහත්ම මහත්මීන්ට,

තෝරාගත් පාසැල් වල සියලුම විදුහල්පතිවරුන් හා සමීක්ෂණය සඳහා සහය දුන් සියලුම ගුරු මහත්ම මහත්මීන්ට,

නියෝජ්‍ය අධ්‍යක්ෂ ටී. ඩබ්ලිව්. පේමසිරි මහතාට, අධ්‍යාපන හා නිවාරක පුහුණු අංශයේ සහකාර අධ්‍යක්ෂක ප්‍රදීප් කොහොලානේගෙදර මහතාට, බාහිර සේවා අංශයේ සහකාර අධ්‍යක්ෂක ඩබ්ලිව්. මාරසිංහ මහතාට,

හිරුණී වත්සලා, තමර දර්ශන, නිලුක්ෂි තිසේරා, නිලානි රේණුකා, සජීව අතාවුද (පර්යේෂණ නිලධාරීන්), මහේෂි පෙරේරා (විද්‍යාත්මක නිළධාරී) දිල්හාරා වරාගොඩ (සහකාර පර්යේෂණ නිලධාරී), නිලුකා සංජීවනී (හිටපු සහකාර පර්යේෂණ නිලධාරී), තරිදු සඳරුවන් මහතා (තොරතුරු තාක්ෂණ කළමනාකරු), තමරා ජයවර්ධන, සමන්තා වීරසේකර (පද්ධති විශ්ලේෂක), බුද්ධිමා නුවන්ගනී (සහකාර බාහිර සේවා නිලධාරී ) රමේෂ් තාරක, නිලංග ආසිරි (හිටපු තොරතුරු තාක්ෂණික  සහායක)

සමීක්ෂණයේ දත්ත එක්රැස්කිරීමට සහාය වූ සියලුම බාහිර සේවා නිලධාරීන්, සියලුම අධ්‍යාපන හා පුහුණු නිලධාරීන්,

දත්ත එක්රැස් කිරීමට සහය දුන් සියලුම බාහිර ක්ෂේත්‍ර සමීක්ෂකයින් හා දත්ත ලබාදුන් සිසුන්,

වෙත අපගේ විශේෂ ස්තුතිය පුද කරමු.

හද්‍රානි සේනානායක

සුපුන් ප්‍රියදර්ශන

# පෙළගැස්ම

01.හැඳින්වීම ........ 1
1.1 අධ්‍යයන පසුබිම ........ 2
1.2 අධ්‍යයනයේ අරමුණු ........ 4
1.3 අධ්‍යයන ක්‍රමවේදය ........ 4
1.4 දත්ත රැස්කිරීමේ ශිල්ප ක්‍රම ........ 5
සිතියම 01- සමීක්ෂණය සඳහා නියැදිය මගින් ආවරණය වූ දිස්ත්‍රික්ක ........ 6
1.5 දත්ත විශ්ලේෂණය ........ 6
02. පර්යේෂණ ප්‍රතිඵල ........ 7
2.1 ප්‍රජා විද්‍යාත්මක තොරතුරු ........ 7
2.1.1 විවේක කාලය ගත කරන ආකාරය/විනෝදාංශ ........ 8
2.1.2 සිසුන්ගේ පවුල් පසුබිම ........ 9
2.1.3 දහම් පාසැල් අධ්‍යාපනය ........ 9
2.2 පාසල් සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිත තත්ත්වය පිළිබඳ අනාවරණයන් ........ 11
2.2.1 සිසුන් මත්ද්‍රව්‍ය භාවිත කිරීමේ සංයුතිය ........ 11
2.2.2 සිසුන්ගේ බහුවිධ මත්ද්‍රව්‍ය භාවිතයෙහි සංයුතිය ........ 12
2.2.3 සිසුන් මත්ද්‍රව්‍ය අත්හදා බැලීමට පෙළඹුණු සාධක හා ස්ථාන ........ 15
2.3 දිස්ත්‍රික්ක අනුව සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය ........ 16
2.3.1 අනුරාධපුර දිස්ත්‍රික්කය ........ 17
2.3.2 මොණරාගල දිස්ත්‍රික්කය ........ 18
2.3.3 පුත්තලම දිස්ත්‍රික්කය ........ 19
2.3.4 හම්බන්තොට දිස්ත්‍රික්කය ........ 20
2.3.5 කොළඹ දිස්ත්‍රික්කය ........ 21
2.3.6 මහනුවර දිස්ත්‍රික්කය ........ 22
2.3.7 ගම්පහ දිස්ත්‍රික්කය ........ 23
2.3.8 කුරුණෑගල දිස්ත්‍රික්කය ........ 25
2.3.9 රත්නපුර දිස්ත්‍රික්කය ........ 26
2.3.10 යාපනය දිස්ත්‍රික්කය ........ 27
2.3.11 කළුතර දිස්ත්‍රික්කය ........ 28
2.3.12 ගාල්ල දිස්ත්‍රික්කය ........ 28
2.4. දිස්ත්‍රික්ක අනුව එක් එක් මත්ද්‍රව්‍ය වර්ගවල ප්‍රචලිත බව ........ 29
2.4.1 දිස්ත්‍රික්ක අනුව සිගරට් භාවිතයේ ප්‍රචලිතබව ........ 30
2.4.2 මද්‍යසාර භාවිතයේ ප්‍රචලිතබව (දිස්ත්‍රික්ක අනුව) ........ 30

2.4.3 දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන (දුම්කුඩු) භාවිතයේ ප්‍රචලිතබව (දිස්ත්‍රික්ක මට්ටමෙන්)....................31
2.4.4 දිස්ත්‍රික්ක අනුව ගංජා භාවිතයේ ප්‍රචලිතබව ....................32
2.4.5 දිස්ත්‍රික්ක අනුව වෙනත් මත්ද්‍රව්‍ය වර්ග භාවිතයේ ප්‍රචලිතබව ....................33
2.5. මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි යොමුවීමට හේතු හා ඔවුන්ගේ ප්‍රජා හා සමාජ විද්‍යාත්මක සාධක....................34
2.5.1 ස්ත්‍රී පුරුෂභාවය අනුව මත්ද්‍රව්‍ය භාවිතයෙහි ප්‍රවණතා ....................34
2.5.2 ජනවර්ගය අනුව සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයෙහි ප්‍රවණතා ....................36
2.5.3 ආගම අනුව සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයෙහි ප්‍රවණතා ....................37
2.5.4 මත්ද්‍රව්‍ය භාවිතය හා සිසුන්ගේ විනෝදාංශ අතර සහසම්බන්ධතාවය ....................39
2.5.5 සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි දෙමාපියන්ගේ අධ්‍යාපන මට්ටමෙහි බලපෑම....................41
2.5.7 පරිසර සාදක හා මත්ද්‍රව්‍ය භාවිත කිරීමේ ප්‍රවණතා ....................45
2.5.8 මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් සමඟ සිසුන් පවත්වන අන්තර් සබඳතා ....................45
2.5.9 සිසුන් සහ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් අතර සම්බන්ධතාවය ....................47
2.5.10 සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි ඔවුන් ජීවත්වන පරිසරයේ බලපෑම....................48
2.5.10.1 සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි අසල්වැසියන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයෙහි බලපෑම ....................49
2.5.10.2 සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි මත්ද්‍රව්‍ය භාවිත කරන සමීපතමයින්ගේ බලපෑම ....................51
2.5.11 සිසුන් මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීමේ අවදානම් තත්ත්වය ....................54
2.6 සිසුන් මත්ද්‍රව්‍ය භාවිත නොකිරීමට හේතු ....................56
2.7 මත්ද්‍රව්‍ය පිළිබඳ සිසුන් තුළ පැවති දැනුම හා ආකල්ප ....................57
2.7.1 මත්ද්‍රව්‍ය පිළිබඳ සිසුන්ගේ දැනුම ....................57
2.8.3 සිසුන් ජීවත්වන ප්‍රදේශ තුළ පවතින සමාජ හා සෞඛ්‍ය ගැටලු පිළිබඳ දැනුවත් බව....................62
2.7.4 මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් පිළිබඳව සිසුන්ගේ දැනුවත්භාවය....................63
2.8.6 මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් සඳහා සහභාගි වීමට සිසුන් තුළ ඇති අවශ්‍යතාවය....................64
03. නිගමන ....................67
04. යෝජනා ....................68
ආශ්‍රිත ග්‍රන්ථ....................69

## වගු නාමාවලිය

වගුව 01 - 2012 - 2016 දක්වා කාලය තුළ මත්ද්‍රව්‍ය සඳහා ප්‍රතිකාර ලබා ගැනීමට ඇතුළත් වූ අවුරුදු 19 ට අඩු තරුණයින්

වගුව 02 - දිස්ත්‍රික්ක අනුව නියැදියට තෝරාගත් පාසල් සිසුන්

වගුව 03 - සමීක්ෂණයට ලක්කළ සිසුන්ගේ ප්‍රජා විද්‍යාත්මක තොරතුරු

වගුව 04 - පාසල් සිසුන්ගේ දහම් පාසැල් අධ්‍යාපනය පිළිබඳ තත්ත්වය

වගුව 05 - එක් දිනක් හෝ භාවිත කළ බහුවිධ මත්ද්‍රව්‍ය වර්ග සම්බන්ධ ඇස්තමේන්තුගත ප්‍රතිශතයන්

වගුව 06 - දැනට භාවිත කරන බහුවිධ මත්ද්‍රව්‍ය වර්ග සම්බන්ධ ඇස්තමේන්තුගත ප්‍රතිශතයන්

වගුව 07 - සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය හා භූගෝලීය ව්‍යාප්තිය

වගුව 08 - අනුරාධපුර දිස්ත්‍රික්කයේ සිසුන් අතර ප්‍රචලිත මත්ද්‍රව්‍ය වර්ග සහ සංයුතිය

වගුව 09 - මොණරාගල දිස්ත්‍රික්කයේ සිසුන් අතර ප්‍රචලිත මත්ද්‍රව්‍ය වර්ග සහ සංයුතිය

වගුව 10 - පුත්තලම දිස්ත්‍රික්කයේ සිසුන් අතර ප්‍රචලිත මත්ද්‍රව්‍ය මත්ද්‍රව්‍ය වර්ග සහ සංයුතිය

වගුව 11 - හම්බන්තොට දිස්ත්‍රික්කයේ සිසුන් අතර ප්‍රචලිත මත්ද්‍රව්‍ය වර්ග සහ සංයුතිය

වගුව 12 - කොළඹ දිස්ත්‍රික්කයේ සිසුන් අතර ප්‍රචලිත මත්ද්‍රව්‍ය වර්ග සහ සංයුතිය

වගුව 13 - මහනුවර දිස්ත්‍රික්කයේ සිසුන් අතර ප්‍රචලිත මත්ද්‍රව්‍ය වර්ග සහ සංයුතිය

වගුව 14 - ගම්පහ දිස්ත්‍රික්කයේ සිසුන් අතර ප්‍රචලිත මත්ද්‍රව්‍ය වර්ග සහ සංයුතිය

වගුව 15 - කුරුණෑගල දිස්ත්‍රික්කයේ සිසුන් අතර ප්‍රචලිත මත්ද්‍රව්‍ය වර්ග සහ සංයුතිය

වගුව 16 - රත්නපුර දිස්ත්‍රික්කයේ සිසුන් අතර ප්‍රචලිත මත්ද්‍රව්‍ය වර්ග සහ සංයුතිය

වගුව 17 - යාපනය දිස්ත්‍රික්කයේ සිසුන් අතර ප්‍රචලිත මත්ද්‍රව්‍ය වර්ග සහ සංයුතිය

වගුව 18 - කළුතර දිස්ත්‍රික්කයේ සිසුන් අතර ප්‍රචලිත මත්ද්‍රව්‍ය වර්ග සහ සංයුතිය

වගුව 19 - ගාල්ල දිස්ත්‍රික්කයේ සිසුන් අතර ප්‍රචලිත මත්ද්‍රව්‍ය වර්ග සහ සංයුතිය

වගුව 20 - ජීවත් වන ප්‍රදේශය තුළ මත්ද්‍රව්‍ය භාවිතය නිසා ගැටලුවලට මුහුණ දුන් පුද්ගලයින් පිළිබඳ දැනුවත්භාවය

## ප්‍රස්තාර නාමාවලිය

ප්‍රස්තාරය 01 - මත්ද්‍රව්‍ය සඳහා අත්අඩංගුවට පත් වූ අවුරුදු 19 ට අඩු තරුණයින් (2012 - 2016)
ප්‍රස්තාර 02 - සිසුන්ගේ වයස් සංයුතිය
ප්‍රස්තාරය 03 - සිසුන්ගේ විනෝදාංශ
ප්‍රස්තාරය 04 - සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිත ස්වභාවය
ප්‍රස්තාරය 05 - සිසුන් භාවිත කරන බහුවිධ මත්ද්‍රව්‍ය වර්ග සහ සංයුතිය
ප්‍රස්තාරය 06 - සිසුන් මත්ද්‍රව්‍ය අත්හදා බැලීමට යොමුවී ඇති අවස්ථා
ප්‍රස්තාරය 07 - මත්ද්‍රව්‍ය භාවිතය හා ස්ත්‍රී පුරුෂභාවය
ප්‍රස්තාරය 08 -ජනවර්ගය අනුව සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය
ප්‍රස්තාරය 09 -ජනවර්ගය අනුව සිසුන් භාවිත කරන බහුවිධ මත්ද්‍රව්‍ය වර්ග
ප්‍රස්තාරය 10 - ආගම අනුව සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයෙහි ප්‍රවණතා
ප්‍රස්තාරය 11 - ආගම අනුව සිසුන් භාවිත කළ බහුවිධ මත්ද්‍රව්‍ය වර්ග
ප්‍රස්තාරය 12 - මත්ද්‍රව්‍ය භාවිතය හා විනෝදාංශ අතර සම්බන්ධතාව
ප්‍රස්තාරය 13 - සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි දෙමාපියන්ගේ අධ්‍යාපන මට්ටමෙහි බලපෑම
ප්‍රස්තාරය 14 - සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි පියාගේ රැකියාවේ බලපෑම
ප්‍රස්තාරය 15 - සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි මවගේ රැකියාවේ බලපෑම
ප්‍රස්තාරය 16 - මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයන් පිළිබඳ සිසුන්ගේ දැනුවත්භාවය
ප්‍රස්තාරය 17 - මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් මුණගැසී තිබෙන ස්ථාන/අවස්ථා
ප්‍රස්තාරය 18 - මත්ද්‍රව්‍ය භාවිත කරන සමීපතම පුද්ගලයින්
ප්‍රස්තාරය 19 - සිසුන්ගේ සමීපතම පුද්ගලයින් භාවිත කරන බහුවිධ මත්ද්‍රව්‍ය වර්ග
ප්‍රස්තාරය 20 - මත්ද්‍රව්‍ය භාවිතය හා පාරිසරික සාධක අතර සම්බන්ධතාවය
ප්‍රස්තාරය 21 - සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි අසල්වැසියන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයේ බලපෑම
ප්‍රස්තාරය 22 - මත්ද්‍රව්‍ය භාවිත තත්ත්වය හා අසල්වැසියන් විසින් භාවිත කළ විවිධ මත්ද්‍රව්‍ය වර්ග
ප්‍රස්තාරය 23 - මත්ද්‍රව්‍ය භාවිත තත්ත්වය හා සමීපතමයන් භාවිත කළ බහුවිධ මත්ද්‍රව්‍ය වර්ගයන්
ප්‍රස්තාරය 24 - මත්ද්‍රව්‍ය භාවිතය සහ මත්ද්‍රව්‍ය භාවිත කරන සමීපතම පුද්ගලයින් අතර සම්බන්ධතාවය
ප්‍රස්තාරය 25 -ගැටලු විසඳාගැනීමට උපකාරීවන සහාය කණ්ඩායමේ සංයුතිය
ප්‍රස්තාරය 26 - සිසුන්ගේ ගැටලු විසඳීමට සහාය වූ පුද්ගලයන්ගේ සංයුතිය
ප්‍රස්තාරය 27 - සිසුන් මත්ද්‍රව්‍ය භාවිත නොකිරීමට හේතු සාධක
ප්‍රස්තාරය 28 - මත්ද්‍රව්‍ය භාවිතයේ ප්‍රතිවිපාක පිළිබඳ සිසුන්ගේ දැනුවත්භාවය
ප්‍රස්තාරය 29 - සමාජ අපගාමී හා සමාජ අපචාරී ක්‍රියා පිළිබඳ සිසුන්ගේ දැනුම
ප්‍රස්තාරය 30 - මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් පිළිබඳව සිසුන්ගේ දැනුවත්භාවය
ප්‍රස්තාරය 31 - සිසුන් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් වලට සහභාගි වීමේ සංයුතිය

## 01.හැඳින්වීම

රටක ජීවනාලිය තරුණ පරපුර බැවින් නව යෞවන හා යෞවන වයස්වල සිටින පුද්ගලයින්ගේ යහපැවැත්ම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ලබයි. UNDESA ට අනුව යෞවන වයස යනු පුද්ගලයෙකු දරුවෙකුගේ සිට වැඩිහිටියෙකු දක්වා පරිවර්තනය වන කාලයයි. මෙම කාල වකවානුව තුළ ඔවුන් වේගවත් මානසික හා භෞතික සංවර්ධනයක් අත්කරගන්නා අතර මෙය රටකින් රටකට වෙනස් වන අතර ඔවුන්ගේ භූමිකාව අනුව ද වෙනස් වේ. මෙම වයස් වල පසුවන පුද්ගලයින්, රටක ආර්ථික කටයුතු වල යෙදීමට හෝ සමාජීය වගකීම් දැරීමට තරම් ශාරීරික හෝ මානසික පරිණතභාවයකින් යුක්ත නොවන බැවින් ඔවුන්, ඒ සඳහා අවශ්‍ය නිපුනතාවන් ඇතිකරගනු වස් පූර්ණකාලීන පාසැල් හෝ වෘත්තීමය අධ්‍යාපන කටයුතු වල නිරත වේ. ඒ අනුව ඔවුනොවුන්ගේ නිවැරදි ක්‍රියාකාරීත්වය, රටක ඉදිරි සංවර්ධනය කෙරෙහි සෘජුවම බලපෑම් කරන බැවින් ඔවුන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම අවශ්‍ය වේ. (UNDESA, 2013,January). http://www.hss.ruh.ac.lk/index.php/staff/academic-staff/sociology

නව යෞවන වයසේ පසුවන පාසැල් සිසුන් යනු රටක අනාගත ආර්ථික ශක්‍යතාව වන අතර ඔවුන් වර්තමාන සමාජය තුළ පවත්නා හර පද්ධතීන් හා වටිනාකම් සුරක්ෂිතව අනාගතයට ගෙන යන පිරිසකි. එබැවින් ඔවුන්ව ආරක්ෂා කිරීම මෙන්ම ඔවුන්ගේ ශාරීරික හා මානසික සංවර්ධනය කෙරෙහි නිරන්තර අවධානය යොමුකිරීම, වර්තමාන සමාජය විසින් පැහැර නොහැරිය යුතු වගකීමක් වේ.

ගෝලීය වශයෙන් නව යෞවන පිරිස් පුළුල්ව අන්තර්ජාල භාවිතය කෙරෙහි යොමු වීම, රාත්‍රී සමාජශාලා වෙත පිවිසීම, අඩුවයසින් ලිංගික අත්හදා බැලීම් හා සූදුව වැනි සමාජ අපගාමී ක්‍රියා වලට යොමුවීම මෙන්ම මත්ද්‍රව්‍ය භාවිතය, අලෙවිය හා ජාවාරම් සඳහා යොමුවීම/යොමුකරගැනීම තරුණ පිරිස් ශාරීරික හා මානසිකව පිරිහීමට මුලික වශයෙන් හේතුවී ඇති අතර මෙවැනි හේතූන් උග්‍ර සමාජ ගැටලු ඇතිකරවීමට මූලික වන බව දැක්විය හැකිය. මෙවැනි සමාජීය ගැටලූ වලට ගෝලීය වශයෙන් විසඳුම් සෙවීම සඳහා එක්සත් ජාතීන් ඇතුලු විවිධ සංවිධාන වර්තමානය වන විට විවිධ පර්යේෂණ සිදුකරමින් ගත යුතු විධිමත් පියවර හා අවශ්‍ය සැලසුම් සකස් කරමින් සිටියි.

වර්තමානයේදී ශ්‍රී ලංකාව තුළ ද නව යෞවනයින්ගේ අනාගත සමාජීය යහපැවැත්මෙහි බිඳවැටීම් කෙරෙහි ඉහත සාධක බලපා ඇති බව පැහැදිලි වේ. නව යෞවන වයසේ සිටින ඇතැම් පාසැල් සිසුන් මත්ද්‍රව්‍ය වර්ග භාවිතය කෙරෙහි යොමුවීමක් පවතින බව වාර්තා වේ. මේ පිළිබඳව පාසැල්වලින් මහජනතාවගෙන් සහ විවිධ පාර්ශවයන්ගෙන් පැමිණිලි ලැබී ඇත. ඒ අනුව මෙම ගැටලුව සඳහා හේතු වූ සාධක විමසා බැලීමටත් ඒ තුළින් වඩාත් ප්‍රශස්ත විසඳුම් ඉදිරිපත් කිරීමත් උදෙසා මෙම සමාජ විද්‍යාත්මක පර්යේෂණය, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ පර්යේෂණ අංශය මගින් සිදුකරන ලදී.

## 1.1 අධ්‍යයන පසුබිම

වර්තමානය වනවිට ශ්‍රී ලංකාවේ නිරන්තර සාකච්ඡාවට ලක් වී ඇති ප්‍රධාන මාතෘකාවක් ලෙස පාසල් ළමුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය හැඳින්විය හැකිය. මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් විසින් විවිධ උපක්‍රම භාවිත කර පාසල් සිසුන්ට මත්ද්‍රව්‍ය බෙදාහරිනු ලබයි. පැණි බීම, ටොෆි, චොකලට් ආදී කෑම වර්ගවලට ගංජා, දුම්කොළ ආදි විවිධ මත්ද්‍රව්‍ය අඩංගු කරමින් පාසල් ළමුන්ට විකිණීම මෙම ජාවාරම්කරුවන්ගේ එක් උපක්‍රමයකි. තවද මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධ පවතින මිථ්‍යාමත විවිධ පුද්ගලයින් හරහා සිසුන් තුළ ස්ථාපිත කිරීම ද තවත් උපක්‍රමයකි.


පාසල් සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ විවිධ පුවත් හා නිල නොලත් තොරතුරු, විද්‍යුත් මාධ්‍ය හා මුද්‍රිත මාධ්‍ය ඔස්සේ නිතර අනාවරණය වූ අතර ඇතැම් පාර්ලිමේන්තු සැසි වලදී ද මේ පිළිබඳව සාකච්ඡාවට බඳුන් වී ඇත. දිවයිනේ ප්‍රදේශ ගණනාවකින් මෙවැනි පැණි බීම සහ කෑම වර්ගවලට විවිධ මත්ද්‍රව්‍ය අන්තර්ගත කර පාසල් ළමුන්ට අලෙවි කළ පුද්ගලයින් මෙන්ම විවිධ මත්ද්‍රව්‍ය සෘජුවම සිසුන්ට අලෙවි කරන පුද්ගලයින් ද පොලිස් අත්අඩංගුවට පත්වී ඇති බව වාර්තාවලින් සනාථ වී තිබේ. මෙවැනි ජාවාරම්කරුවන් නීතියේ රැහැනට හසුවුවද පාසල් ළමුන් ඉලක්ක කර ගනිමින් මත්ද්‍රව්‍ය අලෙවිය හා ජාවාරම් කිරීම තවදුරටත් පැවතීම ගැටලුවට කරුණකි.

පාසැල් සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධ අවිධිමත් ලෙස තොරතුරු අනාවරණය වීමද ක්‍රමයෙන් වැඩිවෙමින් පවතින අතර භාවිතය සම්බන්ධ තොරතුරු වැඩි වශයෙන් වාර්තා වන්නේ කොළඹ, ගම්පහ, ගාල්ල, කුරුණෑගල, කළුතර, අනුරාධපුර, රත්නපුර, මහනුවර, පුත්තලම හා යාපනය යන දිස්ත්‍රික්ක වලිනි.

ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය සම්බන්ධ අත්අඩංගුවට ගැනීම් ගත්කළ කොළඹ දිස්ත්‍රික්කය පළමු ස්ථානය ගන්නා අතර අනෙකුත් දිස්ත්‍රික්ක අතුරින් ගම්පහ, කළුතර, ගාල්ල, කුරුණෑගල, මහනුවර අනුරාධපුර, රත්නපුර, හම්බන්තොට, පුත්තලම හා යාපනය යන දිස්ත්‍රික්ක තුළ මත්ද්‍රව්‍ය සම්බන්ධ අත්අඩංගුවට ගැනීම් වැඩි ප්‍රමාණයක් වාර්තා වේ. (මත්ද්‍රව්‍ය දුර්භාවිත තොරතුරු අත්පොත - 2017)

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත ඇගයීම් පද්ධතියට ලැබෙන මත්ද්‍රව්‍ය ආශ්‍රිත අත්අඩංගුවට පත් පුද්ගලයින් සම්බන්ධ දත්ත විශ්ලේෂණය අනුව 2012 සිට 2016 වර්ෂය දක්වා කාලය තුළ අත්අඩංගුවට පත් අවුරුදු 19 ට අඩු පුද්ගලයින් ප්‍රමාණයෙහි ක්‍රමිකව වැඩිවීමේ උපනතියක් දක්නට ඇත.

**ප්‍රස්තාරය 01 : මත්ද්‍රව්‍ය සඳහා අත්අඩංගුවට පත් වූ අවුරුදු 19 ට අඩු තරුණයින් (2012 - 2016)**




**මූලාශ්‍රය : මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත ඇගයීම් පද්ධතිය - 2016**

එසේම අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත ඇගයීම් පද්ධතියට ලැබෙන දත්ත විශ්ලේෂණය අනුව ප්‍රතිකාර සඳහා ඇතුළත් වන අවුරුදු 19 ට අඩු පිරිස ගත් කල එහිද වැඩිවීමක් දක්නට ලැබේ. 2015 වර්ෂයේ දී මත්ද්‍රව්‍ය සඳහා ප්‍රතිකාර ලබා ගැනීමට ඇතුළත් වූ අවුරුදු 19 ට අඩු පිරිස 74 දෙනෙකු වූ අතර එය 2016 වර්ෂය අවසානයේදී 137 දක්වා ඉහළ ගොස් තිබේ. තවද 2016 වර්ෂයේ දී මත්ද්‍රව්‍ය සඳහා ප්‍රතිකාර ලබා ගැනීමට ඇතුළත් වූ අවුරුදු 19 ට අඩු පිරිස, 2015 වර්ෂයට සාපේක්ෂව 85% ක වැඩිවීමක් පෙන්නුම් කරයි. මෙමගින් ද පැහැදිලි වන්නේ පාසල් යන වයසේ සිසුන් සුළු පිරිසක් මත්ද්‍රව්‍ය භාවිතය නිසා තම අධ්‍යාපනය නවතා දමා ඇති බවත් නීතියේ රැහැනට හසුවීම හෝ ප්‍රතිකාර මධ්‍යස්ථාන වලට ඇතුළත් කිරීම සිදුවී ඇති බවත්ය. එම වැඩි වීම පහත වගුව මඟින් මනාව පැහැදිලි වේ.

**වගුව 01 - 2012 - 2016 දක්වා කාලය තුළ මත්ද්‍රව්‍ය සඳහා ප්‍රතිකාර ලබා ගැනීමට ඇතුළත් වූ අවුරුදු 19 ට අඩු තරුණයින්**

| වර්ෂය | 2012 | | 2013 | | 2014 | | 2015 | | 2016 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **වයස** | සංඛ්‍යාව | *ප්‍රතිශතය | සංඛ්‍යාව | *ප්‍රතිශතය | සංඛ්‍යාව | *ප්‍රතිශතය | සංඛ්‍යාව | *ප්‍රතිශතය | සංඛ්‍යාව | *ප්‍රතිශතය |
| **0 - 14** | **9** | 0.8 | **6** | 0.4 | **20** | 1.2 | **6** | 0.4 | **7** | 0.3 |
| **15 -19** | **58** | 5.2 | **50** | 3.7 | **85** | 5.2 | **68** | 5 | **130** | 6 |
| **< 20** | **67** | 6 | **56** | 4.1 | **105** | 6.4 | **74** | 5 | **137** | 6 |

*ප්‍රතිශතය-ප්‍රතිකාර ලබාගත් මුලු පුද්ගලයින්ට ප්‍රතිශතයක් ලෙස

**මූලාශ්‍රය - (මත්ද්‍රව්‍ය දුර්භාවිත තොරතුරු අත්පොත - 2015)**

මත්ද්‍රව්‍ය සම්බන්ධ අත්අඩංගුවට ගැනීම් හා ප්‍රතිකාර සඳහා ඇතුළත් වන පුද්ගලයින් පිළිබඳ තොරතුරු මගින් මත්ද්‍රව්‍ය දුර්භාවිතය පිළිබඳ දළ අදහසක් ලබාගත හැකි නමුත් භූගෝලීය වශයෙන් මත්ද්‍රව්‍ය දුර්භාවිතයේ විශාලත්වය, මත්ද්‍රව්‍ය දුර්භාවිතය සඳහා යොමුවීමට හේතුවන සාධක හා එහි උපනතීන් පිළිබඳව නිශ්චිත නිගමන වලට එළඹීම හා මේ සම්බන්ධ ප්‍රතිපත්ති හා සැලසුම් සකස්

කිරීමට එය ප්‍රමාණවත් නොවේ. එබැවින් මෙහිදී මත්ද්‍රව්‍ය ආශ්‍රිත සමීක්ෂණක් සිදුකර එම තොරතුරු අනාවරණය කර ගත යුතු වේ.

ඒ අනුව අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ පර්යේෂණ අංශය විසින් දිස්ත්‍රික්ක 12 කින් සසම්භාවීව තෝරාගත් පාසල් 100 ක් ඇසුරෙන් මෙම සමීක්ෂණය සිදුකරන ලදී.

## 1.2 අධ්‍යයනයේ අරමුණු

- පාසැල් ළමුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය හා ඔවුන්ගේ ප්‍රජා හා සමාජ විද්‍යාත්මක සාධක හඳුනා ගැනීම සහ භාවිත රටාවන්, මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි යොමුවීමට හේතු හා වැළැක්වීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග හඳුනා ගැනීම.
- පාසල් සිසුන් මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි යොමුවීමට ඇති ඉඩ ප්‍රස්ථා අවම කිරීමට අදාළ ප්‍රතිපත්ති හා නිර්දේශ ඉදිරිපත් කිරීම.

## 1.3 අධ්‍යයන ක්‍රමවේදය

පර්යේෂණ ක්‍රමය ලෙස සමීක්ෂණ ක්‍රමය (Survey Method) යොදා ගන්නා ලද අතර නියැදිය තුළ වූ සිසුන්, ගුරුභවතුන් හා විදුහල්පතිවරුන් සම්මුඛ සාකච්ඡාවට ලක්කර ලබාගත් ආනුභවික දත්ත විශ්ලේෂණය කිරීමෙන් අධ්‍යයනයේ නිගමන කරා එළඹුණි.

2014 වර්ෂයේ සංඛ්‍යා ලේඛන හා වාර්තා පදනම් කරගනිමින් හෙරොයින් සම්බන්ධ අත්අඩංගුවට ගත් පුද්ගලයින් සහ අවුරුදු 19 ට අඩු ප්‍රතිකාර ලබාගත් පුද්ගලයින්ගේ ඉහළ ව්‍යාප්තියක් පෙන්නුම් කරන දිස්ත්‍රික්ක හඳුනා ගන්නා ලදී. ඒ අනුව ඉහළ ව්‍යාප්තියක් සහිත දිස්ත්‍රික්ක 12 ක් මෙම සමීක්ෂණය සඳහා තෝරා ගන්නා ලදී. එක් එක් දිස්ත්‍රික්කය තුළ පාසල් හා එම පාසල් වල සිසුන් තෝරා ගැනීමේදී සම්භාවිතා නියැදීම් ක්‍රමයක් (Random Sampling) යොදාගනු ලැබීය. නාගරීකරණය මත සමාජ ව්‍යුහයේ සිදුවී ඇති වෙනස්කම්, මත්ද්‍රව්‍ය දුර්භාවිතය, මත්ද්‍රව්‍ය ජාවාරම් හා අත්අඩංගුවට පත්වීම් වල ව්‍යාප්තිය එක් එක් දිස්ත්‍රික්ක අතර විෂමජාතීය මට්ටමක ඇති බැවින් එම එක් එක් දිස්ත්‍රික්කය තුළින් පාසැල් තෝරා ගැනීමේදී නියැදුම් ක්‍රමවේදය ලෙස ස්තෘත සසම්භාවී නියැදීම (Stratified Random Sampling) යොදාගන්නා ලදි. එක් එක් දිස්ත්‍රික්ක උප සංගහන ලෙස සලකමින් තෝරාගත් පාසල්වල මුළු ළමුන්ට ප්‍රතිශතයක් ලෙස 6 වසර සිට 13 වසර දක්වා සිටින මුළු ළමුන්ට සමානුපාතික වන ලෙස අධ්‍යයන නියැදිය සකස් කරන ලද අතර මෙහිදී සමානුපාතික විභේදනය යොදා ගනු ලැබීය. තෝරාගත් එක් එක් පාසැල් වල සිසුන් නියැදියට ඇතුළත් කරගැනීමේදී සරල සසම්භාවී නියැදි ක්‍රමය භාවිතා කරන ලදී. එය පහත පරිදි වේ.

$$n_0 = \frac{Z^2.P.Q}{d^2}$$

$$n_0 = \frac{1.96^2 * 0.5 * 0.5}{0.0140^2} = 5091$$

$$n = \frac{n_0}{1 + \frac{n_0 - 1}{N}}$$

$$n = \frac{5091}{1 + \frac{5091-1}{1603467}} = 5075$$

සංගණනයේ මූලික නියැදි ඒකකය පාසලක් ලෙස සැලකූ අතර තෝරාගත් පාසල් 100 ක් තුළ ළමුන් 51 ක් බැගින් වූ සරල සසම්භාවී නියදින් 100 ක එකතුවක් ලෙස මුළු නියැදිය සකස්කර ගනු ලැබීය. ඒ අනුව සමස්ත නියැදියේ විශාලත්වය සිසුන් 5075 ක් විය. දෝෂ ආන්තිකය 0.014 (d), P = 0.5 දී 95% විශ්‍රම්භ ප්‍රාන්තරයේ (C.I.) අගය t = 2 ලෙස ගතහොත් නියැදි 71 න් එකකදී හැර තොරතුරු සත්‍ය වන බව 95% ක විශ්වාසයකින් ප්‍රකාශ කළ හැකිය.

දිස්ත්‍රික්ක අනුව පාසල් හා ළමුන් තෝරාගත් ආකාරය පහත වගුව මඟින් දැක්වේ.

වගුව 02 - දිස්ත්‍රික්ක අනුව නියැදියට තෝරාගත් පාසල් සිසුන්

| දිස්ත්‍රික්කය | තෝරාගත් පාසල් සංඛ්‍යාව | නියැදියට ඇතුළත් කරගත් සිසුන් සංඛ්‍යාව |
|---|---|---|
| කොළඹ | 16 | 822 |
| ගම්පහ | 13 | 651 |
| කුරුණෑගල | 13 | 645 |
| මහනුවර | 10 | 527 |
| ගාල්ල | 08 | 401 |
| කළුතර | 08 | 394 |
| රත්නපුර | 08 | 410 |
| අනුරාධපුර | 05 | 251 |
| පුත්තලම | 06 | 309 |
| යාපනය | 05 | 249 |
| හම්බන්තොට | 05 | 258 |
| මොණරාගල | 03 | 158 |
| එකතුව | 100 | 5075 |

සමීක්ෂණය සඳහා  සිසුන් තෝරා ගැනීමේ දී ඔවුන්ගේ පෞද්ගලිකත්වයට හා අධ්‍යාපන කටයුතු වලට බාධා නොවන ආකාරයට සිසුන් තෝරා ගැනීමට හා තොරතුරු ලබා ගැනීමට ද කටයුතු කරනු ලැබුණි. සමීක්ෂණය ආරම්භ කිරීමට ප්‍රථමයෙන් සමීක්ෂණයේ ප්‍රශ්නාවලිය හා සම්මුඛ සාකච්ඡා සඳහා සිසුන් සම්බන්ධකර ගැනීම උදෙසා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සැසි කිහිපයකදී සාකච්ඡා කෙරුණු අතර අධ්‍යාපන අමාත්‍යාංශයේ ලිඛිත අවසරය මත සමීක්ෂණය සිදුකෙරෙනු ලැබීය.

## 1.4 දත්ත රැස්කිරීමේ ශිල්ප ක්‍රම

නියැදියට ඇතුළත් කරගත් පාසල් සිසුන් 5075 කගේ තොරතුරු ලබා ගැනීමේදී ව්‍යුහගත ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාකච්ඡා ශිල්ප ක්‍රම භාවිත කරමින් දත්ත රැස් කිරීම සිදුකරන ලදී. මූලික තොරතුරු

සපයන්නන් සමඟ සම්මුඛ සාකච්ඡා මාර්ගයෙන් තොරතුරු ලබාගත් අතර මේ සඳහා අදාළ පාසලේ ගුරුභවතුන් හා විදුහල්පතිවරුන් සම්බන්ධ කර ගන්නා ලදී.

අධ්‍යයනය සඳහා පාසැල් තෝරා ගැනීම, නියැදියට දත්ත දායකයන් ලෙස ළමුන් ඇතුළත් ගැනීම සහ ළමුන්ගෙන් තොරතුරු තොරතුරු ලබා ගැනීම සඳහා භාවිත කළ ශිල්ප ක්‍රම හා ප්‍රශ්නාවලි සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ පූර්ව එකඟතාවයකට පැමිණි අතර ඔවුන්ගේ අනුමැතිය යටතේ පාසැල් තෝරා ගැනීම සිදුවිය.

**සිතියම 01- සමීක්ෂණය සදහා නියැදිය මඟින් ආවරණය වූ දිස්ත්‍රික්ක**




## 1.5 දත්ත විශ්ලේෂණය

දත්ත විශ්ලේෂණය සඳහා Microsoft Excel හා SPSS 16 මෘදුකාංගය භාවිතා කළ අතර විශ්ලේෂණය සඳහා විස්තරාත්මක හා අනුමිතික සංඛ්‍යාන ශිල්ප ක්‍රම (Descriptive and Inferential Statistical Methods) යොදාගෙන ඇත.

## 02. පර්යේෂණ ප්‍රතිඵල

ශ්‍රී ලංකාවේ පාසැල් සිසුන් මත්ද්‍රව්‍ය කෙරෙහි යොමුවීමේ ප්‍රවණතාවයක් පවතින්නේ දැයි සොයා බැලීම මෙම සමීක්ෂණයේ මුඛ්‍ය අරමුණ වූ අතර එහිදී මත්ද්‍රව්‍ය භාවිත කරන සිසුන් සමීක්ෂණය තුළින් අනාවරණය කර ගැනීමත් ඔවුන්ගේ සමාජ හා ප්‍රජා විද්‍යාත්මක තොරතුරු, මත්ද්‍රව්‍ය භාවිත රටා හා භාවිතය සඳහා බලපාන සාධක හඳුනාගැනීමත් මෙම සමීක්ෂණයේ උප අරමුණු විය.

සමස්ත පර්යේෂණ වාර්තාව තුළ විවිධ විචල්‍යයන්ට අදාල දත්ත විශ්ලේෂණය කිරීමේදී සමීක්ෂණය සඳහා නියැදියට ඇතුලත් වූ **එක් දිනක් හෝ මත්ද්‍රව්‍ය භාවිත කළ, දැනට මත්ද්‍රව්‍ය භාවිතයේ යෙදෙන** හා **මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි කෙදිනකවත් යොමුවී නොමැති** එක් එක් ශිෂ්‍ය කාන්ඩ පදනම් කරගන්නා ලද අතර පර්යේෂණ ප්‍රතිඵල විවරණය කිරීමේදී ද එම එක් එක් ශිෂ්‍ය කාණ්ඩ අනුව සිදුකරන ලදී.

### 2.1 ප්‍රජා විද්‍යාත්මක තොරතුරු

සමීක්ෂණය සඳහා ඉලක්ක කර ගත් නියැදියේ දත්ත දායකයින් පිළිබඳ සමාජ හා ප්‍රජාවිද්‍යාත්මක තොරතුරු පහත පරිදි අනාවරණය විය.

සමීක්ෂණය සඳහා පාසැල් 100 ක සසම්භාවී නියැදියක් පදනම් කරගත් අතර ඒ තුළ සිසුන් 62%(3166) ක් හා සිසුවියන් 38% (1909) ක් ද නියැදිය තුළ නියෝජනය විය.

ජනවර්ග අනුව අධ්‍යයනයට භාජනය වූ සිසුන්ගේ ව්‍යාප්තිය සැලකූ විටද බහුතරයක් එනම්, 79.2% (4022) ක් සිංහල ජාතික සිසුන් විය. 9% (467) ක් ද්‍රවිඩ ජාතික සිසුන්ද 11% (546 ) ක් මුස්ලිම් ජාතික සිසුන්ද 1%(40) ක් වෙනත් ජාතික සිසුන් ද නියැදිය තුළ නියෝජනය විය.

ආගම අනුව නියැදියේ සංයුතිය සලකා බලන විටදී සිසුන්ගේ 73.3% (3724) ක් බෞද්ධ ආගමික සිසුන් ද 11.2% (569) ක් ඉස්ලාම් ආගමික සිසුන් ද 7.7% (391) ක් හින්දු ආගමික සිසුන් ද ක්‍රිස්ත්‍රියානි ආගමික සිසුන් 3.1% (159) ක් හා රෝමානු කතෝලික ආගමික සිසුන් 4.6% (231) ද වශයෙන් නියැදිය තුළ නියෝජනය විය.

වගුව 03 - **සමීක්ෂණයට ලක්කළ සිසුන්ගේ ප්‍රජා විද්‍යාත්මක තොරතුරු**


| | | සිසුන් ගණන | ප්‍රතිශතය |
|---|---|---|---|
| **ස්ත්‍රී පුරුෂ භාවය** | පුරුෂ | 3166 | 62% |
| | ස්ත්‍රී | 1909 | 38% |
| | **එකතුව** | **5075** | **100%** |
| **ජනවර්ගය** | සිංහල | 4022 | 79.2% |
| | දෙමළ | 467 | 9.0% |
| | මුස්ලිම් | 546 | 11.0% |
| | බර්ගර් | 15 | 0.3% |
| | මැලේ | 22 | 0.4% |
| | වෙනත් | 3 | 0.1% |
| | එකතුව | **5075** | **100%** |

| | | | |
|---|---|---|---|
| ආගම | බෞද්ධ | 3724 | 73.3% |
| | හින්දු | 391 | 7.7% |
| | ඉස්ලාම් | 569 | 11.2% |
| | ක්‍රිස්තියානි | 159 | 3.1% |
| | රෝ.කතෝලික | 231 | 4.6% |
| | වෙනත් | 1 | 0.02% |
| | එකතුව | **5075** | **100.0%** |

**මූලාශ්‍රයः සමීක්ෂණ දත්ත 2016/17**

සිසුන්ගේ වයස් ව්‍යාප්තිය සලකන විටදී වයස අවුරුදු 10 - 19 ත් අතර සිසුන් පමණක් නියැදිය තුළ නියෝජනය වූ අතර වයස සඳහා ප්‍රතිචාර නොදක්වා ඇති සිසුන් ප්‍රතිශතය 1% (75) ක් විය. ප්‍රතිචාර දක්වන ලද සිසුන් 99% (5000) ක් වන අතර ඉන් වයස අවුරුදු 13 හෝ 13 ට අඩු සිසුන් 11% (545) ක් ද අවුරුදු 14 - 15 අතර සිසුන් 52% (2626) ක් ද සිසුන්ගෙන් 29% (1449) ක් වයස අවුරුදු 16 - 17 අතරද 7% (380) ක් වයස අවුරුදු 18 - 19 ත් අතර ද විය. ඒ අනුව සමීක්ෂණයට ඇතුළත් වූ සිසුන්ගේ බහුතරය වයස අවුරුදු 14 - 16 ත් අතර විය. තවද සමීක්ෂණය සඳහා සහභාගි වූ සිසුවෙකුගේ සාමාන්‍ය වයස් අගය අවුරුදු 15 ක් බව සමීක්ෂණ තොරතුරු තුළින් අනාවරණය විය.

**ප්‍රස්තාර 02- සිසුන්ගේ වයස් සංයුතිය**





**මූලාශ්‍රයः සමීක්ෂණ දත්ත 2016/17**

### 2.1.1 විවේක කාලය ගත කරන ආකාරය/විනෝදාංශ

අධ්‍යයන නියැදිය තුළ නියෝජනය වූ සිසුන්ගෙන් 99% (5036) ක් කිසියම් විනෝදාංශයක නිරතවී ඇති අතර 1% (39) ක් කිසිදු විනෝදාංශයක යෙදී නොමැත. තවද සිසුන්ගේ විනෝදාංශ පිළිබඳ අධ්‍යයනය කළ විටදී ඔවුන් බහුවිධ විනෝදාංශ වල නිරතවී ඇති බව අනාවරණය විය.

**ප්‍රස්තාරය 03- සිසුන්ගේ විනෝදාංශ**




**මුලාශ්‍රයඃ සමීක්ෂණ දත්ත 2016/17**

විවේක කාලයේදී කිසියම් විනෝදාංශයක යෙදුනු සිසුන් සැලකු විටදී ඔවුන්ගෙන් 59%(2985) ක් සිය විනෝදාංශය ලෙස ක්‍රීඩා කටයුතුවල යෙදී ඇති බවත් සිසුන් 36% (1801) ක් රූපවාහිනි නැරඹීමත්, 33% (1656) පොත්පත් කියවීමත් තම විනෝදාංශය කරගෙන ඇති බව අනාවරණය විය. මිතුරන් ඇසුරු කිරීම හා චිත්‍රපට නැරඹීම සිය විනෝදාංශ කරගත් සිසුන් පිළිවෙළින් 23% (1169) ක් හා 20% (1010) ක් වූ අතර සිසුන් ගායනය/ වාදනය හෝ නර්තනය වැනි විනෝදාංශ කෙරෙහි ද යොමු වී ඇති අතර ඒ සඳහා යොමු වූ පිරිස 20% ක ට වඩා අඩු අගයක් ගෙන ඇති බව අනාවරණය විය.

### 2.1.2 සිසුන්ගේ පවුල් පසුබිම

සමීක්ෂණය තුළ නියැදියට ඇතුළත් වූ සිසුන්ගෙන් (5075) 92.3% (4682) ක් සිය දෙමාපියන් සමඟ තම නිවසේ ජීවත් වන අතර සිසුන් 3.3% (169) ක් තම ආච්චි/සීයා සමඟ ද 1.4%(70) ක් වෙනත් ඥාතියෙකුගේ නිවසේ ද, සිසුන් 3% (148) ක් කුඩම්මා හෝ සුළු පියාගේ නිවස/ බෝඩිමක/ පාසැල් නේවාසිකාගාරයක හෝ යහලුවෙකුගේ නිවසක ජීවත් වන බව අනාවරණය විය. මේ අනුව සිසුන්ගෙන් 7.2% (393) ක් දෙමාපියන් නොවන වෙනත් පිරිස් සමඟ ද ජීවත් වන බව මෙහිදී හෙළි විය.

### 2.1.3 දහම් පාසැල් අධ්‍යාපනය

සමීක්ෂණය තුළ නියෝජනය වූ පාසල් සිසුන්ගේ දහම් පාසැල් අධ්‍යාපනය පිළිබඳ විමර්ශනය කරන ලද අතර සමීක්ෂණයට ඇතුළත් සමස්ත සිසුන්ගෙන් සිසුන් 67% (3423) ක් දහම් පාසැල් අධ්‍යාපනය ලබන අතර සිසුන් 1652 (33%) ක් දහම් අධ්‍යාපනය නොලබන බව සමීක්ෂණය තුළින් අනාවරණය විය. පාසල් සිසුන් දහම් පාසැල් අධ්‍යාපනය ලැබීම සහ දහම් අධ්‍යාපනය නොලැබීම සම්බන්ධ හේතු සමීක්ෂණයේ දී තවදුරටත් විමසා බලන ලද අතර එයට හේතු ලෙස සිසුන් ඉදිරිපත් කරන ලද අදහස් පහත පරිදි විය.

වගුව 04 - පාසල් සිසුන්ගේ දහම් පාසැල් අධ්‍යාපනය පිළිබඳ තත්ත්වය

| දහම් පාසල් අධ්‍යාපනය ලැබීමට හේතු | දහම් පාසල් අධ්‍යාපනය නොලැබීමට බලපා ඇති හේතු |
|---|---|
| ➢ ගුණ දහම්/ හොඳ පුරුදු ඉගෙන ගැනීමට | ➢ දහම් අධ්‍යාපනය ලැබීමට ඇති අකැමැත්ත, |
| ➢ දහම් අවබෝධය ලබාගැනීමට, | ➢ පාසැල් අධ්‍යාපනය නිසා අවිවේකී වීම, |
| ➢ ගුණ ගරුක දරුවකු වීමට, | ➢ උපකාරක පංතිවලට සහභාගී වීම |
| ➢ හොඳ නරක ඉගෙන ගැනීමට, | ➢ අ.පො.ස. (සා/පෙළ,(උ/පෙළ) විභාග සඳහා සූදානම් වීම, |
| ➢ දහම් අධ්‍යාපනය ලැබීමට තිබෙන කැමැත්ත නිසා, | ➢ තමා ජීවත්වන ප්‍රදේශයේ ආසන්න ආගමික ස්ථානයක් නොමැති වීම, |
| ➢ ධර්මය පිළිබඳ අවබෝධය වැඩි දියුණු කරගැනීමට, | ➢ අවශ්‍ය පොත්පත්, ඇඳුම් මිලදී ගැනීමට මුදල් නොමැති වීම, |
| ➢ ධර්මාචාර්ය විභාගයට වැදගත් වන නිසා, | ➢ දහම් අධ්‍යාපනය ලබාදීම සඳහා ආගමික ස්ථානයේ ගුරුවරුන් නොමැති වීම, |
| ➢ පාසල් අධ්‍යාපනයට වැදගත් වන නිසා, | ➢ පදිංචි ස්ථානය මාරු වීම, |
| ➢ දහම් අවබෝධය ජීවිතයට අවශ්‍ය නිසා | ➢ උසස් පෙළට නියමිතව දහම් පාසල් නොපැවැත්වීම, |
| ➢ මනස දියුණු කරගැනීම සඳහා | ➢ උදාසීන බව |
| ➢ ජීවිතය සාර්ථක කරගැනීමට | |
| ➢ ආගමික භක්තිය නිසා | |

**මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත 2016/17**

දහම් පාසැල් අධ්‍යාපනය ලබන සිසුන් තුළ දහම් අධ්‍යාපනය ලැබීම සම්බන්ධයෙන් ධනාත්මක සිතුවිලි පවතින බව ඉහත ප්‍රකාශ තුළින් පැහැදිලි වේ.

දහම් පාසල් අධ්‍යාපනය නොලබන්නේ යැයි ප්‍රකාශ කළ බහුතරයක් සිසුන්ගෙන් දහම් පාසල් අධ්‍යාපනය නොලැබීමට හේතු ලෙස "පාසැල් අධ්‍යාපනය නිසා අවිවේකී වීම" , "උපකාරක පංතිවලට සහභාගී වීම", "විභාග සඳහා සූදානම් වීම (අ.පො.ස. සා/පෙළ , අ.පො.ස. උ/පෙළ)" වැනි කරුණු අධ්‍යයනය තුළින් අනාවරණය විය. පවතින තරගකාරී පාසල් අධ්‍යාපන ක්‍රමය සමඟ බාහිර ක්‍රියාකාරකම් කෙරෙහි සිසුන්ගේ උනන්දුව අඩුවීම හමුවේ දහම් අධ්‍යාපනය ලැබීමට සිසුන් යොමු වීමේ අඩු ප්‍රවණතාවක් දක්නට ඇත.

සමාජ විරෝධී සහ නීති විරෝධී චර්යාවන්ට යොමුනොවී යහපත් සමාජ ජීවිතයක් ගත කිරීමට පුද්ගලයා තුළ අධ්‍යාත්මික නැඹුරුව ඇති කරගැනීම ඉතා වැදගත් අතර එමෙන්ම පුද්ගලයා මත්ද්‍රව්‍ය

භාවිතයට යොමුනොවී සිටීමට දහම් පාසැල් අධ්‍යාපනය වැදගත් වන බව බොහෝ විද්වතුන්ගේ අදහසයි.

## 2.2 පාසල් සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිත තත්ත්වය පිළිබද අනාවරණයන්


අධ්‍යයනයට භාජනය කළ පාසල් සිසුන් 5,075 ක් අතර **කෙදිනෙක හෝ කිසියම් මත්ද්‍රව්‍යයක්** අත්හදා බලා තිබේ ද යන්නත් **දැනට** සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයේ ස්වරූපය කෙබඳුද යන්නත් පිළිබඳව මෙහිදී විමර්ශනය කරන ලදී.

සමීක්ෂණය තුළ නියැදියට සසම්භාවී ලෙස තේරී පත්වූ මුළු සිසුන්ගෙන් 16% (787) ක් කිසියම් දිනක කුමන හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කර තිබුණු අතර සිසුන්ගෙන් බහුතරයක් එනම් 84% (4288) ක් කිසිදු දිනක කුමන හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කර නොතිබුණ බව අධ්‍යයනය තුළින් අනාවරණය විය. මෙයින් පැහැදිලි වන්නේ බහුතරයක් සිසුන් මත්ද්‍රව්‍ය සඳහා යොමු වී නොමැති බවයි.

### 2.2.1 සිසුන් මත්ද්‍රව්‍ය භාවිත කිරීමේ සංයුතිය

එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කර තිබූ (787) සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධ වර්තමාන තත්ත්වය සළකා බලන විටදී, එක් දිනක් පමණක් මත්ද්‍රව්‍ය භාවිතය අත්හදා බැලූ සිසුන් 47% (371) ක් ද, දින කිහිපයක් පමණක් මත්ද්‍රව්‍ය භාවිත කළ සිසුන් 27% (210) ක් ද, අවස්ථානුකූලව මත්ද්‍රව්‍ය භාවිත කළ සිසුන් 20% (159) ක් ද, නිතරම මත්ද්‍රව්‍ය භාවිත කළ සිසුන් 6% (47) ක් ද අනාවරණය විය. ඒ අනුව එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කළ සිසුන්ගෙන් බහුතරය මත්ද්‍රව්‍ය අත්හදා බැලීම පමණක් සිදුකර ඇති අතර සෙසු පිරිස වර්තමානයේ දී (දැනට) මත්ද්‍රව්‍ය භාවිත කරන සිසුන් බව මෙහිදී නිගමනය කළ හැකිය.

**ප්‍රස්තාරය 04 - සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිත ස්වභාවය**




**මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත 2016/17**

තවද සමීක්ෂණයට භාජනය කළ මුළු සිසුන්ට ප්‍රතිශතයක් ලෙස එක් දිනක් පමණක් මත්ද්‍රව්‍ය භාවිත කළ සිසුන් 7% (371) ක් වූ බවත් එය 6.3% - 7.7% ත් අතර ප්‍රාන්තරයේ පවතින බවත් ප්‍රකාශ කළ හැකිය. තවද දින කිහිපයක් පමණක් මත්ද්‍රව්‍ය භාවිත කළ සිසුන් 4%ක් වූ අතර එය 3.46% - 4.54% ත් අතර පරාසයේ පවතී. ඉඳහිට මත්ද්‍රව්‍ය භාවිත කළ සිසුන් 3% ක් සමීක්ෂණය තුළ අනාවරණය වූ අතර එය 2.53% - 3.47% ත් අතර පරාසයක පවතී. සමීක්ෂණය තුළ කිසියම් හෝ මත්ද්‍රව්‍යක් නිතරම භාවිත කරන සිසුන් 1% ක් වූ අතර එය 0.73% - 1.27% ත් අතර පරාසයේ පවතින බවත් අනාවරණය විය.

සමස්තයක් ලෙස ගත් විට දැනට කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන සිසුන් 4% ක් වූ අතර එය 3.46% - 4.54% ත් අතර පරාසයේ පවතියි. දැනට මත්ද්‍රව්‍ය භාවිත නොකරන කිසියම් හෝ මත්ද්‍රව්‍යක් අත්හදා බැලීම පමණක් කළ සිසුන් 11.4% ක් බව සමීක්ෂණය තුළින් අනාවරණය විය. තවද එය 10.53% - 12.27% ත් අතර පරාසයේ පවතින බව ප්‍රකාශ කළ හැකිය.

### 2.2.2 සිසුන්ගේ බහුවිධ මත්ද්‍රව්‍ය භාවිතයෙහි සංයුතිය

සිසුන් භාවිත කළ බහුවිධ මත්ද්‍රව්‍ය වර්ග සැලකූ විටදී සමීක්ෂණයට භාජනය කළ මුළු සිසුන්ට ප්‍රතිශතයක් ලෙස එක් දිනක් හෝ සිගරැට් භාවිත කර ඇති සිසුන් 5.52% (280) ක් වූ අතර එය 4.89% - 6.15% ත් අතර පරාසයේ පවතී. මද්‍යසාර භාවිත කළ සිසුන් 5.08%(258) ක් සමීක්ෂණය තුළ අනාවරණය වූ අතර එය 4.48% - 5.69% ත් අතර පරාසයේ පවතී. තවද එක් දිනක් හෝ බියර් භාවිත කර ඇති සිසුන් 2.25% (114) ක් වූ අතර එය 1.84% - 2.65% ත් අතර පරාසයේ පවතී.

**වගුව 05 - එක් දිනක් හෝ භාවිත කළ බහුවිධ මත්ද්‍රව්‍ය වර්ග සම්බන්ධ ඇස්තමේන්තුගත ප්‍රතිශතයන්**

| මත්ද්‍රව්‍ය වර්ගය | එක් දිනක් හෝ භාවිත ඇස්තමේන්තුගත ප්‍රතිශතය % | පහළ ඇස්තමේන්තුගත ප්‍රතිශතය % (95% CI) | ඉහළ ඇස්තමේන්තුගත ප්‍රතිශතය % (95% CI) |
|---|---|---|---|
| සිගරැට් | 5.52% | 4.89% | 6.15% |
| මද්‍යසාර | 5.08% | 4.48% | 5.69% |
| දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන | 3.03% | 2.56% | 3.51% |
| බියර් | 2.25% | 1.84% | 2.65% |
| බාබුල් | 0.69% | 0.46% | 0.92% |
| පුවක් වර්ග(මාවා) | 1.00% | 0.73% | 1.28% |
| මදනමෝදක | 0.12% | 0.02% | 0.21% |
| ගංජා | 0.51% | 0.32% | 0.71% |
| කොරෙක්ස් ඩී | 0.02% | 0.00% | 0.06% |
| පෙතිවර්ග | 0.16% | 0.05% | 0.27% |
| හෙරොයින් | 0.04% | 0.00% | 0.09% |
| වෙනත් | 0.67% | 0.45% | 0.89% |

**මූලාශ්‍රයඃ සමීක්ෂණ දත්ත 2016/17**

සිගරැට්, බියර් හා මද්‍යසාර හැරුණු විට දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන හා විවිධ පුවක් වර්ග භාවිත කිරීමේ ප්‍රවණතාවක් දැකිය හැකිය. එක් දිනක් හෝ දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන භාවිත කර ඇති සිසුන් 3.03% (154) ක් සමීක්ෂණය තුළින් අනාවරණය වූ අතර එය 2.56% ත් 3.51% ත් අතර පරාසයක

පවතී. එක් දිනක් හෝ පුවක් වර්ග භාවිත කර ඇති සිසුන් 1% (51) ක් සිටි අතර එය 0.73% ත් 1.28% ත් අතර ප්‍රාන්තරයේ පවතින බව අනාවරණය විය. තවද සිසුන් අතර බාබුල්, මදනමෝදක හා කොරෙක්ස් ඩී (පැණි වර්ග) ද එක් දිනක් හෝ භාවිත කර ඇති සිසුන් ද සමීක්ෂණය තුළ අනාවරණය වූ අතර එම එක් එක් මත්ද්‍රව්‍ය වර්ග සඳහා ප්‍රතිශත අගයන් පිළිවෙලින් 0.69% ක් , 0.12% ක් හා 0.02% ක් විය.

සිසුන් අතර අන්තරායකර ඖෂධ ලෙස ගැනෙන ගංජා හා මනෝවර්ථක ගණයේ ඖෂධ වලද කිසියම් ව්‍යාප්තියක් පෙන්නුම් කළ අතර සමීක්ෂණයට භාජනය කළ මුළු සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 0.51% (26) ක් එක් දිනක් හෝ ගංජා භාවිත කර ඇති අතර එය 0.32% ත් 0.71% ත් අතර පරාසයේ පිහිටන අතර 0.04% (02) ක් එක් දිනක් හෝ හෙරොයින් භාවිත කර ඇති අතර එය 0.09% ක් දක්වා උපරිම විය හැකිය. එක් දිනක් මනෝවර්තක ගණයේ ඖෂධ (පෙතිවර්ග) අනිසි ලෙස භාවිත කර ඇති සිසුන් 0.16% (8) ක් අනාවරණය වූ අතර එය 0.05% - 0.27% ත් අතර පරාසයේ පැවතිණි.

සිසුන් එක් දිනක් හෝ භාවිත කර ඇති එක් එක් මත්ද්‍රව්‍ය පිළිබඳව සිදුකරන ලද විශ්ලේෂණයේ දී සිසුන් අතර මත්ද්‍රව්‍ය භාවිතයේ ඉහළම ප්‍රචලිත අගය සිගරැට් වන අතර ඊට අමතරව මද්‍යසාර, බියර් හා දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන (දුම්කුඩු) සම්බන්ධව ද ප්‍රවණතාවයක් පවතින බව අනාවරණය විය.

සිසුන් අතර බාබුල්, ගංජා හා විවිධ පුවක් වර්ග භාවිතයේ ද යම් ප්‍රවණතාවක් පවතින නමුත් එය සිගරැට්, මද්‍යසාර හා බියර් භාවිතයේ ප්‍රවණතාවට වඩා සාපේක්ෂව අඩු ප්‍රවණතාවක් පෙන්වා ඇත. මදනමෝදක හා මනෝවර්තක ගණයේ ඖෂධ (පෙතිවර්ග) සම්බන්ධව ද ඉතා සුළු ප්‍රවණතාවක් පවතින බවත් අනාවරණය විය.


**වගුව 06 - දැනට භාවිත කරන බහුවිධ මත්ද්‍රව්‍ය වර්ග සම්බන්ධ ඇස්තමේන්තුගත ප්‍රතිශතයන්**

| මත්ද්‍රව්‍ය වර්ගය | දැනට භාවිත කරන ඇස්තමේන්තුගත ප්‍රතිශතය % | පහළ ඇස්තමේන්තුගත ප්‍රතිශතය% (95%C.I) | ඉහළ ඇස්තමේන්තුගත ප්‍රතිශතය % (95%C.I) |
|---|---|---|---|
| සිගරැට් | 2.09% | 1.70% | 2.48% |
| මද්‍යසාර | 1.62% | 1.27% | 1.96% |
| බියර් | 0.79% | 0.54% | 1.03% |
| දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන | 1.02% | 0.75% | 1.30% |
| බාබුල් | 0.14% | 0.04% | 0.24% |
| මදනමෝදක | 0.08% | 0.00% | 0.16% |
| පුවක් වර්ග | 0.45% | 0.27% | 0.64% |
| ගංජා | 0.30% | 0.15% | 0.44% |
| පෙතිවර්ග | 0.06% | 0.00% | 0.13% |
| වෙනත් | 0.18% | 0.06% | 0.29% |

**මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත 2016/17**

සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධ වර්තමාන තත්ත්වය සලකන විටදී සමීක්ෂණයට භාජනය කළ මුළු සිසුන්ට ප්‍රතිශතයක් ලෙස දැනට සිගරැට් භාවිත කරන සිසුන් 2.1% (106) ක් වාර්තා වී ඇති අතර එය 1.7% - 2.5% ත් අතර පරාසයේ පවතී. දැනට මද්‍යසාර භාවිත කරන සිසුන් 1.6% (82) ක් සමීක්ෂණය තුළ අනාවරණය වූ අතර එය 1.3% - 2.0% ත් අතර ප්‍රාන්තරයේ පැවති බවත් දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන සම්බන්ධව එම අගය 1.03% (52) ක් වූ අතර එය 0.75% - 1.3% ත් අතර ප්‍රාන්තරයේ පවතින බව අනාවරණය විය. ඒ අනුව දැනට භාවිත කරන මත්ද්‍රව්‍ය අතර ඉහළම ප්‍රතිශත අගය සිගරැට් සම්බන්ධයෙන් ද ඊට අමතරව මද්‍යසාර හා දුම්කොළ ආශ්‍රිතව පවතින බව ද අනාවරණය විය. සිසුන් තුළ දැනට භාවිතයේ පවතින අඩු ප්‍රචලිත බවක් පෙන්වන අනෙකුත් මත්ද්‍රව්‍ය අතර බියර් (0.78%) හා පුවක් වර්ග (මාවා) (0.45%) ද දැක්විය හැකිය. බාබුල් (014%) හා මදනමෝදක (0.08%) සම්බන්ධයෙන් ද සිසුන් අතර ඉතා සුළු ප්‍රචලිත බවක් ඇති බව හඳුනාගත හැකි අතර එය දැනට භාවිතයේ ඇති එක් එක් මත්ද්‍රව්‍ය අතර අඩුම ප්‍රචලිත බව පෙන්නුම් කරනු ලැබේ.

**ප්‍රස්තාරය 05 - සිසුන් භාවිත කරන බහුවිධ මත්ද්‍රව්‍ය වර්ග සහ සංයුතිය**





**මූලාශ්‍රයඃ සමීක්ෂණ දත්ත 2016/17**

සමීක්ෂණයට භාජනය කළ මුළු සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 0.3% (15) ක් ගංජා භාවිත කරන ලද අතර එය 0.15% - 0.45% ත් අතර ප්‍රාන්තරයේ පවතින බවත් සංඛ්‍යානමය වශයෙන් තහවුරු කර ගන්නා ගන්නා ලදී. ගංජා වලට අමතරව සිසුන් අතර මනෝවර්තක ගණයේ ඖෂධ (පෙතිවර්ග) භාවිතයේ ද ඉතා සුළු ප්‍රවණතාවක් ඇතිබව අනාවරණය විය. එය සමීක්ෂණයට භාජනය කළ මුළු සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 0.06%(3) ක් විය.

### 2.2.3 සිසුන් මත්ද්‍රව්‍ය අත්හදා බැලීමට පෙළඹුණු සාධක හා ස්ථාන

පාසල් සිසුන් මත්ද්‍රව්‍ය භාවිත කිරීමට පෙළඹී ඇත්තේ කුමන අවස්ථා වලදී ද යන්න සමීක්ෂණය තුළින් විමසා බලන ලද අතර එය පහත පරිදි වේ. එක් දිනක් හෝ මත්ද්‍රව්‍ය භාවිත කළ සිසුන්ට (787) ප්‍රතිශතයක් ලෙස බහුතරයක්, එනම් 45% (353) ක් විවාහ උත්සව, අවමඟුල් උත්සව වැනි උත්සව අවස්ථා වලදී මත්ද්‍රව්‍ය අත්හදා බලා තිබුණි. 33% (262) ක් විනෝද චාරිකා අවස්ථා වලදී ද 21% (168) ක් ගමේදී යහළුවන් සමඟ මත්ද්‍රව්‍ය භාවිත කර තිබුණි. 19% (146) ක් පාසැලේ විවිධ අවස්ථාවලදී ද 5% (41) ක් දුම්රිය හෝ බස් නැවතුම්පළේදී ද 10% (79) ක් වෙනත් විවිධ මත්ද්‍රව්‍ය ද අත්හදා තිබුණ බව අනාවරණය විය.

**ප්‍රස්තාරය 06 - සිසුන් මත්ද්‍රව්‍ය අත්හදා බැලීමට යොමුවී ඇති අවස්ථා**




**මූලාශ්‍රයː සමීක්ෂණ දත්ත 2016/17**

එක් දිනක් හෝ යම් මත්ද්‍රව්‍යයක් භාවිත කළ සිසුන්ගෙන් බහුතරයක් විවාහ උත්සව, අවමඟුල් උත්සව වැනි අවස්ථාවන්හි දී කුමන හෝ මත්ද්‍රව්‍යයක් අත්හදා බලා තිබුණි. එවැනි අවස්ථාවන්හි දී මත්ද්‍රව්‍යයක් අත්හදා බැලූ සිසුන්ගෙන් 31% (117) ක් සිගරට් භාවිත කර තිබුණු අතර මද්‍යසාර 31% (110) සහ බියර් 25% (89) භාවිත කර තිබූ බවට තොරතුරු අනාවරණය විය.

තවද විනෝද චාරිකා අවස්ථා වලදී මත්ද්‍රව්‍ය අත්හදා බලන ලද සිසුන්ගෙන් ද ඉහළම ප්‍රතිශතයක් එනම් 47% (124) ක් සිගරට් **ද,** 24% (65) දෙනෙක් මද්‍යසාර අත්හදා ඇති අතර පාසැලේ විවිධ අවස්ථාවලදී දී මත්ද්‍රව්‍ය අත්හදා බලන ලද සිසුන්ගෙන් ඉහළම ප්‍රතිශතය, එනම් 54% (79) ක් සිගරට් සඳහා ද 30% (44) ක් මධ්‍යසාර සඳහා ද විය.

මේ අනුව විවිධ උත්සව අවස්ථා, විනෝද චාරිකා හා පාසැලේ විවිධ අවස්ථාවලදී ද ප්‍රධාන වශයෙන් සිසුන් මත්ද්‍රව්‍ය අත්හදා බැලීමට යොමුවී තිබුණ බවත් එහිදී ඔවුන් වැඩිම වශයෙන් සිගරට් සඳහා පෙළඹී තිබුණ අතර ඊට අමතරව මද්‍යසාර, බියර් හා දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන ද අත්හදා බලා තිබුණ බව අනාවරණය විය.

## 2.3 දිස්ත්‍රික්ක අනුව සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය

එක් එක් දිස්ත්‍රික්ක අනුව සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය, භාවිත කරන මත්ද්‍රව්‍ය වර්ගයන් හා එහි ව්‍යාප්තිය පහත වගුව මඟින් නිරූපණය කරයි. තවද එමඟින් සිසුන් විසින් දැනට (ඉඳහිට හෝ නිතරම) භාවිත මත්ද්‍රව්‍ය වර්ග, එක් එක් දිස්ත්‍රික්කය තුළ සමීක්ෂණයට සහභාගි කරගත් මුළු සිසුන්ට ප්‍රතිශතයක් ලෙස දක්වා ඇති අතර 95% විශ්‍රම්භ මට්ටමක් (Confidence Intervel) යටතේ එම ප්‍රතිශතයන්හි ඉහළ හා පහළ අගයන් ද දක්වා ඇත.

වගුව 07 - සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය හා භූගෝලීය ව්‍යාප්තිය

| | | සිගරට් | මද්‍යසාර | බියර් | දුම්කුඩු | බාබුල් | මෝදක | පුවක් | ගංජා | පෙති | වෙනත් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | තනි | 3.16% | 1.58% | 0.24% | 0.49% | 0.24% | - | 0.61% | 0.37% | 0.24% | - |
| | පහළ | 1.97% | 0.73% | 0.00% | 0.01% | 0.00% | - | 0.08% | 0.00% | 0.00% | - |
| කොළඹ | ඉහළ | 4.36% | 2.43% | 0.58% | 0.96% | 0.58% | - | 1.14% | 0.78% | 0.58% | - |
| | තනි | 1.54% | 1.84% | 1.08% | 0.61% | 0.31% | - | 0.77% | 0.15% | - | - |
| | පහළ | 0.59% | 0.81% | 0.28% | 0.01% | 0.00% | - | 0.10% | 0.00% | - | - |
| ගම්පහ | ඉහළ | 2.48% | 2.88% | 1.87% | 1.22% | 0.73% | - | 1.44% | 0.45% | - | - |
| | තනි | 1.27% | 0.76% | 0.76% | 1.52% | - | - | 0.51% | - | - | - |
| | පහළ | 0.16% | 0.00% | 0.00% | 0.31% | - | - | 0.00% | - | - | - |
| කළුතර | ඉහළ | 2.37% | 1.62% | 1.62% | 2.73% | - | - | 1.21% | - | - | - |
| | තනි | 1.25% | 0.50% | - | - | - | - | - | - | - | 0.25% |
| | පහළ | 0.16% | 0.00% | - | - | - | - | - | - | - | 0.00% |
| ගාල්ල | ඉහළ | 2.33% | 1.19% | - | - | - | - | - | - | - | 0.74% |
| | තනි | 2.71% | 1.94% | - | 1.94% | - | - | - | - | - | - |
| | පහළ | 0.73% | 0.26% | - | 0.26% | - | - | - | - | - | - |
| හම්බන්තොට | ඉහළ | 4.70% | 3.62% | - | 3.62% | - | - | - | - | - | - |
| | තනි | 0.78% | 1.09% | 0.78% | 1.24% | 0.16% | - | 0.31% | - | - | 0.16% |
| | පහළ | 0.10% | 0.29% | 0.10% | 0.39% | 0.00% | - | 0.00% | - | - | 0.00% |
| කුරුණෑගල | ඉහළ | 1.45% | 1.89% | 1.45% | 2.09% | 0.46% | - | 0.74% | - | - | 0.46% |
| | තනි | 1.94% | 3.24% | 2.91% | 0.65% | 0.32% | 0.97% | 1.29% | 1.29% | - | 0.65% |
| | පහළ | 0.40% | 1.26% | 1.04% | 0.00% | 0.00% | 0.00% | 0.03% | 0.03% | - | 0.00% |
| පුත්තලම | ඉහළ | 3.48% | 5.21% | 4.79% | 1.54% | 0.96% | 2.06% | 2.56% | 2.56% | - | 1.54% |
| | තනි | 2.66% | 2.66% | 1.33% | 1.52% | 0.19% | - | 0.95% | 0.76% | 0.19% | 0.19% |
| | පහළ | 1.28% | 1.28% | 0.35% | 0.47% | 0.00% | - | 0.12% | 0.02% | 0.00% | 0.00% |
| මහනුවර | ඉහළ | 4.03% | 4.03% | 2.31% | 2.56% | 0.56% | - | 1.78% | 1.50% | 0.56% | 0.56% |
| | තනි | 3.17% | 3.80% | 3.80% | 2.53% | - | - | - | 1.27% | - | 0.63% |
| | පහළ | 0.44% | 0.82% | 0.82% | 0.08% | - | - | - | 0.00% | - | 0.00% |
| මොනරාගල | ඉහළ | 5.89% | 6.78% | 6.78% | 4.98% | - | - | - | 3.01% | - | 1.87% |
| | තනි | 0.24% | 0.24% | 0.24% | 1.95% | - | 0.24% | - | 0.00% | - | - |
| | පහළ | 0.00% | 0.00% | 0.00% | 0.61% | - | 0.00% | - | 0.00% | - | - |
| රත්නපුර | ඉහළ | 0.72% | 0.72% | 0.72% | 3.29% | - | 0.72% | - | 0.00% | - | - |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | තනි | 5.98% | 2.39% | - | 1.20% | - | - | - | - | - | 1.20% |
| | පහළ | 3.04% | 0.50% | - | 0.00% | - | - | - | - | - | 0.00% |
| අනුරාධපුර | ඉහළ | 8.91% | 4.28% | - | 2.54% | - | - | - | - | - | 2.54% |
| | තනි | 2.81% | 1.21% | - | - | - | - | - | 0.40% | - | - |
| | පහළ | 0.76% | 0.00% | - | - | - | - | - | 0.00% | - | - |
| යාපනය | ඉහළ | 4.86% | 2.56% | - | - | - | - | - | 1.19% | - | - |

**මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත 2016/17**

### 2.3.1 අනුරාධපුර දිස්ත්‍රික්කය

ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය භාවිතයේ ඉහළ ප්‍රචලිත බවක් ඇති දිස්ත්‍රික්ක තෝරාගෙන මෙම සමීක්ෂණය සිදුකරනු ලැබිණ. අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට (251) ප්‍රතිශතයක් ලෙස එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කළ සිසුන් 24% (61) වාර්තා වූ අතර එය 19% - 30% ත් අතර පරාසයේ පවතින බවට තහවුරු වී ඇත.

අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ එක් දිනක් හෝ භාවිත කළ මත්ද්‍රව්‍ය අතර ඉහළම ප්‍රචලිත බව සිගරට් සම්බන්ධව පැවති අතර එය සමීක්ෂණයට භාජනය කළ මුළු සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 18.3% (46) ක් විය. මද්‍යසාර සඳහා එම අගය 6.4% (16) ක් ද දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන (දුම්කුඩු/ දුම්කොළ) 4.8% (12) ක් ද අනාවරණය විය. තවද බාබුල් භාවිතයේ කිසියම් ප්‍රවණතාවක් පවතින අතර එම අගය සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 0.8% (2) ක් විය. තවද ගංජා භාවිතයේ ද යම් ප්‍රවණතාවක් ද පවතින බවට කරුණු හෙළිවිය. ගංජා සඳහා එම අගය 0.4% (1) ක් වන අතර එය උපරිම වශයෙන් 1.17% දක්වා වෙනස්විය හැකි බවද ප්‍රකාශ කළ හැකිය.

**වගුව 08 - අනුරාධපුර දිස්ත්‍රික්කයේ සිසුන් අතර ප්‍රචලිත මත්ද්‍රව්‍ය වර්ග සහ සංයුතිය**

| මත්ද්‍රව්‍ය වර්ගය | එක් දිනක් හෝ භාවිත කළ | දැනට භාවිත කරන |
|---|---|---|
| සිගරට් | 18.3% | 5.98% |
| මද්‍යසාර | 6.4% | 2.39% |
| බියර් | 0.4% | - |
| දුම්කුඩු | 4.8% | 1.20% |
| බාබුල් | 0.8% | - |
| මෝදක | 0.0% | - |
| පුවක් | 0.0% | - |
| ගංජා | 0.4% | - |
| පෙති | 0.0% | - |
| වෙනත් | 2.4% | 1.20% |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත 2016/17

අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ සමීක්ෂණයට ලක් කළ මුළු සිසුන්ට ප්‍රතිශතයක් ලෙස දැනට කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කරන සිසුන් 7.2% (18) ක් සිටින අතර එය 4.0% - 10.4% ත් අතර පරාසයේ පවතින බවට ප්‍රකාශ කළ හැකිය.

සිසුන් විසින් දැනට භාවිත කරන බහුවිධ මත්ද්‍රව්‍ය පිළිබඳව සැලකූ විටදී මෙම දිස්ත්‍රික්කය තුළ සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට (251) ප්‍රතිශතයක් ලෙස 6% (15) ක් දැනට සිගරැට් භාවිතා කරන අතර එය 3% - 8.9% ත් අතර ප්‍රාන්තරයේ පවතින අතර මෙම දිස්ත්‍රික්කයේ සිසුන් තුළ දැනට භාවිත කරන මත්ද්‍රව්‍ය අතර සිගරැට් භාවිතයේ ඉහළ ප්‍රවණතාවක් දැකිය හැකිය. සිගරැට් වලට අමතරව මද්‍යසාර 2.3% (6) ක් හා දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන (දුම්කුඩු) 1.19% (3) වලද යම් ප්‍රවණතාවක් දක්නට ඇති බව අධ්‍යයනය තුළින් අනාවරණය විය.

### 2.3.2 මොණරාගල දිස්ත්‍රික්කය

අනුරාධපුර දිස්ත්‍රික්කය හැරුණ විටදී මොණරාගල දිස්ත්‍රික්කය තුළ ද සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයේ ඉහළ ප්‍රචලිත බවක් දක්නට ලැබුණි. මොණරාගල දිස්ත්‍රික්කය තුළ සමීක්ෂණයට භාජනය කළ මුළු සිසුන් (158) ගෙන් එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කළ සිසුන් 19% (30) ක් සිටින බවට අනාවරණය වූ අතර එය 13% - 25% ත් අතර ප්‍රාන්තරයේ පවතින බවට ප්‍රකාශ කළ හැකිය.

මොණරාගල දිස්ත්‍රික්කය තුළ සමීක්ෂණයට භාජනය කළ සිසුන්ගෙන් 9.5% (15) ක් එක් දිනක් හෝ මද්‍යසාර වර්ග භාවිත කර ඇති අතර එම අගය 4.92% - 14.06% ත් අතර පවතී. තවද සිගරැට්, දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන හා බියර් යන එක් එක් මත්ද්‍රව්‍ය වර්ග කෙරෙහි ද ප්‍රවණතාවක් පවතී. එම අගයන් පිළිවෙලින් 8.2% (13), 7.6% (12) හා 8.9% (14) ක් විය. එක් දිනක් හෝ ගංජා භාවිත කළ සිසුන් 1.3% ක් සිටින බව අනාවරණය විය. එම අගය උපරිම වශයෙන් 3.0% ක් දක්වා වෙනස් විය හැකි බවට ප්‍රකාශ කළ හැකි විය.

**වගුව 09 - මොණරාගල දිස්ත්‍රික්කයේ සිසුන් අතර ප්‍රචලිත මත්ද්‍රව්‍ය වර්ග සහ සංයුතිය**

| මත්ද්‍රව්‍ය වර්ගය | එක් දිනක් හෝ භාවිත කළ | දැනට භාවිත කරන |
|---|---|---|
| සිගරැට් | 8.2% | 3.17% |
| මද්‍යසාර | 9.5% | 3.80% |
| බියර් | 8.9% | 3.80% |
| දුම්කුඩු | 7.6% | 2.53% |
| බාබුල් | 0.0% | - |
| මෝදක | 0.6% | - |
| පුවක් | 0.0% | - |
| ගංජා | 1.3% | 1.27% |
| පෙති | 0.0% | - |
| වෙනත් | 0.6% | 0.63% |

මූලාශ්‍රයः **සමීක්ෂණ දත්ත 2016/17**

මොණරාගල දිස්ත්‍රික්කය තුළ සමීක්ෂණයට භාජනය කළ මුළු සිසුන් (158) ට ප්‍රතිශතයක් ලෙස දැනට කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කරන සිසුන් 7.0% (11) ක් වන අතර එය 3.0% - 10.9% ත් අතර ප්‍රාන්තරයේ පිහිටා ඇත. මොණරාගල දිස්ත්‍රික්කය තුළ සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස ඉහළම ප්‍රවණතාව මද්‍යසාර හා බියර් සඳහා පවතින අතර මද්‍යසාර හා බියර් සඳහා එම අගයන් 3.8% බැගින් විය. තවද සිගරැට් හා දුම්කොළ නිෂ්පාදන සම්බන්ධව ද යම් ප්‍රවණතාවක් පවතින අතර මෙම දිස්ත්‍රික්කයේ සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස

දැනට සිගරැට් භාවිත කරන සිසුන් 3.2% (5) ක් ද, දුම්කොළ නිෂ්පාදන (දුම්කුඩු) භාවිත කරන සිසුන් 2.5% (4) ක් ද වශයෙන් අධ්‍යයනය තුළින් අනාවරණය විය.

මොණරාගල දිස්ත්‍රික්කය තුළ සිසුන්ගේ වර්තමාන මත්ද්‍රව්‍ය භාවිතයෙහි ගංජා භාවිතයේ ද යම් ප්‍රවණතාවක් හඳුනා ගත හැකි අතර එය ප්‍රතිශතයක් ලෙස 1.27% (2) ක් බවත් හෙළි විය.

### 2.3.3 පුත්තලම දිස්ත්‍රික්කය

සමීක්ෂණයට භාජනය කළ අනෙකුත් දිස්ත්‍රික්කවලට සාපේක්ෂව පුත්තලම දිස්ත්‍රික්කය තුළ මත්ද්‍රව්‍ය භාවිතයේ තරමක ඉහළ ප්‍රවණතාවක් දක්නට ඇත. පුත්තලම දිස්ත්‍රික්කය තුළ සමීක්ෂණයට භාජනය කළ සිසුන් (309) ගෙන් එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කළ සිසුන් 19.1% (59) ක් අනාවරණය වූ අතර තවද එම අගය 15% - 23% ත් අතර පරාසයේ පවතී. පුත්තලම දිස්ත්‍රික්කයේ සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 5.8% (18) ක් දැනට කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන බවත් එය 3.2% - 8.4% ත් අතර පවතී.

**වගුව 10 - පුත්තලම දිස්ත්‍රික්කයේ සිසුන් අතර ප්‍රචලිත මත්ද්‍රව්‍ය මත්ද්‍රව්‍ය වර්ග සහ සංයුතිය**

| මත්ද්‍රව්‍ය වර්ගය | එක් දිනක් හෝ භාවිත කළ | දැනට භාවිත කරන |
|---|---|---|
| සිගරැට් | 4.5% | 1.94% |
| මද්‍යසාර | 8.7% | 3.24% |
| බියර් | 4.5% | 2.91% |
| දුම්කුඩු | 2.6% | 0.65% |
| බාබුල් | 1.3% | 0.32% |
| මෝදක | 1.0% | 0.97% |
| පුවක් | 1.9% | 1.29% |
| ගංජා | 1.6% | 1.29% |
| පෙති | 0.3% | - |
| වෙනත් | 2.3% | 0.65% |

**මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත 2016/17**

පුත්තලම දිස්ත්‍රික්කය තුළ සිසුන් එක් දිනක් හෝ භාවිත කළ මත්ද්‍රව්‍ය අතරින් ඉහළම ප්‍රචලිත බවක් මද්‍යසාර සම්බන්ධයෙන් පවතින අතර එය 8.7% (27) කි. තවද එම අගය 5.58% - 11.88% ත් අතර පවතින බවට ප්‍රකාශ කළ හැකිය. මද්‍යසාර වලට අමතරව සිගරැට් හා දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන භාවිත කළ සිසුන් පුත්තලම දිස්ත්‍රික්කය තුළින් හමුවූ අතර දිස්ත්‍රික්කයේ සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස පිළිවෙලින් 4.5% (14) ක් හා 2.6% (8) ක් විය. තවද බියර් සඳහා එම අගය 4.5% (14) ක් ද බාබුල් 1.3% (4) ක් ද, පුවක් වර්ග 1.9% (6) ක් ද බව සමීක්ෂණය තුළින් හෙළිවිය. සමීක්ෂණය තුළින් පුත්තලම දිස්ත්‍රික්කයේ එක් දිනක් හෝ ගංජා භාවිත කළ සිසුන් 1.6% (5) ක් අනාවරණය වූ අතර එම ප්‍රතිශත අගය 3.02% දක්වා උපරිම විය හැකි බව සංඛ්‍යානමය වශයෙන් ප්‍රකාශ කළ හැකිය. ඊට අමතරව විවිධ ඖෂධ (පෙති වර්ග) අනිසි ලෙස භාවිත කළ සිසුන් ද 0.3% (1) ක් අනාවරණය වූ අතර එය උපරිම වශයෙන් 0.95% ක් දක්වා වෙනස් විය හැකිය. තවද මදන මෝදක හා වෙනත් මත්ද්‍රව්‍ය එක් දිනක් හෝ භාවිත කළ සිසුන් ඉතා සුළු වශයෙන් පුත්තලම දිස්ත්‍රික්කය තුළින් අනාවරණය විය.

පුත්තලම දිස්ත්‍රික්කයේ සිසුන් අතර දැනට භාවිත කරන මත්ද්‍රව්‍ය අතර ඉහළම ප්‍රචලිත බව මද්‍යසාර බව හෙළිවිය. එය 3.24% (10) ක් විය. මද්‍යසාර හැරුණු විට බියර් හා සිගරැට් සම්බන්ධව ද යම් ප්‍රවණතාවක් පවතින අතර බියර් හා සිගරැට් සඳහා එම අගයන් පිළිවෙලින් 2.9% (9) ක් හා 1.9% (6) ක් විය. තවද දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන, පුවක් වර්ග, බාබුල් හා මදනමෝදක යන මත්ද්‍රව්‍ය ද මෙම දිස්ත්‍රික්කය තුළ ප්‍රචලිතව පවතින අතර එම එක් එක් මත්ද්‍රව්‍ය සඳහා ප්‍රතිශත අගයන් පිළිවෙලින් 0.65% (2), 1.3% (4), 0.3% (1) හා 1% (3) ක් විය. තවද එම දිස්ත්‍රික්කයේ දක්නට ලැබූ සුවිශේෂී තත්ත්වයක් වන්නේ සිසුන් තුළ දැනට ගංජා භාවිතයේ සැලකිය යුතු ප්‍රවණතාවක් පැවතීමයි. සමීක්ෂණයට ලක් කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 1.3% (4) ක් දැනට ගංජා භාවිත කරන බවත්, එය 0.03% - 2.5%ත් අතර පරාසයේ පවතින බවත් ප්‍රකාශ කළ හැකිය.

### 2.3.4 හම්බන්තොට දිස්ත්‍රික්කය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය අනුරාධපුර, මොණරාගල, පුත්තලම යන දිස්ත්‍රික්ක වලට වඩා අඩු ප්‍රචලිත බවක් දක්නට ලැබුණ ද, තෝරාගත් අනෙකුත් දිස්ත්‍රික්කවලට වඩා මත්ද්‍රව්‍ය භාවිතයේ ඉහළ ප්‍රතිශත අගයන් පෙන්වයි.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 10.9% (28) ක් එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කර ඇති බව අනාවරණය විය.

එක් දිනක් හෝ භාවිත කළ එක් එක් මත්ද්‍රව්‍ය වර්ග සැලකූ විටදී ඉහළ ප්‍රචලිත බවක් සිගරැට් සම්බන්ධව දැකිය හැකි අතර එය සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 5.0% (13) ක් වූ අතර එය 2.37% - 7.70% ත් අතර පවතී. හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ එක් දිනක් හෝ භාවිත කළ බහුවිධ මත්ද්‍රව්‍යවල ව්‍යාප්තිය, අනෙකුත් දිස්ත්‍රික්ක වලට සාපේක්ෂව අඩු බවක් දක්නට ඇති අතර ළමුන් අතර මද්‍යසාර, දුම්කොළ ආශ්‍රිත මත්ද්‍රව්‍ය හා බාබුල් සඳහා ප්‍රචලිත බවක් දක්නට ලැබුණි. දිස්ත්‍රික්කයේ සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස එම අගයන් පිළිවෙලින් 2.7% (7) ,2.3% (6) ක් හා 0.4% (1) ක් විය. තවද එක් දිනක් හෝ ගංජා භාවිත කළ සිසුන් 0.4% (1)ක් මෙහිදී අනාවරණය වූ අතර එම අගය උපරිම වශයෙන් 1.14%ක් දක්වා වෙනස් විය හැකි බවද ප්‍රකාශ කළ හැකිය.

වගුව 11 - හම්බන්තොට දිස්ත්‍රික්කයේ සිසුන් අතර ප්‍රචලිත මත්ද්‍රව්‍ය වර්ග **සහ සංයුතිය**

| | එක් දිනක් හෝ භාවිත කළ | දැනට භාවිත කරන |
|---|---|---|
| සිගරැට් | 5.0% | 2.71% |
| මද්‍යසාර | 2.7% | 1.94% |
| බියර් | 0.0% | - |
| දුම්කුඩු | 2.3% | 1.94% |
| බාබුල් | 0.4% | - |
| මෝදක | 0.0% | - |
| පුවක් | 0.0% | - |
| ගංජා | 0.4% | - |
| පෙති | 0.0% | - |
| වෙනත් | 0.0% | - |

**මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත 2016/17**

හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ සමීක්ෂණයට භාජනය කළ සිසුන් (258) ට ප්‍රතිශතයක් ලෙස 5% (13) ක් කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් දැනට භාවිත කරන අතර එය 2.4% - 7.7% ත් අතර ප්‍රාන්තරයක පවතින බව හෙළිවිය.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස දැනට කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන සිසුන් 5.0% (13) ක් වූ අතර එම අගය 2.4% - 7.7% ත් අතර ප්‍රාන්තරයේ පවතින බවට ප්‍රකාශ කළ හැකිය. මෙම දිස්ත්‍රික්කය තුළ සිසුන්ගේ වර්තමාන මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි අවධානය යොමු කරන විට්දී සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස ඉහළම ප්‍රවණතාව සිගරැට් (2.7% (7) සම්බන්ධව දැකිය හැකි අතර මද්‍යසාර (1.9%) හා දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන (1.9%) සඳහා ද කිසියම් ප්‍රවණතාවයක් හඳුනාගත හැකිය.

### 2.3.5 කොළඹ දිස්ත්‍රික්කය

කොළඹ දිස්ත්‍රික්කය තුළ සමීක්ෂණය සඳහා සිසුන් 822ක් සහභාගී වූ අතර එම සිසුන් අතරින් එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කළ සිසුන් 17.4% (143) ක් වාර්තා වූ අතර එය 15% - 20% ත් අතර පරාසයේ පවතී

කොළඹ දිස්ත්‍රික්කය තුළ එක් දිනක් හෝ භාවිත කළ මත්ද්‍රව්‍ය අතර සිගරැට් සම්බන්ධයෙන් ඉහළම ප්‍රචලිත බවක් අනාවරණය වූ අතර එය කොළඹ දිස්ත්‍රික්කයේ සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 6.7% (55) ක් වූ අතර එය 4.98% - 8.39% ත් අතර පවතී. සිගරැට් හැරුණු විට්දී මද්‍යසාර 4.5% (37) ක් ද , දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන (දුම්කුඩු) 2.7% (22) ක් ද බියර් 1.5% (12) ක් ද සිසුන් භාවිත කළ බවට අනාවරණය විය. තවද සිසුන් බාබුල් (1.3% (11), පුවක් වර්ග (මාවා) (1.7% (14) වැනි මත්ද්‍රව්‍ය භාවිත කර තිබුණි.

වගුව 12 - කොළඹ දිස්ත්‍රික්කයේ සිසුන් අතර ප්‍රචලිත මත්ද්‍රව්‍ය වර්ග **සහ සංයුතිය**

| මත්ද්‍රව්‍ය වර්ගය | එක් දිනක් හෝ භාවිත කළ | දැනට භාවිත කරන |
|---|---|---|
| සිගරැට් | 6.7% | 3.16% |
| මද්‍යසාර | 4.5% | 1.58% |
| බියර් | 1.5% | 0.24% |
| දුම්කුඩු | 2.7% | 0.49% |
| බාබුල් | 1.3% | 0.24% |
| මෝදක | 0.0% | - |
| පුවක් | 1.7% | 0.61% |
| ගංජා | 0.9% | 0.37% |
| පෙති | 0.6% | 0.24% |
| හෙරොයින් | 0.2% | - |
| වෙනත් | 0.4% | - |

**මූලාශ්‍රයඃ සමීක්ෂණ දත්ත 2016/17**

සෙසු දිස්ත්‍රික්කයන් හා සසඳන විට්දී කොළඹ දිස්ත්‍රික්කයේ පාසල් සිසුන් අතර ගංජා, හෙරොයින් හා පෙතිවර්ග කෙරෙහි යොමුවීමේ ප්‍රවනතාවක් දක්නට ලැබුණු අතර එම දිස්ත්‍රික්කයේ සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස එක් දිනක් හෝ ගංජා භාවිත කළ සිසුන් 0.9% (7) ක් ද විවිධ

මනෝවර්තක ගණයේ ඖෂධ (පෙති වර්ග) 0.6% (5) ක් ද හෙරොයින් අත්හදා බැලූ සිසුන් 0.2% (02) ක් ද ලෙස වාර්තා විය. තවද සමීක්ෂණයට ලක්කළ අනෙකුත් දිස්ත්‍රික්ක හා සංසන්දනය කළ විටදී කොළඹ දිස්ත්‍රික්කයේ පාසල් සිසුන් තුළ එක් දිනක් හෝ මනෝවර්තක ගණයේ ඖෂධ (පෙති වර්ග) භාවිතයේ ඉහළම ප්‍රවණතාවය දක්නට ඇත.

කොළඹ දිස්ත්‍රික්කය තුළ සමීක්ෂණට භාජනය කළ පාසල් සිසුන්ගෙන් 4.5% (37) ක් දැනට කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන අතර එය 3.1% - 5.9% ත් අතර පවතී.

මෙම දිස්ත්‍රික්කය තුළද වර්තමාන මත්ද්‍රව්‍ය භාවිතයේ ඉහළම ප්‍රවණතාව සිගරැට් වන අතර දිස්ත්‍රික්කය තුළ සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 3.1% (26) ක් දැනට සිගරැට් භාවිත කරන අතර එය 1.9% - 4.4% ත් අතර පරාසයේ පවති. සිගරැට් වලට අමතරව මද්‍යසාර 1.58% (13) ක් ද, බියර් 0.24% (2) ක් ද, විවිධ පුවක් වර්ග භාවිත කළ සිසුන් 0.6% (5) ක් ද, බාබුල් භාවිත කරන සිසුන් 0.24% (2) ක් ද සමීක්ෂණය තුළින් අනාවරණය විය.

තවද කොළඹ දිස්ත්‍රික්කය තුළ ගංජා හා විවිධ ඖෂධ වර්ග (පෙති වර්ග) අනිසි භාවිතයක් දක්නට ඇති අතර එය කොළඹ දිස්ත්‍රික්කයේ සමීක්ෂණයට භාජනය කළ මුළු සිසුන්ට ප්‍රතිශතයක් ලෙස දැනට ගංජා භාවිත කරන සිසුන් 0.36% (3) ක් අනාවරණය වූ අතර එය 0.7% දක්වා උපරිම විය හැකි බව ප්‍රකාශ කළ හැකිය. තවද ඖෂධ අනිසි භාවිතය මෙම දිස්ත්‍රික්කය තුළ සමීක්ෂණයට ලක් කළ මුළු සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 0.24% (2) ක් වන අතර එය 0.58% ක් දක්වා උපරිම විය හැකි බව ද ප්‍රකාශ කළ හැකිය.

අනෙකුත් දිස්ත්‍රික්ක හා සසදන විටදී කොළඹ දිස්ත්‍රික්කය තුළ පාලනයට යටත් (සිගරැට්/මද්‍යසාර යනාදී) මත්ද්‍රව්‍ය වලට සිසුන්ගේ අඩු ප්‍රවණතාවක් පැවතිය ද නීත්‍යානුකූල නොවන මත්ද්‍රව්‍ය එනම්, අන්තරායකර ඖෂධ (ගංජා, පෙති වර්ග) වලට යොමුවීමේ සාපේක්ෂ ඉහළ ප්‍රවණතාවක් පවතින බව අනාවරණය විය.

කෙසේ නමුත් කොළඹ දිස්ත්‍රික්කය තුළ නීත්‍යානුකූල නොවන මත්ද්‍රව්‍ය හා පාලනයට යටත් මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් ව්‍යාප්තියක් පවතින බව ප්‍රකාශ කළ හැකිය. කොළඹ දිස්ත්‍රික්කය තුළ බහුවිධ මත්ද්‍රව්‍යය වර්ග ව්‍යාප්තියක් අනෙකුත් දිස්ත්‍රික්ක වලට සාපේක්ෂව ඉහළ මට්ටමක පවති.

### 2.3.6 මහනුවර දිස්ත්‍රික්කය

මහනුවර දිස්ත්‍රික්කය තුළ සිසුන් 527 දෙනෙකු සමීක්ෂණයට භාජනය කළ අතර එම සිසුන්ගෙන් එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කර ඇති සිසුන් 13.1% (69) ක් බව හෙළිවූ අතර එම අගය 10% - 16% ත් අතර පරාසයේ පවති.

මහනුවර දිස්ත්‍රික්කය තුළ සිසුන් එක් දිනක් හෝ භාවිත කළ මත්ද්‍රව්‍ය අතර සමීක්ෂණයට භාජනය කළ මහනුවර දිස්ත්‍රික්කයේ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 5.5% (29) ක් මද්‍යසාර භාවිත කර ඇති අතර එය 3.55% - 7.45% ත් අතර පවතින බව අනාවරණය විය. තවද එක් දිනක් හෝ සිගරැට් භාවිත කළ සිසුන් සඳහා එම අගය 5.1% (27) ක් බවද හෙළිවිය. ඉහත මත්ද්‍රව්‍ය වලට අමතරව මහනුවර දිස්ත්‍රික්කයේ පාසල් ළමුන් එක් දිනක් හෝ බියර්, දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන හා බාබුල් භාවිත කර

ඇති බව සමීක්ෂණය තුළින් අනාවරණය වූ අතර එම අගයන් පිළිවෙලින් 2.1% (11) ,(1.9% (10) හා (0.4% (2) ක් බව අනාවරණය විය.

**වගුව 13 - මහනුවර දිස්ත්‍රික්කයේ සිසුන් අතර ප්‍රචලිත මත්ද්‍රව්‍ය වර්ග සහ සංයුතිය**

| මත්ද්‍රව්‍ය වර්ගය | එක් දිනක් හෝ භාවිත කළ | දැනට භාවිත කරන |
|---|---|---|
| සිගරැට් | 5.1% | 2.66% |
| මද්‍යසාර | 5.5% | 2.66% |
| බියර් | 2.1% | 1.33% |
| දුම්කුඩු | 1.9% | 1.52% |
| බාබුල් | 0.4% | 0.19% |
| මෝදක | 0.0% | - |
| පුවක් | 0.9% | 0.95% |
| ගංජා | 0.8% | 0.76% |
| පෙති | 0.2% | 0.19% |
| වෙනත් | 0.2% | 0.19% |

**මූලාශ්‍රයඃ සමීක්ෂණ දත්ත 2016/17**

එක් දිනක් හෝ ගංජා හා පෙති වර්ග භාවිත කළ සිසුන් මහනුවර දිස්ත්‍රික්කය තුළින් අනාවරණය වූ අතර දිස්ත්‍රික්කයේ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස එම අගයන් ගංජා හා පෙති සඳහා පිළිවෙලින් 0.8% (4) හා 0.2% (1) ක් විය.

මහනුවර දිස්ත්‍රික්කය තුළ සමීක්ෂණයට භාජනය කළ සිසුන්ගෙන් 4.7% (25) ක් කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් දැනට භාවිත කරන බවත් එය 2.9% ත්, 6.6% ත් අතර පරාසයේ පවතී. මහනුවර දිස්ත්‍රික්කයේ සිසුන් තුළ දැනට භාවිත කරන මත්ද්‍රව්‍ය අතර ඉහළම ප්‍රවණතාව සිගරැට් හා මද්‍යසාර සම්බන්ධව පවතින අතර එය සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 2.66% (14) ක් බැගින් විය. දැනට බියර්, දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන, පුවක් වර්ග හා බාබුල් භාවිතයේ ප්‍රවණතාවක් පවතින අතර මහනුවර දිස්ත්‍රික්කය තුළ සමීක්ෂණයට භාජනය කළ මුළු සිසුන්ට ප්‍රතිශතයක් ලෙස එම එක් එක් මත්ද්‍රව්‍ය වර්ගය භාවිත කළ සිසුන් පිළිවෙලින් 1.3% (7), 1.5% (8), 0.9% (5) හා 0.19% (1) ක් විය.

නීත්‍යානුකූල නොවන මත්ද්‍රව්‍ය ලෙස ගංජා හා විවිධ ඖෂධ (පෙති) වර්ග අනිසි භාවිතය කෙරෙහිද සිසුන්ගේ යොමුවීමක් දක්නට ලැබේ. එම දිස්ත්‍රික්කයේ සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 0.76%(4) ක් දැනට ගංජා භාවිතා කරන බවත්, එය 0.02% - 1.5% ත් අතර පරාසයේ පිහිටා ඇත. තවද මහනුවර දිස්ත්‍රික්කය තුළ පෙති වර්ග භාවිතයේ ප්‍රවණතාවක් දක්නට ඇති බවත්, එය 0.19% (1) ක් වන අතර උපරිම වශයෙන් 0.56% ක් විය හැකිය.

### 2.3.7 ගම්පහ දිස්ත්‍රික්කය

ගම්පහ දිස්ත්‍රික්කය තුළ සමීක්ෂණයට භාජනය කළ සිසුන් (651) ගෙන් එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කර ඇති සිසුන් 17.5% (114) ක් සිටි අතර එය 15% - 20% ත් අතර ප්‍රාන්තරයේ පවති. ගම්පහ දිස්ත්‍රික්කයේ එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කර ඇති සිසුන්, භාවිත කළ එක් එක් මත්ද්‍රව්‍ය වර්ග සලකන විටදී එම දිස්ත්‍රික්කයේ සමීක්ෂණයට භාජනය කළ සිසුන්ගෙන් 6.9%

(45) ක් මද්‍යසාර භාවිත කර ඇති අතර එය 4.96% - 8.86% ත් අතර පවති. එක් දිනක් හෝ සිගරැට්, බියර්, දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන හා බාබුල් භාවිත කළ සිසුන් ද ගම්පහ දිස්ත්‍රික්කය තුළින් හමුවූ අතර එම අගයන් පිළිවෙලින් 4.3% (28), 3.6% (24), 2.5% (16) හා 1.5% (10) ක් විය. තවද ගම්පහ දිස්ත්‍රික්කය තුළ එක් දිනක් හෝ පුවක්වර්ග (1.2% (8) සහ කොරෙක්ස් ඩී (0.15% (1) වැනි ඖෂධ භාවිත කළ සිසුන් ද දින කීපයක් ගංජා අත්හදා තිබූ සිසුන් 0.2% (1) ක් ද සිටි බව අනාවරණය විය.

**වගුව 14 - ගම්පහ දිස්ත්‍රික්කයේ සිසුන් අතර ප්‍රචලිත මත්ද්‍රව්‍ය වර්ග සහ සංයුතිය**

| මත්ද්‍රව්‍ය වර්ගය | එක් දිනක් හෝ භාවිත කළ | දැනට භාවිත කරන |
|---|---|---|
| සිගරැට් | 4.3% | 1.54% |
| මද්‍යසාර | 6.9% | 1.84% |
| බියර් | 3.7% | 1.08% |
| දුම්කුඩු | 2.5% | 0.61% |
| බාබුල් | 1.5% | 0.31% |
| මෝදක | 0.0% | - |
| පුවක් | 1.2% | 0.77% |
| ගංජා | 0.2% | 0.15% |
| පෙති | 0.0% | - |
| වෙනත් | 0.8% | - |

**මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත 2016/17**

ගම්පහ දිස්ත්‍රික්කය තුළ සමීක්ෂණයට භාජනය කළ සිසුන් (651)ගෙන් 3.7% (24) දැනට කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන අතර එය 2.2% - 5.1%ත් අතර පරාසයේ පවති.

ගම්පහ දිස්ත්‍රික්කය තුළ සිසුන් දැනට භාවිත කරන එක් එක් මත්ද්‍රව්‍ය වර්ග සැලකූ විටදී මද්‍යසාර සම්බන්ධව සාපේක්ෂව ඉහළ අගයක් දක්නට ඇත. සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 1.8% (12) ක් මද්‍යසාර භාවිත කරන බවත්, මද්‍යසාර වලට අමතරව සිගරැට් භාවිතයෙහි ද යම් ප්‍රවණතාවක් පවතින බවත් එය 1.5% (10) ක් විය හැකි බවත් ප්‍රකාශ කළ හැකිය. තවද දැනට බියර් භාවිත කරන සිසුන් 1% (7) ක් ද, දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන භාවිත කරන සිසුන් 0.6% (4) ක් ද, විවිධ පුවක් වර්ග භාවිත කරන සිසුන් 0.77% (5) ක් ද හා බාබුල් භාවිත කරන සිසුන් 0.31% (2) ක් ද සමීක්ෂණය තුළින් අනාවරණය විය.

වර්තමානයේ ගංජා භාවිත කරන සිසුන් ගම්පහ දිස්ත්‍රික්කය තුළ අනාවරණය වූ අතර ගම්පහ දිස්ත්‍රික්කය තුළ සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 0.15% (1) ක් දැනට ගංජා භාවිත කරන බවත් එය 0.45% දක්වා උපරිම විය හැකි බවත් ප්‍රකාශ කළ හැකිය. ගම්පහ දිස්ත්‍රික්කය තුළද සිසුන්ගේ වර්තමාන බහුවිධ මත්ද්‍රව්‍ය භාවිතයේ සාපේක්ෂ ඉහළ පැතිරීමක් දක්නට ඇති අතර එය කොළඹ දිස්ත්‍රික්කයේ පැතිරීමට වඩා අඩු මට්ටමක පවතී. තවද කොළඹ දිස්ත්‍රික්කය තුළ සිසුන්ගේ ඖෂධ අනිසි භාවිතයේ ප්‍රවණතාවක් (පෙති භාවිතය) දක්නට ලැබුණි.

### 2.3.8 කුරුණෑගල දිස්ත්‍රික්කය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ සිසුන් 645 ක් සමීක්ෂණයට ලක් කළ අතර එම සිසුන්ට ප්‍රතිශතයක් ලෙස එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කළ සිසුන් 14.3% (92) ක් විය. තවද එය 12% - 17% ත් අතර ප්‍රාන්තරයේ පවතින බවට සංඛ්‍යානමය වශයෙන් ප්‍රකාශ කළ හැකිය.

එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කළ සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය සැලකූ විටදී ඉහළම ප්‍රචලිත බව මද්‍යසාර 4.8% (31) සම්බන්ධව පවතින අතර මද්‍යසාර වලට අමතරව සිගරට්, දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන හා බියර් භාවිතයේ ද ප්‍රවණතාවක් පවතින බවට අනාවරණය වූ අතර මුළු සිසුන්ට ප්‍රතිශතයක් ලෙස එම අගයන් පිළිවෙලින් 4.0% (26), 4.0% (26) හා 2.0% (13) ක් විය. තවද විවිධ පුවක් වර්ග 0.9% (6) ක් ද හා බාබුල් 0.5% (3) ක් ද භාවිත කළ බවත් අනාවරණය විය.

**වගුව 15 - කුරුණෑගල දිස්ත්‍රික්කයේ සිසුන් අතර ප්‍රචලිත මත්ද්‍රව්‍ය වර්ග සහ සංයුතිය**

| මත්ද්‍රව්‍ය වර්ගය | එක් දිනක් හෝ භාවිත කළ | දැනට භාවිත කරන |
|---|---|---|
| සිගරට් | 4.0% | 0.78% |
| මද්‍යසාර | 4.8% | 1.09% |
| බියර් | 2.0% | 0.78% |
| දුම්කුඩු | 4.0% | 1.24% |
| බාබුල් | 0.5% | 0.16% |
| මෝදක | 0.0% | - |
| පුවක් | 0.9% | 0.31% |
| ගංජා | 0.3% | - |
| පෙති | 0.2% | - |
| වෙනත් | 0.5% | 0.16% |

**මූලාශ්‍රයඃ සමීක්ෂණ දත්ත 2016/17**

කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ සිසුන් අතර විෂ මත්ද්‍රව්‍ය ලෙස ගැනෙන ගංජා හා විවිධ ඖෂධ (පෙති) වර්ග අනිසි ලෙස භාවිතයේ යම් ප්‍රවණතාවක් දක්නට ඇති අතර කුරුණෑගල දිස්ත්‍රික්කයේ සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස එක් දිනක් හෝ ගංජා භාවිත කළ සිසුන් 0.3% (2) ක් විය. එය 0.74% දක්වා උපරිම ද විය හැකි බව ප්‍රකාශ කළ හැකිය. තවද විවිධ ඖෂධ (පෙති) වර්ග එක් දිනක් හෝ අනිසි ලෙස භාවිත කළ සිසුන් 0.15% (1) ක් වූ අතර එය 0.46% දක්වා උපරිම විය හැකිය.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ සමීක්ෂණයට දායක කරගත් සිසුන්ගෙන් 3.3% (21) ක් දැනට කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන අතර එය 2% - 4.6% ත් අතර පරාසයේ පවතින බව ප්‍රකාශ කළ හැකිය. මෙම දිස්ත්‍රික්කයේ සිසුන් තුළ දැනට භාවිත කරන මත්ද්‍රව්‍ය අතර ඉහළම ප්‍රවණතාව දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන (දුම්කුඩු) සම්බන්ධව පවතින අතර මෙම දිස්ත්‍රික්කයේ සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 1.2% (8) ක් දුම්කුඩු භාවිත කරන බවත්, දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන වලට අමතරව සිගරට් (0.78% (5) හා මද්‍යසාර (1.1% (7) සම්බන්ධව ද යම් ප්‍රචලිත බවක් දක්නට ඇති බව අනාවරණය විය. තවද සිසුන් වර්තමානය තුළ බියර්, විවිධ පුවක් වර්ග හා බාබුල් වැනි මත්ද්‍රව්‍ය භාවිත කරන අතර එම එක් එක් මත්ද්‍රව්‍ය වර්ග සඳහා ප්‍රතිශත අගයන් පිළිවෙලින් 0.78% (5), 0.31% (2), හා 0.15% (1) ක් විය.

### 2.3.9 රත්නපුර දිස්ත්‍රික්කය

රත්නපුර දිස්ත්‍රිකකය තුළ සමීක්ෂණය දායක කරගත් මුළු සිසුන් (410) ගෙන් එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කර ඇති සිසුන් 13.2% (54) ක් බවත් එය 10% - 16% ත් අතර පරාසයේ පවතින බව දත්ත විශ්ලේෂණය තුළින් අනාවරණය විය.

රත්නපුර දිස්ත්‍රික්කය තුළ එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කළ සිසුන් අතර ඉහළම ප්‍රචලිත බව දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන සඳහා බව අනාවරණය විය. සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 4.9% (20) ක් එක් දිනක් හෝ දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන අත්හදා බැලූ සිසුන් වන අතර එය 2.8% - 7.0% ත් අතර පරාසයේ පවති.

රත්නපුර දිස්ත්‍රික්කය තුළ දක්නට ඇති විශේෂත්වය වන්නේ අනෙකුත් දිස්ත්‍රික්ක වල මත්ද්‍රව්‍ය සම්බන්ධ ඉහළ ප්‍රවණතාව සිගරැට් හෝ මද්‍යසාර සම්බන්ධව වුවත් රත්නපුර දිස්ත්‍රික්කයේ දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන (දුම්කුඩු) සම්බන්ධව ඉහළ ප්‍රවණතාවක් පවතින බව ද හඳුනාගත හැකි විය.

දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන (දුම්කුඩු) වලට අමතරව සිගරැට්, මද්‍යසාර හා බියර් භාවිතයේ ප්‍රවණතාවක් පවතින බවත්, මුළු සිසුන්ට ප්‍රතිශතයක් ලෙස එම එක් එක් මත්ද්‍රව්‍ය එක් දිනක් හෝ භාවිත කළ සිසුන් පිළිවෙලින් 2.4% (10), 0.4% (2) හා 0.4% (2) ක් විය. තවද බාබුල් 0.2% (1) ක් හා මදනමෝදක 0.5% (2) ක් වූ අතර විෂ මත්ද්‍රව්‍ය ලෙස ගැනෙන ගංජා එක් දිනක් හෝ භාවිත කළ සිසුන් 0.2% (1) ක් අනාවරණය වූ අතර එය 0.72% ක් දක්වා උපරිම විය හැකි බව මෙහිදී හෙළිවිය.

**වගුව 16 - රත්නපුර දිස්ත්‍රික්කයේ සිසුන් අතර ප්‍රචලිත මත්ද්‍රව්‍ය වර්ග සහ සංයුතිය**

| මත්ද්‍රව්‍ය වර්ගය | එක් දිනක් හෝ භාවිත කළ | දැනට භාවිත කරන |
|---|---|---|
| සිගරැට් | 2.4% | 0.24% |
| මද්‍යසාර | 0.5% | 0.24% |
| බියර් | 0.5% | 0.24% |
| දුම්කුඩු | 4.9% | 1.95% |
| බාබුල් | 0.2% | - |
| මෝදක | 0.5% | 0.24% |
| පුවක් | 0.0% | - |
| ගංජා | 0.2% | 0.00% |
| පෙති | 0.0% | - |
| වෙනත් | 0.5% | - |

**මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත 2016/17**

රත්නපුර දිස්ත්‍රික්කය තුළ සමීක්ෂණයට භාජනය කළ මුළු සිසුන්ගෙන් 2.9% (12) ක් දැනට කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන අතර එය 1.3% - 4.6% ත් අතර පරාසයේ පවති. සමීක්ෂණයට පදනම් කරගත් දිස්ත්‍රික්ක වලින් මත්ද්‍රව්‍ය භාවිතයේ අඩු ප්‍රතිශතයක් දක්වන දිස්ත්‍රික්ක අතර රත්නපුර දිස්ත්‍රික්කය තුළ පවතින බව අනාවරණය විය.

සිසුන් අතර දැනට භාවිතයේ ප්‍රචලිත වී ඇති මත්ද්‍රව්‍ය සලකා බලන විටදී දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන (දුම්කුඩු) සම්බන්ධව ප්‍රමුඛතාවක් ගෙන ඇත. මෙම දිස්ත්‍රික්කයේ සමීක්ෂණයට භාජනය

කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන සඳහා එම අගය 1.9% (8) ක් විය. තවද සිගරට්, මද්‍යසාර, බියර් හා මදනමෝදක සඳහා වූ ප්‍රතිශතයන් 0.25% ට වඩා අඩු අගයන් ගන්නා බැවින් එම මත්ද්‍රව්‍ය සම්බන්ධව සුළු ප්‍රවණතාවක් හඳුනාගත හැකි විය. ඒ අනුව අනෙකුත් දිස්ත්‍රික්ක හා සසඳන විට රත්නපුර දිස්ත්‍රික්කයේ සිසුන් තුළ බහුවිධ මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය පහළ මට්ටමක ඇති බව සමීක්ෂණ දත්ත තුළින් අනාවරණය විය.

### 2.3.10 යාපනය දිස්ත්‍රික්කය

යාපනය දිස්ත්‍රික්කය තුළ සිසුන් 249 ක් සමීක්ෂණයට භාජනය කළ අතර ඔවුන්ගෙන් 10% (25) ක් එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කර ඇති අතර එය 6% - 14% ත් අතර පරාසයේ පැවතිණි. යාපනය දිස්ත්‍රික්කයේ සිසුන් තුළ අනෙකුත් දිස්ත්‍රික්කවල මෙන් බහුවිධ මත්ද්‍රව්‍යයන්හි ඉහළ ව්‍යාප්තියක් දක්නට නොමැති අතර එක් දිනක් හෝ භාවිත කළ මත්ද්‍රව්‍ය අතරින් ඉහළම ප්‍රචලිත බව සිගරට් සම්බන්ධයෙන් අනාවරණය විය. එය සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 6.4%(16) ක් වූ අතර එය 3.4% - 9.5% ත් අතර පරාසයේ පවතී. සිගරට් වලට අමතරව මද්‍යසාර හා බියර් භාවිතයේ ද ප්‍රවණතාවක් පවතින අතර මද්‍යසාර හා බියර් සඳහා පිළිවෙළින් 3.6% (9) ක් 0.4% (1) ක් ද විය.

**වගුව 17 - යාපනය දිස්ත්‍රික්කයේ සිසුන් අතර ප්‍රචලිත මත්ද්‍රව්‍ය වර්ග සහ සංයුතිය**

| | එක් දිනක් හෝ භාවිත කළ | දැනට භාවිත කරන |
|---|---|---|
| සිගරට් | 6.4% | 2.81% |
| මද්‍යසාර | 3.6% | 1.21% |
| බියර් | 0.4% | - |
| දුම්කුඩු | 0.0% | - |
| බාබුල් | 0.0% | - |
| මෝදක | 0.0% | - |
| පුවක් | 0.0% | - |
| ගංජා | 0.4% | 0.40% |
| පෙති | 0.0% | - |
| වෙනත් | 0.0% | - |

**මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත 2016/17**

එක් දිනක් හෝ ගංජා භාවිත කළ සිසුන් යාපනය දිස්ත්‍රික්කයෙන් හමුවූ අතර එය සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 0.4% (1) ක් බව සමීක්ෂණ දත්ත තුළින් අනාවරණය විය.

දිස්ත්‍රික්කය තුළ සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස දැනට භාවිත කරන මත්ද්‍රව්‍ය අතර ඉහළම ප්‍රවණතාවය සිගරට් සම්බන්ධව දැකිය හැකි අතර එය ප්‍රතිශතයක් ලෙස 2.8% (7) ක් වූ අතර එය 0.8% - 4.9% ත් අතර පරාසයේ පවතින බව ප්‍රකාශ කළ හැකිය. තවද මද්‍යසාර සඳහා එම අගය 1.2% (3) ක් වේ.

දිස්ත්‍රික්කයේ සිසුන්ගෙන් 0.4% (1) ක් දැනට ගංජා භාවිතයේ ද කිසියම් ප්‍රවණතාවක් පවතින අතර එය අතර එය 1.19% ක් දක්වා ඉහළ අගයක් ද විය හැකිය.

### 2.3.11 කළුතර දිස්ත්‍රික්කය

කළුතර දිස්ත්‍රික්කය තුළ සිසුන් 394ක් සමීක්ෂණයට ලක්කළ අතර ඔවුන්ගේ 15.7% (62) ක් එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කර ඇති අතර එය 12% - 19% ත් අතර පරාසයේ පවති.

කළුතර දිස්ත්‍රික්කයේ එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කළ සිසුන් අතර ඉහළම ප්‍රචලිත බව දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන (දුම්කුඩු) සම්බන්ධව පවතින අතර එය සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 4.6% (18) ක් වන අතර 2.5% - 6.6% ත් අතර ප්‍රාන්තරයේ පවතී. ඊට අමතරව මද්‍යසාර (4.3% (17) හා සිගරැට් (3.5% (14) සඳහා ද ප්‍රචලිත බවක් දැකිය හැකි විය. තවද සිසුන්ගෙන් බියර් සඳහා 3.0% (12) ක් ද විවිධ පුවක් වර්ග සඳහා 3.0% (12) ක් ද වශයෙන් අනාවරණය වූ අතර බාබුල් (0.3% (1) සඳහා ඉතා සුළු ප්‍රවණතාවක් ද හඳුනාගත හැකි විය. මෙම දිස්ත්‍රික්කය තුළ අනෙකුත් දිස්ත්‍රික්ක වලට සාපේක්ෂව විෂ මත්ද්‍රව්‍ය ව්‍යාප්තියේ ඉහළ ප්‍රවණතාවක් දක්නට නොලැබිණි.

**වගුව 18 - කළුතර දිස්ත්‍රික්කයේ සිසුන් අතර ප්‍රචලිත මත්ද්‍රව්‍ය වර්ග සහ සංයුතිය**

| මත්ද්‍රව්‍ය වර්ගය | එක් දිනක් හෝ භාවිත කළ | දැනට භාවිත කරන |
|---|---|---|
| සිගරැට් | 3.6% | 1.27% |
| මද්‍යසාර | 4.3% | 0.76% |
| බියර් | 3.0% | 0.76% |
| දුම්කුඩු | 4.6% | 1.52% |
| බාබුල් | 0.3% | - |
| මෝදක | 0.0% | - |
| පුවක් | 3.0% | 0.51% |
| ගංජා | 0.0% | - |
| පෙති | 0.0% | - |
| වෙනත් | 1.0% | - |

**මූලාශ්‍රයː සමීක්ෂණ දත්ත 2016/17**

සිසුන්ගෙන් 2.8% (11) ක් දැනට කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කරන අතර එය 1.2% - 4.4% ත් අතර ප්‍රාන්තරයේ පවතින බවට ප්‍රකාශ කළ හැකිය.

දිස්ත්‍රික්කය තුළ වර්තමාන මත්ද්‍රව්‍ය භාවිතයේ ඉහළම අගය සිගරැට් සම්බන්ධව දැකිය හැකි අතර එම අගය 1.26% (5) ක් විය. සිගරැට් වලට අමතරව මද්‍යසාර හා බියර් සම්බන්ධ යම් ප්‍රවණතාවක් දක්නට ඇති අතර සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස මද්‍යසාර හා බියර් සඳහා පිළිවෙලින් 0.76% (3) හා 0.76% (3) ක් විය. තවද සිසුන් අතර දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන හා විවිධ පුවක් වර්ග භාවිතයේ ප්‍රවණතාවක් පවතින අතර දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන (දුම්කුඩු) හා පුවක් වර්ග සඳහා එම අගයන් පිළිවෙලින් 1.5% (6) ක් හා 0.51% (2) ක් විය.

### 2.3.12 ගාල්ල දිස්ත්‍රික්කය

ගාල්ල දිස්ත්‍රික්කයේ සමීක්ෂණයට භාජනය කළ මුළු සිසුන්ට ප්‍රතිශතයක් ලෙස එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කළ සිසුන් 12.5% (401) ක් සමීක්ෂණය තුළින් අනාවරණය විය. එය 9% ත් 16% ත් අතර පරාසයේ පිහිටන බව ප්‍රකාශ කළ හැකිය.

ගාල්ල දිස්ත්‍රික්කයේ සමීක්ෂණයට භාජනය කළ මුළු සිසුන්ට ප්‍රතිශතයක් ලෙස එක් දිනක් හෝ සිසුන් භාවිත කර ඇති මත්ද්‍රව්‍ය අතර ඉහළම ප්‍රවණතාව මද්‍යසාර සඳහා වූ අතර එය 5.75% (23) විය. තවද එය 3.5% - 8% අතර පරාසයේ ද පවතින බව ද අනාවරණය විය. මද්‍යසාර වලට අමතරව සිගරට් භාවිත කළ සිසුන් 4.5% (18) ක් ද බියර් හා දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන (දුම්කුඩු) භාවිත කළ සිසුන් පිළිවෙළින් 2.5% ක් හා 1% ක් ද විය.

**වගුව 19 - ගාල්ල දිස්ත්‍රික්කයේ සිසුන් අතර ප්‍රචලිත මත්ද්‍රව්‍ය වර්ග සහ සංයුතිය**

| | එක් දිනක් හෝ භාවිත කළ | දැනට භාවිත කරන |
|---|---|---|
| සිගරට් | 4.5% | 1.25% |
| මද්‍යසාර | 5.7% | 0.50% |
| බියර් | 2.5% | - |
| දුම්කුඩු | 1.0% | - |
| බාබුල් | 0.0% | - |
| මෝදක | 0.0% | - |
| පුවක් | 0.0% | - |
| ගංජා | 0.2% | - |
| පෙති | 0.0% | - |
| වෙනත් | 0.5% | 0.25% |

**මුලාශ්‍රයඃ සමීක්ෂණ දත්ත 2016/17**

එක් දිනක් හෝ ගංජා භාවිත කළ සිසුන් 0.2% (1) ක් වාර්තා වූ අතර වර්තමානයේ ගංජා භාවිත කරන සිසුන් ගාල්ල දිස්ත්‍රික්කය තුළින් අනාවරණය නොවිණි.

ගාල්ල දිස්ත්‍රික්කය තුළ සමීක්ෂණය සඳහා දායක කරගත් සිසුන්ගෙන් 2.2% (9) ක් දැනට කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කරන අතර එය 0.8% ත් 3.7% ත් අතර ප්‍රාන්තරයේ පවතින බව ප්‍රකාශ කළ හැකිය. දැනට භාවිත කරන මත්ද්‍රව්‍ය අතර සිගරට් හා මද්‍යසාර පිළිබඳව පමණක් මෙම දිස්ත්‍රික්කය තුළ අනාවරණය විය. ගාල්ල දිස්ත්‍රික්කයේ සමීක්ෂණයට භාජනය කළ සිසුන්ගෙන් 1.25% (5) ක් සිගරට් භාවිතයේ යෙදෙන බවත් මද්‍යසාර සඳහා එම අගය 0.5% (2) ක් බවත් හෙළිවිය.


## 2.4. දිස්ත්‍රික්ක අනුව එක් එක් මත්ද්‍රව්‍ය වර්ගවල ප්‍රචලිත බව

සමස්තයක් ලෙස සමීක්ෂණය සඳහා ශ්‍රී ලංකාවේ තෝරාගත් සියලුම දිස්ත්‍රික්කවල සිසුන් භාවිත කළ මත්ද්‍රව්‍ය අතර ඉහළම ප්‍රචලිත බව අනාවරණය වූයේ සිගරට් සම්බන්ධව ය. එය සමීක්ෂණයට භාජනය කළ මුළු සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 2.1% (106) ක් වන අතර එය 1.7% - 2.5% ත් අතර පරාසයේ පවතින බව ද අනාවරණය විය.

### 2.4.1 දිස්ත්‍රික්ක අනුව සිගරැට් භාවිතයේ ප්‍රචලිතබව

එක් එක් දිස්ත්‍රික්ක තුළ සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස සිගරැට් භාවිතය සලකා බලන විටදී ඉහළ ප්‍රචලිත බව අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් අනාවරණය වූ අතර ඊට අමතරව මොණරාගල හා කොළඹ දිස්ත්‍රික්කය තුළින් ද හෙළිවිය.

**සිතියම 02 - සිගරැට් භාවිතයේ ප්‍රවණතාව (දිස්ත්‍රික්ක අනුව)**





සිගරැට් භාවිතය අඩුම ප්‍රචලිත බව රත්නපුර හා කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ දක්නට ලැබිණ.

### 2.4.2 මද්‍යසාර භාවිතයේ ප්‍රචලිතබව (දිස්ත්‍රික්ක අනුව)

සමස්තයක් ලෙස ශ්‍රී ලංකාවේ තෝරාගත් සියලුම දිස්ත්‍රික්ක වල සිසුන් භාවිත කරන මත්ද්‍රව්‍ය අතර දෙවන ස්ථානය මද්‍යසාර සම්බන්ධව දක්නට ලැබුණු අතර එය මුළු ළමුන්ට ප්‍රතිශතයක් ලෙස 1.6% (82) ක් විය.

එක් එක් දිස්ත්‍රික්ක මට්ටමින් මද්‍යසාර සම්බන්ධව ප්‍රචලිත බව සලකා බැලීමේදී ඉහළම ප්‍රචලිත බව මොණරාගල දිස්ත්‍රික්කයෙන් හඳුනාගත හැකි අතර ඊට අමතරව පුත්තලම දිස්ත්‍රික්කය තුළින් ද, මහනුවර දිස්ත්‍රික්කයෙන් ද හඳුනාගත හැකිය. මද්‍යසාර සම්බන්ධ අඩුම ප්‍රචලිත බව රත්නපුර දිස්ත්‍රික්කය පෙන්නුම් කර ඇත.

සිතියම 03 - දිස්ත්‍රික්ක අනුව මද්‍යසාර භාවිතයේ ප්‍රවණතාව





## 2.4.3 දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන (දුම්කුඩු) භාවිතයේ ප්‍රචලිතබව (දිස්ත්‍රික්ක මට්ටමෙන්)

සමීක්ෂණය සඳහා පදනම් කරගත් එක් එක් දිස්ත්‍රික්ක වල සිටි මුළු ළමුන්ට ප්‍රතිශතයක් ලෙස සිගරට් හා මද්‍යසාර හැරුණු විට දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන (දුම්කුඩු) සඳහා ද සිසුන් තුළ වැඩි ප්‍රවණතාවක් පැවතිණි.

ඒ අනුව මුළු සිසුන්ගෙන් 1.02% (52) ක් දුම්කුඩු භාවිත කරන බවත්, එය 0.15% - 1.3% ත් අතර පරාසයේ පවතින බවත් ප්‍රකාශ කළ හැකිය. එක් එක් දිස්ත්‍රික්කයේ සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදනවල ඉහළම ප්‍රචලිත බව මොණරාගල දිස්ත්‍රික්කය තුළින් ද, රත්නපුර හා හම්බන්තොට යන දිස්ත්‍රික්ක තුළින් ද දක්නට ලැබිණි. දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන වල දැනට භාවිත සිසුන් ගාල්ල හා යාපනය දිස්ත්‍රික්ක තුළින් අනාවරණය නොවීය.

**සිතියම 04 - දිස්ත්‍රික්ක අනුව දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන (දුම්කුඩු) භාවිතයේ ප්‍රවණතාව**





## 2.4.4 දිස්ත්‍රික්ක අනුව ගංජා භාවිතයේ ප්‍රචලිතබව

ශ්‍රී ලංකාව තුළ සමීක්ෂණයට තෝරාගත් සියලුම දිස්ත්‍රික්කවල අධ්‍යයනයට භාජනය කළ සියලුම සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 0.3% (15) ක් දැනට ගංජා භාවිත කරන අතර එය 0.15% - 0.45% ත් අතර පරාසයේ පවති.

එක් එක් දිස්ත්‍රික් මට්ටමින් ගත්කළ ගංජා භාවිතයේ ඉහළම ප්‍රචලිත බව පුත්තලම දිස්ත්‍රික්කයෙන් ද, ඊට අමතරව මොණරාගල දිස්ත්‍රික්කය තුළින් ද හඳුනාගත හැකි විය. පුත්තලම දිස්ත්‍රික්කය තුළ ගංජා භාවිතය ඉහළ යාමට හේතුව ශ්‍රී ලංකාවේ වයඹ දිග මුහුදු තීරය තුළින් රට තුළට ගංජා ඇතුළුවීමත්, මොණරාගල දිස්ත්‍රික්කය තුළ ගංජා භාවිතයේ ප්‍රවණතාවය ඉහළ යාමට හේතුව ලෙස නීත්‍යානුකූල නොවන ගංජා වගා කිරීම හා ඒ ආශ්‍රිත ජාවාරම් වල ප්‍රබලතාවය ලෙසත් දැක්විය හැකිය.

සිතියම 05 - දිස්ත්‍රික්ක අනුව ගංජා භාවිතයේ ප්‍රවණතාව




පුත්තලම හා මොණරාගල දිස්ත්‍රික්ක හැරුණු විට්දී යාපනය, කොළඹ හා ගම්පහ දිස්ත්‍රික්ක වලද දැනට ගංජා භාවිතයේ ව්‍යාප්තියක් පෙන්නුම් කර ඇත. සමීක්ෂණය තුළ තෝරාගත් අනෙකුත් දිස්ත්‍රික්ක තුළ දැනට ගංජා භාවිත කරන සිසුන් අනාවරණය නොවීය.

### 2.4.5 දිස්ත්‍රික්ක අනුව වෙනත් මත්ද්‍රව්‍ය වර්ග භාවිතයේ ප්‍රචලිතබව

විෂ මත්ද්‍රව්‍ය ලෙස සිසුන් තුළ දැනට ගංජා භාවිතයේ යම් ප්‍රවණතාවක් පවතින අතර ගංජා වලට අමතරව විවිධ මනෝවර්තක ගණයේ ඖෂධ භාවිතයේ ද සුළු ප්‍රවණතාවක් පෙන්නුම් කරන ලදී. සමීක්ෂණයට භාජනය කළ දිස්ත්‍රික්ක අතර දැනට මනෝවර්තක ගණයේ ඖෂධ (පෙති) භාවිතයේ ප්‍රවණතාවක් ඇති දිස්ත්‍රික්ක ලෙස කොළඹ හා මහනුවර අනාවරණය වූ අතර මෙම දිස්ත්‍රික්ක දෙකෙන් කොළඹ දිස්ත්‍රික්කය තුළ සාපේක්ෂව ඉහළ ප්‍රචලිත බවක් දක්නට ඇත.

මෙම අධ්‍යයනයේ නියැදිය තුළ හෙරොයින් අත්හදා බැලූ සිසුන් දෙදෙනෙකු පමණක් හමුවිය. ඔවුන් කොළඹ දිස්ත්‍රික්කයේ වන අතර අනෙකුත් කිසිදු දිස්ත්‍රික්කයක නියැදිය තුළ හෙරොයින් භාවිත කළ සිසුන් අනාවරණය නොවුණි.

බියර් භාවිතය සලකන විට්දී දිස්ත්‍රික්ක අතරින් ඉහළම ප්‍රවණතාව මොණරාගල දිස්ත්‍රික්කයේ පවතින අතර දෙවනුව පුත්තලම දිස්ත්‍රික්කය තුළ දක්නට ඇත. සමීක්ෂණයට භාජනය කළ දිස්ත්‍රික්ක අතරින් අනුරාධපුර, හම්බන්තොට, ගාල්ල හා යාපනය යන දිස්ත්‍රික්කවල දැනට බියර් භාවිත කරන සිසුන් පිළිබඳ අනාවරණය නොවීය.

විවිධ පුවක් වර්ග, බාබුල් හා මදනමෝදක වල ඉහළම ප්‍රචලිත බව පුත්තලම දිස්ත්‍රික්කය තුළ අනාවරණය විය. පුත්තලම දිස්ත්‍රික්කය හා කොළඹ දිස්ත්‍රික්කය තුළ බාබුල් හා පුවක් වර්ග වල ඉහළ ප්‍රචලිත බවක් දක්නට ලැබිණ.

මදනමෝදක සම්බන්ධයෙන් පුත්තලම දිස්ත්‍රික්කය හැරුණුවිට රත්නපුර දිස්ත්‍රික්කය තුළ දැනට භාවිතයේ ප්‍රචලිත බවක් දක්නට ඇත.

## 2.5. මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි යොමුවීමට හේතු හා ඔවුන්ගේ ප්‍රජා හා සමාජ විද්‍යාත්මක සාධක


### 2.5.1 ස්ත්‍රී පුරුෂභාවය අනුව මත්ද්‍රව්‍ය භාවිතයෙහි ප්‍රවණතා

පාසල් සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයෙහි ප්‍රවණතා සළකා බැලීමේදී මත්ද්‍රව්‍ය භාවිතය සඳහා ස්ත්‍රී පුරුෂභාවය කෙතරම් දුරට බලපෑමක් සිදුකර තිබේද යන්න මෙම සමීක්ෂණයේදී සළකා බලන ලදී.

සමීක්ෂණය සඳහා තෝරාගත් දිස්ත්‍රික්කවලින් සිසුන් 3166 ක් හා සිසුවියන් 1909 දෙනෙකු ගෙන් යුත් නියැදියේ සිසුන්ගෙන් 5.7% (182) ක් **දැනට** කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන බවත් සිසුවියන් සඳහා එම අගය 1.2% (24) ක් බවත් අනාවරණය විය.

සිසුන් හා සිසුවියන් දැනට කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත ප්‍රතිශතවල වෙනසක් පවතින බව ප්‍රකාශ කළ හැකිය. එම ප්‍රතිශතයන්හි වෙනස 4.2% ක් විය. තවද එය 3.2% ත්, 5.1% ත් අතර පරාසයේ පවතින බවට ද ප්‍රකාශ කළ හැකිය. මේ අනුව සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයට වඩා සිසුවියන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය ඉතා පහළ අගයක් ගන්නා බවට සංඛ්‍යානමය වශයෙන් ප්‍රකාශ කළ හැකිය. අවම වශයෙන් එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කර තිබූ ශිෂ්‍යයින් ප්‍රතිශතය 20% (642) ක් වූ අතර ශිෂ්‍යාවන් සඳහා එම අගය 7.5% (145) ක් විය.

**ප්‍රස්තාරය 07 - මත්ද්‍රව්‍ය භාවිතය හා ස්ත්‍රී පුරුෂභාවය**




**මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත 2016/17**

ශිෂ්‍යයින් හා ශිෂ්‍යාවන් භාවිත කළ එක් එක් මත්ද්‍රව්‍ය වර්ග සංසන්දනය කරන විටදී සමීක්ෂණයට භාජනය කළ නියැදියේ මුළු ශිෂ්‍යයින් හා ශිෂ්‍යාවන් ට ප්‍රතිශතයක් ලෙස දැනට සිගරැට් භාවිත කරන ප්‍රතිශත පිළිවෙලින් 2.8% (89) ක් හා 0.79% (13) ක් විය. මද්‍යසාර හා බියර් භාවිතා කරන ලද ශිෂ්‍යයින් 2.3% (72) ක් හා 1.3% ක් වූ අතර ශිෂ්‍යාවන් සඳහා එම අගයන් පිළිවෙළින් 0.42% (4) හා

0.0% ක් විය. දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන භාවිත ශිෂ්‍යයින් 1.6% (50) ක් වූ අතර ශිෂ්‍යාවන් සඳහා එම අගය 0.1% (2) ක් විය.
ගංජා භාවිතය සලකා බැලීමේදී සමීක්ෂණයට භාජනය කළ මුළු සිසුන්ට ප්‍රතිශතයක් ලෙස දැනට ගංජා භාවිත කරන ශිෂ්‍යයින් 0.4% (12) ක් වූ අතර ශිෂ්‍යාවන් 0.05% (1) ක් ද විය.

ශිෂ්‍යයින් විසින් ගංජා භාවිත කර තිබුණ අතර ගංජා භාවිත කළ මුළු සිසුන්ගෙන් 79% (11)ක් දේශීය ගංජා භාවිත කර තිබූ අතර 21% (3) ක් කේරළ ගංජා භාවිත කර තිබුණි. කේරළ ගංජා භාවිත කළ සිසුන් බස්නාහිර පළාත තුළින් පමණක් වාර්තා වූ අතර දේශීය ගංජා භාවිත කළ සිසුන් සමීක්ෂණයට භාජනය කළ සියලුම පළාත් වලින් වාර්තා විය. ගංජා භාවිත කරන එක් සිසුවියක් පමණක් යාපනය දිස්ත්‍රික්කයෙන් අනාවරණය විය.

සමස්තයක් ලෙස එක්දිනක් හෝ ගංජා අත්හදා බැලූ සිසුන් සලකන විටදී සමීක්ෂණයට භාජනය කළ මුළු සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 0.72% (24) ක් එක් දිනක් හෝ ගංජා භාවිත කර තිබූ බවත්, කේරළ ගංජා සහ දේශීය ගංජා යන ගංජා දෙවර්ගයම භාවිත කළ සිසුන් 0.06% (2) ක් ද දේශීය ගංජා භාවිත කළ සිසුන් 0.6% (20) ක් ද කේරළ ගංජා භාවිත කළ සිසුන් 0.2% (6) ක් ද සිටි බව අනාවරණය විය. තවද හෙරොයින් එක් දිනක් හෝ අත්හදා බැලීමක් සිදුකරන ලද සිසුන් 0.06% (2) ක් සමීක්ෂණය තුළින් අනාවරණය නොවුණි.

මනෝවර්ථක ගණයේ විවිධ ඖෂධ (මත්පෙති) අනිසි ලෙස භාවිත කළ සිසුන් සිටින බවට සමීක්ෂණය තුළින් අනාවරණය වූ අතර සමීක්ෂණයට භාජනය කළ මුළු ශිෂ්‍යයින්ට ප්‍රතිශතයක් ලෙස එක් දිනක් හෝ කිසියම් මනෝවර්ථක ගණයේ ඖෂධයක් අත්හදා බැලූ සිසුන් 0.25% (8) ක් විය. ඔවුන්ගෙන් 37.5% (3) ක් දැනට මනෝවර්තක ගණයේ ඖෂධ භාවිත කරන බව මෙහිදී අනාවරණය විය. දැනට එය මුළු සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 0.09% (3) ක් විය. සිසුවියන් මනෝවර්ථක ඖෂධ අනිසි ලෙස භාවිත කරන බවට තොරතුරු අනාවරණය නොවිණි.

සමීක්ෂණයට ලක්කළ ශිෂ්‍යයින් අතර විවිධ පුවක් වර්ග (මාවා) භාවිතයේ ද ව්‍යාප්තියක් දක්නට ඇති බව අනාවරණය විය. තවද බාබුල්, මදනමෝදක (ගංජා ආශ්‍රිත නිෂ්පාදන) භාවිත කළ ශිෂ්‍යයින් ද සමීක්ෂණය තුළින් අනාවරණය වූ අතර සිසුවියන් තුළ මෙවැනි මත්ද්‍රව්‍යවල භාවිතයක් දක්නට නොලැබිණි.


මුළු ශිෂ්‍යයින් (3166) ප්‍රතිශතයක් ලෙස එක් දිනක් හෝ පුවක් වර්ග අත්හදා බලන ලද ශිෂ්‍යයින් 1.4% (46) ක් බවත් ඔවුන්ගෙන් 50% (23) ක් දැනටත් පුවක් වර්ග භාවිත කරන බව ද හෙළි විය. සමීක්ෂණයට භාජනය කළ මුළු ශිෂ්‍යයින්ට ප්‍රතිශතයක් ලෙස දැනට (මාවා) පුවක් වර්ග භාවිත කරන ශිෂ්‍යයින් ප්‍රතිශතය 0.72% (23) ක් ද (මාවා) පුවක් වර්ග අත්හදා බැලීමක් පමණක් සිදුකළ සිසුවියන් 0.26% (5) ක් සමීක්ෂණය තුළින් හඳුනාගත හැකි වූ අතර දැනට භාවිත කරන ශිෂ්‍යාවන් නියැදිය තුළ හමුනොවුණි. සමීක්ෂණයට භාජනය කළ මුළු ශිෂ්‍යයින්ට ප්‍රතිශතයක් ලෙස බීඩි හෝ සුරුට්ටු එක් දිනක් හෝ භාවිත කළ ශිෂ්‍යයින් 0.69% (23) ක් විය. දැනට බීඩි හෝ සුරුට්ටු භාවිත ශිෂ්‍යයින්ගේ ප්‍රතිශතය 0.3% (10) ක් වන අතර සිසුවියන් සඳහා එම අගයන් පිළිවෙලින් 0.21% (4) ක් හා 0.1% (2) ක් විය.

### 2.5.2 ජනවර්ගය අනුව සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයෙහි ප්‍රවණතා

සමීක්ෂණයට භාජනය කළ නියැදිය තුළ බහුතරය සිංහල (4022) ජනවර්ගය නියෝජනය කළ සිසුන් වූ අතර මුස්ලිම් හා දෙමළ ජාතික සිසුන් පිළිවෙලින් 546 ක් හා 467 ක් විය. තවද නියැදිය තුළ බර්ගර් සිසුන් 15 ක් හා මැලේ සිසුන් 22 ක් ද, වෙනත් ජාතික සිසුන් 03 ක් ද නියෝජනය විය.

නියැදිය තුළ නියෝජනය වූ මුළු සිංහල සිසුන්ට ප්‍රතිශතයක් ලෙස එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කළ සිසුන් 15.3% (614) ක් වූ අතර මුස්ලිම් හා දමිළ මුළු සිසුන්ට ප්‍රතිශතයක් ලෙස එම අගයන් පිළිවෙලින් 17.8% (97) ක් හා 14.6%(68) ක් විය. තවද බර්ගර් ජාතික හා මැලේ ජාතික සිසුන්ට ප්‍රතිශතයක් ලෙස එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කළ සිසුන් 26.7% (4) ක් හා 13.6% (3) ක් විය.

**ප්‍රස්තාරය 08 -ජනවර්ගය අනුව සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය**





**මූලාශ්‍රයː සමීක්ෂණ දත්ත 2016/17**

සමීක්ෂණයට ඇතුලත් මුළු සිංහල සිසුන්ට ප්‍රතිශතයක් ලෙස වර්තමානයේ කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කළ සිංහල සිසුන් 3.8% (153)ක් ද, දෙමළ හා මුස්ලිම් සිසුන් සඳහා එම අගයන් පිළිවෙලින් 4.1% (19 ක් හා 6.0% (33) ක් ද විය.

එසේ වුවත් වර්තමානය තුළ එක් එක් ජාතීන් අනුව බහුවිධ මත්ද්‍රව්‍ය භාවිතයේ ස්වරූපය සලකා බලන විටදී එක් එක් මත්ද්‍රව්‍ය වර්ගය අනුව එය තරමක් වෙනස් වේ. සිංහල හා දෙමළ ජාතික සිසුන්ට සාපේක්ෂව මුස්ලිම් ජාතික සිසුන් අතර සිගරට්, පුවක් වර්ග හා විවිධ මනෝවර්ධක ඖෂධ වර්ග භාවිතයේ ඉහළ ප්‍රචලිත බවක් දක්නට ලැබිණ. සමීක්ෂණයට භාජනය කළ මුළු මුස්ලිම් සිසුන්ට ප්‍රතිශතයක් ලෙස දැනට සිගරට් භාවිත කරන සිසුන් 4% (22) ක් ද , පුවක් වර්ග හා පෙති භාවිතය සඳහා එම අගයන් පිළිවෙලින් 0.5% (3) ක් හා 0.37% (2) ක් ද අනාවරණය විය. එසේ වුවත් දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන (දුම්කුඩු), මද්‍යසාර හා බියර් භාවිතය සලකන විටදී මුස්ලිම් හා දෙමළ සිසුන්ට

සාපේක්ෂව සිංහල සිසුන්ගේ ඉහළ ප්‍රචලිත බවක් දක්නට ඇත. සමීක්ෂණය සඳහා සහභාගි කරගත් මුළු සිංහල සිසුන්ට ප්‍රතිශතයක් ලෙස දැනට දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන, මද්‍යසාර හා බියර් භාවිත සිසුන් පිළිවෙලින් 1.2% (48) ක්, 1.7% (68) ක් හා 1% (40) ක් ද විය.

**ප්‍රස්තාරය 09 -ජනවර්ගය අනුව සිසුන් භාවිත කරන බහුවිධ මත්ද්‍රව්‍ය වර්ග**




**මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත 2016/17**


ගංජා භාවිතයේ ඉහළම ප්‍රචලිත බව දමිළ (0.6%, (3) සිසුන් තුළ ද, දෙවනුව මුස්ලිම් සිසුන් (0.4%, (2) හා තෙවනුව සිංහල (0.2%, (10) සිසුන් තුළ ද දක්නට ලැබිණ.

### 2.5.3 ආගම අනුව සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයෙහි ප්‍රවණතා

එක් එක් ආගම් වලට අදාළව සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කර ඇති සිසුන්ගේ ඉහළම ප්‍රතිශතය ක්‍රිස්තියානි ආගමට අයත් සිසුන් 25.8%, (41) ද හා රෝමානු කතෝලික 23.4%, (54) ආගමට අයත් සිසුන් වූ අතර ඉස්ලාම් ආගමට අයත් සිසුන් 17.6% (100) ක් ද සිටින ලදී. බෞද්ධ 14.7% (547) හා හින්දු ආගමික 11.3% (44) සිසුන් තුළ මෙම අගය සාපේක්ෂව පහළ අගයක් ගෙන තිබුණු බව ද අනාවරණය විය.

එසේ වුවත් කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන සිසුන්ගේ ආගම විශ්ලේෂණය කර බැලීමේ දී සමීක්ෂණයට භාජනය කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස ඉස්ලාම් ආගමික සිසුන් 6.8% (33) ප්‍රමුඛතාවය ගෙන තිබිණ. ක්‍රිස්තියානි 5.7% (9) හා රෝමානු කතෝලික සිසුන් 4.8% (11) ක් ද බෞද්ධ සිසුන් 3.7% (138) ක් අතරද විය. සමීක්ෂණයට භාජනය කළ හින්දු ආගමට අයත් සිසුන්ට ප්‍රතිශතයක් ලෙස එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කළ සිසුන් 3.6% (14) ක් වාර්තා විය. ඒ අනුව නියැදිය තුළ මත්ද්‍රව්‍ය භාවිතයේ අඩුම ප්‍රචලිත බව හින්දු ආගමට අයත් සිසුන් තුළ වාර්තා විය.

ප්‍රස්තාරය 10 - ආගම අනුව සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයෙහි ප්‍රවණතා





මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත 2016/17

එක් එක් ආගම හා ඔවුනොවුන් විසින් භාවිත කළ බහුවිධ මත්ද්‍රව්‍ය අධ්‍යයනය කළ විටදී සමස්තයක් ලෙස සියලුම ආගම්වල සිසුන් තුළ සිගරැට් භාවිතයේ කිසියම් ප්‍රචලිත බවක් දක්නට ඇති අතර එම තත්ත්වය ඉස්ලාම් භක්තික සිසුන් 3.87% (22) තුළ ඉහළ අගයක් ද, ක්‍රිස්තියානි භක්තික සිසුන් 3.77% (6) ක් ද හින්දු 2.81%(11) හා කතෝලික 2.16% (5) සිසුන් තුළ සාපේක්ෂ අඩු තත්ත්වයක් ද දක්නට ලැබිණ. සිගරැට් භාවිතයේ අඩුම ප්‍රචලිත බව බෞද්ධ සිසුන් 1.66% (62) තුළ දක්නට ලැබිණ.

එසේ වුවද බෞද්ධ සිසුන් අතර දුම්කුඩු ආශ්‍රිත නිෂ්පාදන (1.24%) භාවිතයේ ඉහළම ප්‍රචලිත බවක් දක්නට ඇති අතර බෞද්ධ සිසුන්ගේ මද්‍යසාර (1.66%), බියර් (0.96%) භාවිතයේ ද සුළු ප්‍රවණතාවක් පවතින බව අනාවරණය විය. හින්දු හා ඉස්ලාම් භක්තික සිසුන් අතර බියර් හා මද්‍යසාර භාවිතයේ පහළ ප්‍රවණතාවක් පවතින අතර බියර් හා මද්‍යසාර භාවිතයේ ඉහළම ප්‍රචලිත බව ක්‍රිස්තියානි හා රෝමානු කතෝලික සිසුන් අතර දක්නට ඇති බව සමීක්ෂණය තුළින් අනාවරණය විය.

ප්‍රස්තාරය 11 - ආගම අනුව සිසුන් භාවිත කළ බහුවිධ මත්ද්‍රව්‍ය වර්ග




මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත 2016/17


සිසුන් අතර ගංජා භාවිතයේ ද සුළු ප්‍රවණතාවක් පවතින අතර මෙහි ඉහළ අගයක් ගන්නේ ක්‍රිස්තියානි හා හින්දු ආගමට අයත් සිසුන් අතර පැවතිණි. බෞද්ධ සිසුන් අතර පහළ ප්‍රවණතාවක් පෙන්නුම් කරනු ලැබීය.

### 2.5.4 මත්ද්‍රව්‍ය භාවිතය හා සිසුන්ගේ විනෝදාංශ අතර සහසම්බන්ධතාවය

මත්ද්‍රව්‍ය භාවිත කිරීම හෝ මත්ද්‍රව්‍ය අත්හදා බැලීම කෙරෙහි ශිෂ්‍යයෙකුගේ විනෝදාංශය බලපෑමක් ඇති කරයි ද යන්න සමීක්ෂණය තුළ අධ්‍යයනට ලක්කළ අතර එහි දී අනාවරණය වූයේ ඇතැම් විනෝදාංශ, සිසුන්ගේ මත්ද්‍රව්‍ය අත්හදා බැලීම හා වර්තමාන මත්ද්‍රව්‍ය භාවිතය ඉහළ යාම කෙරෙහි තුඩු දුන් බවයි.

එක් එක් විනෝදාංශය සඳහා යොමු වූ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කර ඇති සිසුන්ගේ ඉහළ ප්‍රවණතාවක් පෙන්නුම් කරනු ලබන්නේ චිත්‍රපට නැරඹීම 20.3% (205) හා මිතුරන් ඇසුරු කිරීම 19.9% (233) වැනි විනෝදාංශවල දී බව හෙළි විය. විනෝදාංශයක් නොමැති සිසුන් 25.6% (10) ට ප්‍රතිශතයක් ලෙස එක් දිනක් හෝ මත්ද්‍රව්‍ය භාවිත කළ පිරිසෙහි ඉහළම අගයක් ගැනීම ද මෙහිදී අනාවරණය වූ තවත් විශේෂ කරුණකි. මීට අමතරව ක්‍රීඩා කිරීම 17% (507) හා වාදනය 17.8% (97) සිය විනෝදාංශය කරගත් සිසුන් අතරද මත්ද්‍රව්‍ය භාවිතයේ යම් ප්‍රවණතාවක් පැවතිණි. ගායනය, නර්තනය හා කියවීම වැනි විනෝදාංශවල නියැලෙන සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධ අඩු ප්‍රවණතාවක් පෙන්වන බව ද අනාවරණය විය.

ප්‍රස්තාරය 12 - මත්ද්‍රව්‍ය භාවිතය හා විනෝදාංශ අතර සම්බන්ධතාව




මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත 2016/17

එක් එක් විනෝදාංශයේ යෙදුන සිසුන්ට ප්‍රතිශතයක් ලෙස වර්තමානයේ එනම් දැනට කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන සිසුන් සලකා බැලූ විටදී ද පැහැදිලි වන්නේ චිත්‍රපට නැරඹීම, මිතුරු ඇසුර, හා ක්‍රීඩා කිරීම යනාදී විනෝදාංශවල යෙදෙන සිසුන් තුළ මත්ද්‍රව්‍ය භාවිතය අනෙකුත් විනෝදාංශවල නියැලි සිසුන්ට සාපේක්ෂව ඉහළ අගයක් ගන්නා බවයි. එම එක් එක් විනෝදාංශවල යෙදුණු සිසුන්ට ප්‍රතිශතයක් ලෙස එම අගයන් පිළිවෙලින් 5.5% (56), 6.1% (71) හා 4.3% (128) වේ. තවද විනෝදාංශයක් නොමැති සිසුන් තුළ මේ සම්බන්ධ ඉහළම අගය 12.8% (5) ලෙස ද අනාවරණය විය.

තවද පොත්පත් කියවීම, නර්තනය වැනි විනෝදාංශවල යෙදුණු සිසුන් තුළ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධ අඩු ප්‍රවණතාවක් බවක් අනාවරණය වී ඇති අතර එම අගයන් පිළිවෙළින් 1.9% (32) හා 2.1% (12) වේ.

මෙම ඉහත දත්ත විශ්ලේෂණය කර බැලීමේදී පැහැදිලි වන්නේ විනෝදාංශයක් නොමැතිව කාලය ගත කරන හෝ මිතුරන් ඇසුරු කරන, චිත්‍රපට නැරඹීම, ක්‍රීඩා කිරීම වැනි විනෝදාංශවල යෙදෙන සිසුන් මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි නැඹුරුවීම් අවදානම් සහගත බවත්, එවැනි තත්ත්වයන් මත්ද්‍රව්‍ය භාවිතයට සුදුසු අවස්ථාවන් නිර්මාණය කළ හැකි සාධක ලෙස නිර්ණය කළ හැකි බවයි. සෞන්දර්ය කටයුතු වල යෙදීම හා ක්‍රීඩා කිරීම සෞඛ්‍යමත් දිවියකට අඩිතාලමක් වුවද එවැනි අවස්ථා වලදී මත්ද්‍රව්‍ය භාවිත කරන මිතුරන් නිතර මුණගැසෙන බැවින් සිසුන් මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීමේ ඉඩ ප්‍රස්ථා වැඩිවී ඇති බවද අනාවරණය වී ඇත.

### 2.5.5 සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි දෙමාපියන්ගේ අධ්‍යාපන මට්ටමෙහි බලපෑම

දෙමාපියන්ගේ අධ්‍යාපන මට්ටම සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි බලපෑම් කළ හැකි බැවින් ඒ පිළිබඳව ද මෙහිදී අවධානය යොමු කළ අතර සමීක්ෂණය තුළ අධ්‍යාපනය නොලද දෙමාපියන්ගේ සිට උපාධි හෝ ඊට ඉහළ අධ්‍යාපන මට්ටම් දක්වා උගත් දෙමාපියන් සිටි බව අනාවරණය විය.


සමීක්ෂණය තුළින් පාසල් අධ්‍යාපනය නොලද දෙමාපියන් සිටි බවට තොරතුරු ලැබුණු අතර සිසුන්ගෙන් 3.8% (194) දෙනෙකුගේ පියවරුන් පාසල් අධ්‍යාපනය ලබා නොතිබුණු අතර අධ්‍යාපනය නොලද පියවරුන් සිටින සිසුන්ගෙන් 22% (42) ක් එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කර ඇති බවත් 5% (10) ක් දැනට කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කරන බවත් අනාවරණය විය. නියැදිය තුළ සිසුන් 4.2% (216) දෙනෙකුගේ මව්වරුන් පාසල් අධ්‍යාපනය ලබා නොතිබුණ අතර එසේ අධ්‍යාපනය නොලැබූ මව්වරුන් සිටින සිසුන්ගෙන් 18% (39) ක් එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කර ඇති අතර එයින් දැනට මත්ද්‍රව්‍ය භාවිත කරන ප්‍රතිශතය 6% (13) කි.

ප්‍රාථමික අධ්‍යාපනය පමණක් ලැබූ පියවරුන් සිටින සිසුන් 496 ක් නියැදිය තුළ සමීක්ෂණයට භාජනය වූ අතර ඔවුන්ට ප්‍රතිශතයක් ලෙස 19% (92) ක් එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කර ඇති අතර ඉන් 5% (25) ක් දැනට කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන බව ද අනාවරණය විය. ප්‍රාථමික අධ්‍යාපනය දක්වා පමණක් අධ්‍යාපනය ලැබූ මව්වරුන් සිටින පවුල්වල සිසුන් 360 තුළින් එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කළ සිසුන් 22% (78) ක් වූ අතර දැනට මත්ද්‍රව්‍ය භාවිත ප්‍රතිශතය 6% (20) ක් විය.

6 ශ්‍රේණියේ සිට 10 ශ්‍රේණිය දක්වා දක්වා අධ්‍යාපනයක් ලද දෙමාපියන් සිටින සිසුන්ට ප්‍රතිශතයක් ලෙස එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යක් භාවිත කළ සිසුන් 17% (236) ක් ද අ.පො.ස. (සා/පෙළ) සමත් හා අ.පො.ස. (උ/පෙළ) සමත් පියවරුන් සිටින සිසුන්ට ප්‍රතිශතයක් ලෙස එම අගයන් පිළිවෙළින් 14% (213) හා 13% (114) විය. උපාධි හෝ ඊට ඉහළ අධ්‍යාපන මට්ටම් ලබා ඇති පියවරුන් සිටින සිසුන්ට ප්‍රතිශතයක් ලෙස එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යක් භාවිත කළ සිසුන් 12% (44) ක් දක්වා අඩු වීමක් දක්නට ඇත.

6 ශ්‍රේණියේ සිට 10 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලද මව්වරුන් සිටින සිසුන්ගෙන් 16% (199) ක් එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කර ඇති අතර අ.පො.ස. (උ/පෙළ) සමත්, උපාධි හෝ ඊට ඉහළ අධ්‍යාපන මට්ටම් දක්වා අධ්‍යාපනය ලද මව්වරුන් සිටින සිසුන්ට ප්‍රතිශතයක් ලෙස එම අගයන් පිළිවෙලින් 12% (121) ක් හා 10% (30) ක් වශයෙන් අඩුවීමක් දක්නට විය.

**ප්‍රස්තාරය 13 - සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි දෙමාපියන්ගේ අධ්‍යාපන මට්ටමෙහි බලපෑම**




**මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත 2016/17**

සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය හා දෙමාපියන්ගේ එක් එක් අධ්‍යාපන මට්ටම් සැලකුවිටදී ඉහළ අධ්‍යාපන මට්ටම්වලට සාපේක්ෂව අඩු අධ්‍යාපන මට්ටම්වලින් යුතු දෙමාපියන්ගේ දරුවන් මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි වැඩි ප්‍රවණතාවක් දක්වන බව මෙයින් අනාවරණය විය.
අධ්‍යාපනය නොලද මව්වරුන් සිටින සිසුන්ට ප්‍රතිශතයක් ලෙස ඔවුන් දැනට කිසියම් හෝ මත්ද්‍රව්‍ය භාවිත කිරීමේ ප්‍රතිශත අගය 6% (13) ක් වන අතර අධ්‍යාපනය නොලද පියෙක් සිටින සිසුන්ගේ එම අගය 5% (10) ක් විය. උපාධි හෝ ඊට ඉහළ අධ්‍යාපන මට්ටම් වල නිරතවූ මවක් සිටින සිසුන් තුළ දැනට කිසියම් හෝ මත්ද්‍රව්‍ය භාවිත කිරීමේ ප්‍රතිශතය 2% (7) ක් වන අතර උපාධි හෝ ඊට ඉහළ අධ්‍යාපන මට්ටම් වල නිරතවූ පියෙක් සිටින සිසුන් සඳහා එම අගය 3% (9) ක් විය. ඒ අනුව අධ්‍යාපනය නොලද දෙමාපියන් සිටින සිසුන්ට වඩා ඉහළ අධ්‍යාපන මට්ටම් වල නිරත දෙමාපියන් සිටින සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයේ සාපේක්ෂ අඩු ප්‍රවණතාවක් පවතින බව නිගමනය කළ හැකිය. ඉහත ප්‍රස්ථාර සටහන නිරීක්ෂණය කිරීමෙන් එය තවදුරටත් පැහැදිලි කරගත හැකිය.

පියාගේ හා මවගේ අධ්‍යාපන මට්ටම, සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි බලපෑමක් කරන බවත්, මවගේ අධ්‍යාපන මට්ටම, සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි බලපෑමක් කරන බවත් සංඛ්‍යානමය වශයෙන් සනාථ විය.


ඒ අනුව පැහැදිලි වන්නේ දෙමාපියන් ඉහළ අධ්‍යාපන මට්ටම් වලින් පරිපූර්ණ වන විට එම පවුල්වල සිසුන් මත්ද්‍රව්‍ය භාවිත කිරීම කෙරෙහි ඇති ප්‍රවණතාව ද ක්‍රමයෙන් අඩුවන බවයි. එබැවින් අඩු අධ්‍යාපන මට්ටම්වල සිටින දෙමාපියන්ගේ දරුවන්, ඉහළ අධ්‍යාපන මට්ටම්වල සිටින දෙමාපියන්ගේ දරුවන්ට සාපේක්ෂව මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි ඉහළ ප්‍රවණතාවක් පවතින බවත් සිසුන්ගේ දෙමාපියන්ගේ අධ්‍යාපන මට්ටම් හා සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය අතර අන්තර් සම්බන්ධයක් පවතින බවත් නිගමනය කළ හැකිය.

### 2.5.6 සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි දෙමාපියන්ගේ රැකියා තත්ත්වයේ බලපෑම

වර්තමානය තුළ කුමන හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන සිසුන් 206 දෙනෙකු සිටින බවට සමීක්ෂණය තුළින් අනාවරණය වූ අතර ඔවුන්ගෙන් දෙමාපියන්ගේ රැකියාව කෙබඳු ද යන්න මෙහිදී සලකා බැලිණි.

නියැදිය තුළ දැනට කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන සිසුන්ගෙන් 20% (41) කගේ පියවරු පුහුණු ශ්‍රමිකයින් (විදුලි/ජලනල/පෙදරේරු) වන අතර 16% (32) කගේ පියවරුන් කෘෂිකාර්මික හෝ ධීවර වෘත්තියෙහි නිරත වී ඇත. තව ද නුපුහුණු ශ්‍රමිකයින් (කම්කරු/කුලීවැඩ) හා ව්‍යාපාරික/ ස්වයං රැකියාවන්හි නිරත පියවරුන් සිටින, දැනට කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කරන සිසුන් 13% කින් ද රාජ්‍ය හෝ පෞද්ගලික අංශවල විවිධ රැකියාවල නියුතු පියවරුන් සිටින සිසුන් 12% (24) කින් ද සමන්විත වූහ. දැනට මත්ද්‍රව්‍ය භාවිත කරන සිසුන්ගෙන් 10% (20) කගේ පියවරු රියදුරු වෘත්තියෙහි නිරතවී ඇති අතර සිසුන්ගෙන් 11% (23) ක් පියාගේ රැකියාව පිළිබඳව සඳහන් කර නොතිබුණි.

**ප්‍රස්තාරය 14 - සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි පියාගේ රැකියාවේ බලපෑම**





**මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත 2016/17**

3% (7) ක් වෛද්‍ය, ඉංජිනේරු හෝ එවැනි වෘත්තිමය ක්ෂේත්‍රවල රැකියා කරන පියවරුන් සිටින සිසුන් ද මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වී ඇති නමුත් එය වෙනත් රැකියාවල නිරත පියවරුන් සිටින සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයට වඩා අඩු ප්‍රවණතාවක් පවතින බව අනාවරණය විය.

සමීක්ෂණය තුළ දැනට මත්ද්‍රව්‍ය භාවිත කරන සිසුන් 206 දෙනාට ප්‍රතිශතයක් ලෙස සිසුන්ගේ මව්වරුන්ගේ රැකියාව පිළිබඳ අවධානය යොමු කරන විට දැකිය හැකි විශේෂත්වය වන්නේ, දැනට කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන සිසුන් 59% (121) කගේ මව්වරුන් ගෘහණියන් වීමයි. තවද වෘත්තිමය රැකියාවල නිරත වන මව්වරුන් සිටින කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කරන සිසුන් 7% (14) ක් ද නුපුහුණු ශ්‍රමික (කම්කරු/කුලීවැඩ) වැනි වෘත්තීන්හී නිරත මව්වරුන් සිටින කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කරන සිසුන් 6% (13) ක් ද රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ වෘත්තිමය නොවන රැකියාවන්හි නියුතු මව්වරුන් සිටින මත්ද්‍රව්‍ය භාවිත කරන සිසුන් 4% (9) ක් ද, නුපුහුණු ශ්‍රමික, ව්‍යාපාර, ස්වයං

රැකියා, ගෘහ සේවිකා වැනි වෘත්තීන් වල නිරත මව්වරුන් ද සිටින මත්ද්‍රව්‍යයක් භාවිත කරන සිසුන් සඳහා 3% (7) ක් ද ගෙන තිබිණ. තව ද දැනට මත්ද්‍රව්‍ය භාවිත කරන සිසුන්ගෙන් 9% (18) ක් මවගේ රැකියාව පිළිබඳ තොරතුරු ලබාදී නොතිබුණි.

**ප්‍රස්තාරය 15 - සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි මවගේ රැකියාවේ බලපෑම**




**මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත 2016/17**

මේ අනුව පාසැල් සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය හා දෙමාපියන්ගේ රැකියා තත්ත්වය පිළිබඳව සැලකීමේදී නිගමනය කළ හැකි වන්නේ මත්ද්‍රව්‍ය සඳහා යොමුවූ බහුතරයක් සිසුන්ගේ දෙමාපියන්ගේ රැකියා ස්වභාවය ගත්කළ පියවරුන් පුහුණු හා නුපුහුණු ශ්‍රමිකයින් බවත්, මව්වරුන් ගෘහණියන් වන බවත් එම පවුල්වල දරුවන් මත්ද්‍රව්‍ය භාවිතයට කෙරෙහි වැඩි නැඹුරුවක් දක්වා ඇති බවයි. මව්වරුන් ගෘහණියන් වන විටදී දරුවන් නිරීක්ෂණය සඳහා වැඩි අවකාශයක් තිබියදීත් දරුවන් එසේ මත්ද්‍රව්‍ය කෙරෙහි යොමුවීමට හේතුව ලෙස ගෘහණියන් අඩු අධ්‍යාපන මට්ටම් වල සිටීමත් හා මත්ද්‍රව්‍ය භාවිතයේ යාවත්කාලීන වූ දැනුමෙහි පවතින දුර්වලතා බවත් නිගමනය කළ හැකිය.


පුද්ගලයෙකු මත්ද්‍රව්‍යයට යොමුවීම කෙරෙහි විවිධ සාධක බලපාන බව විද්‍යාත්මකව සනාථ කර ඇති අතර එම සාධක අතර ජානමය ලක්ෂණ හා පාරිසරික සාධක වැදගත් ස්ථානයක් ගෙන ඇත. පාරිසරික සාධක ලෙස පුද්ගලයා ජීවත්වන අවට පරිසරය, පාසල හා නිවස තුළ සම්බන්ධතා පවත්වනු ලබන එක් එක් පිරිස් මගින් ඇතිකරන බලපෑම වේ. පරිසර සාධක, පුද්ගලයාගේ මානසික හා ශාරීරික සංවර්ධනය කෙරෙහි ධනාත්මක හෝ සෘණාත්මක අයුරින් බලපෑම් කළ හැකිය. අසල්වැසි පුද්ගලයන්, යහළුවන්, වැඩිහිටි සහෝදර සහෝදරියන් හා දෙමාපියන්ගේ මත්ද්‍රව්‍ය දුර්භාවිතය සම්බන්ධ හැසිරීම් රටාවන්, සිසුන්ගේ මත්ද්‍රව්‍ය දුර්භාවිතය කෙරෙහි බලපෑම් කළ හැකි අතර කිසියම් පුද්ගලයෙකු කෙරෙහි ජානමය සාධක හා පාරිසරික සාධක යන ද්විත්වයම ඒකාබද්ධ වූ විටදී එය ඔහු මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීමේ අවදානමෙන් හරි අඩක් (50%) පමණ වේ. (Lewis, August, 2017).

### 2.5.7 පරිසර සාදක හා මත්ද්‍රව්‍ය භාවිත කිරීමේ ප්‍රවණතා

සිසුන් ජීවත් වන ප්‍රදේශයේ වාසය කරන මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් නිසා සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි කිසියම් හෝ බලපෑමක් සිදුවී ඇත් ද යන්න මෙම සමීක්ෂණය තුළ දී සළකා බලන ලදී. සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි සිසුන් ජීවත්වන ප්‍රදේශයේ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයන්ගේ බලපෑමක් සිදුවී ඇති බව සංඛ්‍යානමය වශයෙන් තහවුරු විය.

**දැනට** කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන සිසුන්ට (206) ප්‍රතිශතයක් ලෙස 77% (159) ක් ප්‍රදේශයේ මත්ද්‍රව්‍ය භාවිත කරන පිරිස් හඳුනාගෙන ඇති අතර එසේ හඳුනා නොගත් සිසුන් 23% (47) ක් විය. මත්ද්‍රව්‍ය භාවිත නොකරන සිසුන්ගෙන් 63% (2667) ක් ප්‍රදේශයේ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් පිළිබඳව හඳුනන බවත් 37% (1584) ක් එවැනි පුද්ගලයින් නොහඳුනන බවත් ප්‍රකාශ කරන ලදී.

**ප්‍රස්තාරය 16 - මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයන් පිළිබඳ සිසුන්ගේ දැනුවත්භාවය**




**මුලාශ්‍රයඃ සමීක්ෂණ දත්ත 2016/17**


ඒ අනුව මත්ද්‍රව්‍ය භාවිත හා භාවිත නොකරන සිසුන් තමා ජීවත්වන ප්‍රදේශයේ මත්ද්‍රව්‍ය භාවිත කරන පිරිස් පිළිබඳව පවතින දැනුවත්භාවය සන්සන්දනය කරන විට දී මත්ද්‍රව්‍ය භාවිත කරන සිසුන්, මත්ද්‍රව්‍ය භාවිත නොකරන සිසුන්ට වඩා තමා ජීවත්වන ප්‍රදේශයේ මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් පිළිබඳව ඉහළ දැනුවත්භාවයකින් පසුවන බව අනාවරණය විය. තව ද මත්ද්‍රව්‍ය භාවිත නොකරන සිසුන්, මත්ද්‍රව්‍ය භාවිත කරන සිසුන්ට වඩා ප්‍රදේශයේ මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් පිළිබඳ අඩු දැනුවත්භාවයකින් පසුවන බවත් හෙළිවිය.
මෙමඟින් හෙළිවන සුවිශේෂී කරුණ වන්නේ, සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි අසල්වැසියන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය තුළින් බලපෑමක් ඇතිවන බවයි.

### 2.5.8 මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් සමඟ සිසුන් පවත්වන අන්තර් සබඳතා

මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් සහ සිසුන් අතර පවත්නා අන්තර් සම්බන්ධතාව පිළිබඳව මෙම අධ්‍යයනය තුළින් විමසන ලදී. එහිදී සිසුන්ගෙන් 92% (4673) ක් ප්‍රකාශ කර තිබුණේ මත්ද්‍රව්‍ය භාවිත

කරන පුද්ගලයන් ඔවුන්ට පෞද්ගලිකව මුණගැසී ඇති බවයි. මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයන් මුණගැසී ඇති බව පැවසූ සිසුන්ගෙන් බහුතරයක් එනම් 63% (2961) ක් උත්සව අවස්ථාවලදී එවැනි පුද්ගලයන් මුණගැසී ඇති බව ප්‍රකාශ කර තිබිණ. සිසුන්ගෙන් 56% (2604) ක් මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් තමා ජීවත්වන ප්‍රදේශය තුළින් ද මුණගැසී ඇති බව ප්‍රකාශ කරන ලදී.

ප්‍රස්තාරය 17 - මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් මුණගැසී තිබෙන ස්ථාන/අවස්ථා




මූලාශ්‍රයඃ සමීක්ෂණ දත්ත 2016/17

සිසුන්ගෙන් 54% (2505) ක් පොදු ස්ථානවල දී 34% (1601) ක් බස් නැවතුම්පොළේ දී ද බවත්, 14% (644) ක් දුම්රියපොළේ දී ද මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් මුණගැසී ඇති බව අනාවරණය විය. පොදු ස්ථානයක දී සිසුවෙකුට සාමාන්‍යයෙන් මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් 9 ක් පමණ මුණ ගැසෙන බවත් දුම්රියපොළ, බස් නැවතුම්පොළ යනාදී ස්ථානවල සාමාන්‍යයෙන් මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් දෙදෙනෙක් වැනි අඩු පුද්ගල සංඛ්‍යාවක් මුණ ගැසී තිබුණු බව සංඛ්‍යානමය වශයෙන් තහවුරු කර ගත හැකිය.


සිසුන් විසින් නිරීක්ෂනය කරන ලද මත්ද්‍රව්‍ය භාවිත කරන්නේ යැයි සැලකෙන පුද්ගලයින් භාවිත කරන ලද මත්ද්‍රව්‍ය වර්ග කෙරෙහි අවධානය යොමු කරන විටදී සිසුන්ගෙන් බහුතරයක් සිගරට් (74%, 3447) හා මද්‍යසාර (64%, 2975) භාවිත කරන පුද්ගලයින් නිරීක්ෂණය කර තිබුණි. 18% (825) ක් බියර් ද, 13% (611) ගංජා ද, 10% (448) ක් හෙරොයින් ද 1% (62) ක් විවිධ ඖෂධ වර්ග අනිසි ලෙස භාවිත කරන බව ද 8% (352) ක් කසිප්පු ද, 6% (286) ක් දුම්කුඩු ද භාවිත කරන පුද්ගලයින් ද ඔවුන් නිරීක්ෂණය කර තිබුණි. තවද ඔවුන් රා, පුවක් වර්ග, කොකේන්, මදන මෝදක, බාබුල් ආදිය ද භාවිත කරන බව සිසුන්ට නිරීක්ෂණය වූ බව සිසුන් විසින් ප්‍රකාශ කර තිබුණි.

මේ අනුව පැහැදිලි වන්නේ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් වැඩි ප්‍රමාණයක් උත්සව අවස්ථා වලදී, පොදු ස්ථාන, ගමේදී හා බස් නැවතුම්පළ තුළ නිරීක්ෂණයට ලක්වන බවයි. සිසුන් ජීවත්වන පරිසරය/ වටපිටාව, මත්ද්‍රව්‍ය භාවිතකරන්නන් බහුල වීම, ඔවුන්ගේ චර්යා රටා නිරීක්ෂණය වීම යනාදිය සිසුන් මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි පෙළඹීමටත් ඒ සඳහා දැඩි අවදානමක් පවතින බවත් අනාවරණය විය.

### 2.5.9 සිසුන් සහ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් අතර සම්බන්ධතාවය

සිසුන් බහුතරයක් මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් පිළිබඳව දැන සිටි බැවින් භාවිත කරන්නන් අතර සිසුන්ගේ සමීපතම මිතුරන්/ඥාතීන්/අසල්වැසියන් සිටිදැයි විමසන ලදී. මෙහිදී සිසුන්ගෙන් 55% (2780) ක් තම සමීපතම පුද්ගලයින් මත්ද්‍රව්‍ය භාවිත කරන බවට ප්‍රකාශ කරන ලදී. සිසුන්ගෙන් 45% (2295) ක් තමන්ගේ සමීපතම පුද්ගලයින් මත්ද්‍රව්‍ය භාවිත නොකරන බව ද ප්‍රකාශ කරන ලදී. තවද මෙහිදී සිසුන් සඳහා මත්ද්‍රව්‍ය භාවිත කරන බහුවිධ සමීපතම පුද්ගලයින් සිටි බවත් මෙහිදී අනාවරණය විය.

**ප්‍රස්තාරය 18 - මත්ද්‍රව්‍ය භාවිත කරන සමීපතම පුද්ගලයින්**





**මූලාශ්‍රයඃ සමීක්ෂණ දත්ත 2016/17**

සමීපතම පුද්ගලයින් මත්ද්‍රව්‍ය භාවිත කරන බවට පැවසූ සිසුන්ගෙන් 44% (1233) කගේ සිය අසැල්වැසියන්ද, 34% ක් තම ඥාතීන් ද, 23% (630) කගේ තම මිතුරන් ද මත්ද්‍රව්‍ය භාවිත කරන බවට තොරතුරු අනාවරණය විය. තවද පියා මත්ද්‍රව්‍ය භාවිත කරන බව, සිසුන්ගෙන් 10% (270) ක් ප්‍රකාශ කර තිබුණි.

සමීපතම පුද්ගලයින් භාවිත කරන ලද එක් එක් මත්ද්‍රව්‍ය වර්ගය සම්බන්ධයෙන් විමසීමේදී අදහස් ප්‍රකාශ කළ සිසුන්ගෙන් බහුතරයක් එනම් 71% (1981) ක් තම සමීපතමයින් සිගරට් භාවිත කරන බවද, 61% (1689) ක් මද්‍යසාර ද, 21% (583) ක් බීඩි ද, 19% (534) ක් බියර් ද, 10% (282) ක් ගංජා ද, 8% (211) ක් දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන ද, 6% (163) ක් හෙරොයින් ද, 6% (158) ක් විවිධ පුවක් වර්ග ද භාවිතා කරන බවද ප්‍රකාශ කර තිබිණ. එය පහත ප්‍රස්තාර සටහනින් වඩාත් පැහැදිලි වේ.

**ප්‍රස්තාරය 19 - සිසුන්ගේ සමීපතම පුද්ගලයින් භාවිත කරන බහුවිධ මත්ද්‍රව්‍ය වර්ග**




**මූලාශ්‍රයඃ සමීක්ෂණ දත්ත 2016/17**


සිය සමීපතම පුද්ගලයින් විසින් භාවිත කරන මත්ද්‍රව්‍ය අතර ප්‍රමුඛතාව පිළිවෙළින් සිගරට්, මද්‍යසාර, බීඩි, බියර් සම්බන්ධ ප්‍රවණතාවක් පවතින බව අනාවරණය විය. ගංජා, හෙරොයින් වැනි මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් සිසුන්ගේ සමීපතමයින් වශයෙන් අඩු ප්‍රතිශතයක් සිටීමට හේතු වී තිබෙනුයේ මාදක ගණයේ මත්ද්‍රව්‍ය නීත්‍යානුකූල නොවීම ද සමාජය තුළ සුලභව දක්නට නොලැබීම ද සහ එය සැඟවුණු උප සංස්කෘතියක් තුළ භාවිත කිරීම බව මෙහිදී තහවුරු කරගත හැකි විය.

## 2.5.10 සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි ඔවුන් ජීවත්වන පරිසරයේ බලපෑම

මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි සිසුන් යොමුවීමට බලපෑම් කරන තවත් එක් සාධකයක් ලෙස සිසුන් ජීවත්වන පරිසරය දැක්විය හැකි අතර සිසුන් සිය දෙමාපියන් සමඟ නිවසේ ජීවත් වන්නේ නම් මත්ද්‍රව්‍ය අත්හදා බැලීම හෝ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි යොමුවීමට ඇති ඉඩ ප්‍රස්ථා අවම විය හැකිය. මේ පිළිබඳව සමීක්ෂණය තුළින් අනාවරණය කරගැනීමට හැකිවිය.

දෙමාපියන් සමඟ ජීවත් වන සිසුන්ට ප්‍රතිශතයක් ලෙස එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් අත්හදා බැලූ සිසුන් 14.9% (698) ක් විය. තම කුඩම්මා හෝ සුළු පියා සමඟ ජීවත්වන සිසුන්ට ප්‍රතිශතයක් ලෙස එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කළ සිසුන් 31.8% (7) ක් ද නෑදෑයකුගේ නිවසේ සිටි සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 32.9% (70) ක් ද යහළුවෙකුගේ නිවසේ සිටි සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 33.3% (5) ක් ද මිතුරන් සමඟ නවාතැන්ගත් සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 26.7% (8) ක් ද පාසල් නේවාසිකාගාරයේ සිටි සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 28.6% (4) ක් ද සිය සහෝදර සහෝදරියන් සමඟ බෝඩිමක සිටින සිසුන්ගෙන් 28% (2) ක් ද එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කර ඇති බව අනාවරණය විය.

ප්‍රස්තාරය 20 - මත්ද්‍රව්‍ය භාවිතය හා පාරිසරික සාධක අතර සම්බන්ධතාවය




**මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත 2016/17**

තවද කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් දැනට භාවිත කරන සිසුන් ද සැලකූ විටදී දෙමාපියන් සමඟ ජීවත් වන සිසුන්ට වඩා දෙමාපියන් නොවන වෙනත් පිරිස් සමඟ ජීවත් වනවිට මත්ද්‍රව්‍ය භාවිතයේ ඉහළ ප්‍රවණතාවක් පෙන්නුම් කර තිබුණි. එනම් දෙමාපියන් සමඟ ජීවත් වන මුළු සිසුන්ට ප්‍රතිශතයක් ලෙස වර්තමානයේ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කරන සිසුන්ගේ ප්‍රතිශතය 3.8% (179) ක් විය. දෙමාපියන් හැර වෙනත් පිරිස් සමඟ ජීවත් වන එක් එක් සිසුන්ට ප්‍රතිශතයක් ලෙස සැලකූ විටදී එනම්, පාසල් නේවාසිකාගාරයේ ජීවත් වන සිසුන්ගෙන් (14.3%) ක් ද කුඩම්මා හෝ සුළු පියා සමඟ ජීවත් වන සිසුන්ගෙන් 9.1% ක් ද, ආච්චි හෝ සීයා සමඟ ජීවත්වන සිසුන්ගෙන් 8.9% ක් ද හා සහෝදර සහෝදරියන් සමඟ නවාතැනක ජීවත්වන සිසුන්ගෙන් 14.3% ක් ද වර්තමාන මත්ද්‍රව්‍ය භාවිතයේ ඉහළ ප්‍රවණතාවක් පෙන්නුම් කර ඇත.

දෙමාපිය ආදරය හා රැකවරණය අවම මට්ටමක පවතින අවස්ථාවන්හිදී හා දෙමාපිය ආදරය, රැකවරණය නොමැති පරිසරයන්හි දී සිසුන් මත්ද්‍රව්‍ය වලට යොමුවීමේ ප්‍රවණතාවක් පවතින බව මෙහිදී අනාවරණය විය.


### 2.5.10.1 සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි අසල්වැසියන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයෙහි බලපෑම

සිසුන් ජීවත්වන නිවස හා ඒ අවට පරිසරයේ ජීවත්වන පුද්ගලයින් මත්ද්‍රව්‍ය භාවිත කිරීම තුළින් සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි බලපෑමක් සිදු වී ඇති බව සංඛ්‍යානමය වශයෙන් නිගමනය කළ හැකි විය.

දැනට මත්ද්‍රව්‍ය භාවිත කරන සිසුන්ට (206) ප්‍රතිශතයක් ලෙස එනම්, 99% (203) කට තම නිවස අවට පරිසරය තුළ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයන් නිතර මුණගැසී ඇති අතර සිසුන් 1% (3) කට එසේ මුණගැසී නොමැත.

මත්ද්‍රව්‍ය භාවිත නොකරන සිසුන්ට (4251) ප්‍රතිශතයක් ලෙස තමා ජීවත්වන නිවස හා ඒ අවට පරිසරය තුළ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් නිතර හමු වී ඇති බව පැවසූ සිසුන් 91% (3884) ක් සිටි අතර, 9% (367) කට එසේ මුණගැසී නොමැත.

**ප්‍රස්තාරය 21 - සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි අසල්වැසියන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයේ බලපෑම**




**මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත 2016/17**


මත්ද්‍රව්‍ය භාවිත කරන හා භාවිත නොකරන සිසුන් දැක්වූ ප්‍රතිශත අගයන් සන්සන්දනය කළ විට දී අනාවරණය වුයේ, මත්ද්‍රව්‍ය භාවිත නොකරන සිසුන්ට වඩා මත්ද්‍රව්‍ය භාවිත කරන සිසුන්ට මත්ද්‍රව්‍ය භාවිත පුද්ගලයින් වැඩි වශයෙන් තමා ජීවත්වන නිවස හා අවට පරිසරය තුළින් හමුවී තිබෙන බවයි. ඒ අනුව පැහැදිලි වන්නේ, සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි සිසුන් ජීවත්වන නිවස හා ඒ අවට පරිසරය තුළ මත්ද්‍රව්‍ය භාවිත පුද්ගලයින් නිතර නිතර මුණගැසීම තුළින් කිසියම් බලපෑමක් කළ හැකි බවයි. තව ද කිසිදිනක මත්ද්‍රව්‍යයක් භාවිත නොකළ සිසුන්ගෙන් 91% (3884) කගේ නිවස හා ඒ අවට පරිසරය තුළ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් බහුලව වාසය කර ඇති බව ඉහත දී අනාවරණය විය. ඒ අනුව නිතර නිතර මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් හා ඔවුන්ගේ හැසිරීම් රටාවන් සිසුන්ට නිරීක්ෂණය වීම, සිසුන් කිසියම් මත්ද්‍රව්‍යයක් අත්හදා බැලීම හෝ භාවිතය කෙරෙහි ද යොමුවිය හැකි පරිසර සාධකයක් බව මෙහි දී පෙන්වා දිය හැකිය.

සිසුන් ජීවත් වන පරිසරය තුළ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් භාවිත කරන බහුවිධ මත්ද්‍රව්‍ය වර්ග සැළකීමේදී තම නිවස අවට පරිසරය තුළ මද්‍යසාර හා සිගරට් භාවිත කරන්නන් බහුලව මුණගැසී ඇත. නිවස අවට පරිසරය තුළ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් සිටි බව ප්‍රකාශ කළ සිසුන්ට (4644) ප්‍රතිශතයක් ලෙස සිසුන්ගෙන් 78% (3627) කගේ සිගරට් භාවිත කරන පුද්ගලයින් ද 68% (3166) කගේ මද්‍යසාර භාවිත කරන පුද්ගලයින් ද සිටි බව ද අනාවරණය විය. තවද ගංජා සඳහා එම අගය 15% (705) ක් ද, හෙරොයින් සඳහා 10% (448) ක් ද, දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන සඳහා 6%

(286)ක් ද වශයෙන් අනාවරණය විය. අවට ප්‍රදේශය තුළ බාබුල්, මදනමෝදක, පුවක් වර්ග, විවිධ පැණි වර්ග හා ඖෂධ වර්ග අනිසි ලෙස භාවිත කරන පුද්ගලයින් ද සිසුන් ජීවත්වන පරිසරය තුළ හමුවන බවත් එය 5% ක් වැනි සුළු අගයක පැවති බවත් හෙළිවිය.

මත්ද්‍රව්‍ය භාවිත නොකරන සිසුන්ට වඩා භාවිත කරන සිසුන්ට මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් වැඩි වශයෙන් හමුවන බව අනාවරණය විය. එක් දිනක් හෝ මත්ද්‍රව්‍ය අත්හදා බැලූ සිසුන් (789) ගෙන් සිසුන් 67% (531) ක ට මද්‍යසාර ද 80% (630) ක ට සිගරැට් ද 21% (164) ක ට ගංජා ද භාවිත කළ පුද්ගලයින් සිසුන් ජීවත්වන ප්‍රදේශය තුළින් හමුවී ඇති බව හෙළි විය. එය පහත ප්‍රස්තාර සටහන හා දත්ත මගින් තවදුරටත් පැහැදිලි කර ගත හැකිය.

**ප්‍රස්තාරය 22 - සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිත තත්ත්වය හා අසල්වැසියන් විසින් භාවිත කළ විවිධ මත්ද්‍රව්‍ය වර්ග**




**මූලාශ්‍රයඃ සමීක්ෂණ දත්ත 2016/17**

මත්ද්‍රව්‍ය භාවිත නොකළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස ඔවුන් ජීවත්වන නිවස හා ඒ අවට පරිසරය තුළ මද්‍යසාර භාවිත කරන 62% (2620) ක් ද, සිගරැට් භාවිත කරන 70% (2979) ක් ද හා ගංජා භාවිත කරන 13% (541) ක් ද සිටින බව වාර්තා විය.

**2.5.10.2 සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි මත්ද්‍රව්‍ය භාවිත කරන සමීපතමයින්ගේ බලපෑම**


සිසුන් ඇසුරු කරන සමීපතමයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතය, සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි බලපෑමක් සිදුකරන බව සංඛ්‍යානමය වශයෙන් තහවුරු විය.

සමීක්ෂණය සඳහා සහභාගි කරගත් සිසුන්ගෙන් 55% (2780) කගේ සමීපතම කිසිවකු හෝ මත්ද්‍රව්‍ය භාවිත කරන බවත් 45% (2295) කගේ සමීපතමයින් මත්ද්‍රව්‍ය භාවිත නොකරන බවත් අනාවරණය විය.

දැනට කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන සිසුන් (206) සැලකූ විට ඔවුන්ගේ සමීපතමයින් බහුලව භාවිත කළ බහුවිධ මත්ද්‍රව්‍ය අතර සිගරැට් 86% (177), මද්‍යසාර 53% (130) හා බියර් (23% (47) සඳහා ඉහළ ප්‍රවණතාවයක් පවතින බව සිසුන් ප්‍රකාශ කර තිබිණ. තවද එම මත්ද්‍රව්‍යවලට අමතරව

සමීපතම පුද්ගලයින් ගංජා (29% (59), හෙරොයින් (7% (15), දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන (දුම්කුඩු) (11% (22), බාබුල් (7% (15) හා පුවක් වර්ග (15% (31) ද සුළු වශයෙන් මදනමෝදක හා පෙති වර්ග භාවිත කරන බවත් සිසුන් ප්‍රකාශ කරන ලදී.

**ප්‍රස්තාරය 23 - සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිත තත්ත්වය හා සමීපතමයන් භාවිත කළ බහුවිධ මත්ද්‍රව්‍ය වර්ගයන්**




**මූලාශ්‍රයඃ සමීක්ෂණ දත්ත 2016/17**


කිසිදිනෙක මත්ද්‍රව්‍යයක් භාවිත කර නොමැති සිසුන් (4251) සැලකූ විටදී ඔවුන්ගෙන් 50%කගේ සමීපතම පුද්ගලයින් කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කරන බවත් 50% ක් එසේ නොවන බවත් දත්ත විශ්ලේෂණය මගින් හෙළිවිය. කිසිදිනක මත්ද්‍රව්‍යයක් භාවිත නොකළ සිසුන් (4251) ගේ මත්ද්‍රව්‍ය භාවිත කරන සමීපතමයින් භාවිත කරන ලද බහුවිධ මත්ද්‍රව්‍ය අතර සිගරට් භාවිත කළ 70% (2979) ක් ද මද්‍යසාර භාවිත කළ 32% (1377) ක් ද හා බියර් භාවිත කළ 9% (390) ක් ද සිටින බව සිසුන් විසින් ප්‍රකාශ කර ඇත. එම මත්ද්‍රව්‍ය වලට අමතරව සමීපතමයින් ගංජා භාවිත කළ බවට 13% (541) ක් ද, හෙරොයින් භාවිත කළ බවට 3% (111) ක් ද, දුම්කුඩු භාවිත කළ බවට 3% (143) ක් ද හා පුවක් වර්ග භාවිත කළ බවට 2% (79) ද වශයෙන් හා ඉතා සුළු වශයෙන් බාබුල්, මදනමෝදක, පැණි වර්ග හා පෙති වර්ග ද භාවිත කරන සමීපතම පුද්ගලයින් ද සිටි බව සිසුන් ප්‍රකාශ කර ඇත.

මත්ද්‍රව්‍ය භාවිත නොකරන සිසුන්ට වඩා මත්ද්‍රව්‍ය භාවිත කරන සිසුන්ට මත්ද්‍රව්‍ය භාවිත කරන සමීපතම පුද්ගලයින් වැඩි සංඛ්‍යාවක් මුණගැසෙන බව ඉහත දත්ත විශ්ලේෂණය තුළින් අනාවරණය විය. ඒ අනුව සමීපතම පුද්ගලයෙකු මත්ද්‍රව්‍ය භාවිත කිරීම, සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීම කෙරෙහි බලපෑමක් කරන බවත්, සිසුන් මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීමේ ප්‍රවණතාව අඩු හෝ වැඩිවීම කෙරෙහි සිසුන්ගේ සමීපතම පුද්ගලයෙකු මත්ද්‍රව්‍ය භාවිතයේ යෙදීමෙහි අඩු හෝ වැඩි වීම බලපෑම් කළ හැකිය.

**දැනට මත්ද්‍රව්‍ය භාවිත කරන සිසුන්,** මත්ද්‍රව්‍ය භාවිත කරන සමීපතම පුද්ගලයින් සමග දැක්වූ සහසම්බන්ධතාව සලකන විටදී කිසියම් මත්ද්‍රව්‍යක් දැනට භාවිත කරන සිසුන් (206) ට ප්‍රතිශතයක්

ලෙස සිසුන්ගෙන් 6% (13) කගේ පියවරුන් ද 24% (50) කගේ ඥාතීන් ද 36% (75) කගේ තම අසල්වැසියන් ද 35% (73) කගේ මිතුරන් ද, 3% (6) කගේ සිය සහෝදරයන් ද මත්ද්‍රව්‍ය භාවිත කරන බවද හෙළිවිය. ඒ අනුව දැනට මත්ද්‍රව්‍ය භාවිත කරන සිසුන්ගේ සමීපතම මත්ද්‍රව්‍ය භාවිත කරන පාර්ශ්වයන් අතර ඉහළ ප්‍රතිශතයන් මිතුරන් හා අසල්වැසියන් වන අතර මීට අමතරව මත්ද්‍රව්‍ය භාවිත කළ සිය ඥාතීන් හා පවුලේ සාමාජිකයින් සමගද සම්බන්ධතා පැවති බවත් දැක්විය හැකිය.

**ප්‍රස්තාරය 24 - සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය සහ මත්ද්‍රව්‍ය භාවිත කරන සමීපතම පුද්ගලයින් අතර සම්බන්ධතාවය**




මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත 2016/17

**කෙදිනක හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කර නොමැති සිසුන්**, මත්ද්‍රව්‍ය භාවිත කළ සමීපතම පුද්ගලයින් සමග දැක්වූ සහසම්බන්ධතාව සලකන විටදී කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් කිසිදිනක භාවිත කර නොමැති සිසුන් (4251) ට ප්‍රතිශතයක් ලෙස මත්ද්‍රව්‍ය භාවිත කරන පියවරුන් සිටින සිසුන් 5% (207) ක් ද, මත්ද්‍රව්‍ය භාවිත කරන ඥාතීන් සිටින සිසුන් 17% (729) ක් ද මත්ද්‍රව්‍ය භාවිත කරන තම අසල්වැසියන් සිටින සිසුන් 23% (995) ක් ද, මත්ද්‍රව්‍ය භාවිත කරන මිතුරන් සිටින සිසුන් 10% (409) ක් ද, මත්ද්‍රව්‍ය භාවිත කරන සිය සහෝදරයන් සිටින සිසුන් 0.5% (21) ක් ද බව මෙහිදී අනාවරණය විය. කිසිදු දිනෙක මත්ද්‍රව්‍යයක් භාවිත කර නොමැති සිසුන්ගේ සමීපතම මත්ද්‍රව්‍ය භාවිත කරන පාර්ශවයන් අතර ඉහළ ප්‍රතිශතයන් අසල්වැසියන් හා ඥාතීන් සම්බන්ධව පවතින අතර ඒ හැරුණු විට දී මත්ද්‍රව්‍ය භාවිත කරන මිතුරන් හා පවුලේ සාමාජිකයින් ද සිටින බවත් අනාවරණය විය.


මත්ද්‍රව්‍ය භාවිත නොකරන සිසුන්ට සාපේක්ෂව මත්ද්‍රව්‍ය භාවිත කරන සිසුන් මත්ද්‍රව්‍ය භාවිත කරන සමීපතම පුද්ගලයන් ලෙස මිතුරන් සමග දක්වන සබඳතා වල ඉහළ ප්‍රතිශත අගයක්, දක්නට ලැබීම මෙහිදී හඳුනාගත හැකි විශේෂත්වයකි. මේ අනුව සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි බලපෑම් කළ එක් සාධකයක් ලෙස මිතුරු ඇසුර ද දැක්විය හැකිය.

### 2.5.11 සිසුන් මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීමේ අවදානම් තත්ත්වය

සමීක්ෂණයට ලක්කළ සිසුන්ගෙන් 98% (4956) කට සිය ජීවිතය සම්බන්ධ පෞද්ගලික ගැටලු ඇති වූ විට සවන්දීමට හා ඒ පිළිබඳව සාකච්ඡා කිරීමට කිසියම් පුද්ගලයෙකු සිටින බවත් 2% (119) කට එසේ කිසියම් හෝ පුද්ගලයෙකු නොසිටි බවත් ප්‍රකාශ කරන ලදී.

සිය ගැටලු සාකච්ඡා කිරීමට කිසියම් පුද්ගලයෙකු නොමැති සිසුන් (119) සැළකිල්ලට ගත් විටදී, ඔවුන්ගෙන් 18% (21) ක් එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කර ඇති සිසුන් වන අතර 4% (5) ක් දැනට කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කරන අය වේ. තවද සිය ගැටලු සාකච්ඡා කිරීමට කිසියම් පුද්ගලයෙකු නොමැති සිසුන්ගෙන් 79% (94) ක් මත්ද්‍රව්‍ය භාවිත නොකරන සිසුන් වුවද ඔවුන්ට සිය ගැටලු සාකච්ඡා කිරීමට කිසියම් පුද්ගලයෙකු නොමැති බැවින් ඔවුන් මත්ද්‍රව්‍ය අත්හදා බැලීම, මත්ද්‍රව්‍ය භාවිතය හෝ වෙනත් සමාජ අපචාර ක්‍රියාවන්ට කිසියම් පිරිස් විසින් පොළඹවා ගැනීමේ අවදානමක් පවතින බවට අනාවරණය විය. සිසුන්ගේ ගැටලුවලදී සවන්දීමට පුද්ගලයෙකු නොමැති සිසුන්ගෙන් 3% (4) ක් මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ ප්‍රතිචාර දක්වා නොමැත.

**ප්‍රස්තාරය 25 -ගැටලු විසඳාගැනීමට උපකාරීවන සහාය කණ්ඩායමේ සංයුතිය**




**මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත 2016/17**

සිය ගැටලු විසඳීමට හෝ සාකච්ඡා කිරීමට කිසියම් පුද්ගලයෙකු සිටි සිසුන් (4956) ගෙන් 84% (4157) ක් එක් දිනක් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත නොකළ සිසුන් වූ අතර 15% (766) ක් එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කළ සිසුන් විය. ගැටලු විසඳීමට හෝ සාකච්ඡා කිරීමට කිසියම් පුද්ගලයෙකු සිටි සිසුන්ගෙන් 4% (201) ක් දැනට කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන සිසුන් විය. මේ අනුව පැහැදිලි වන්නේ මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වූ සිසුන්ට සාපේක්ෂව කිසිදු මත්ද්‍රව්‍යයක් භාවිත නොකළ සිසුන් සඳහා සිය ගැටලු විසඳාගැනීමට වැඩි අවස්ථාවක් ලැබී ඇති බවයි.


සිසුන්ගේ ගැටලු විසඳීමට සහාය වූ එක් එක් පුද්ගලයන්ගේ බහුවිධ ස්වරූප කෙරෙහි අවදානය යොමු කරන විට එක් දිනක් හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත (787) කළ, දැනට භාවිත කරන (206)

හා කිසිඳු මත්ද්‍රව්‍යයක් භාවිත නොකළ (4251) එක් එක් සිසුන්ට ප්‍රතිශතයක් ලෙස සැළකූ විටදී පහත තොරතුරු අනාවරණය විය.

දැනට මත්ද්‍රව්‍ය භාවිත කරන සිසුන් ට (206) ප්‍රතිශතයක් ලෙස සිසුන්ගේ සිය පෞද්ගලික ගැටලු විසඳීමට දෙමාපියන් සිටි බවට 66% (135) ක් ද සහෝදරයෙකු හෝ සහෝදරියක සිටි බවට 26% (53) ක් ද, පාසලේ මිතුරෙකු හෝ මිතුරියක සිටි බවට 43% (88) ක් ද, ඥාතියෙකු සිටි බවට 14% (28) ක් ද, ගුරුවරයකු සිටි බවට 15% (31) ක් ද, වෙනත් කිසිවකු සිටි බවට 7% (15) ක් ද, ලෙස ද ප්‍රකාශ කර තිබුණි.

මත්ද්‍රව්‍ය භාවිත නොකළ සිසුන්ට (4251) ප්‍රතිශතයක් ලෙස 84% (3569) කට පෞද්ගලික ගැටලු විසඳීමට හෝ සාකච්ඡා කිරීමට දෙමාපියන් සිටි බව ද, 22% (915) ක් සඳහා සහෝදරයෙකු හෝ සහෝදරියක සිටි බව ද, 29% (1218) කට පාසලේ මිතුරෙකු හෝ මිතුරියක සිටි බව ද ප්‍රකාශ කළ අතර, ඥාතියෙකු සිටි බවට 10% (423) ක් ද, ගුරුවරයෙකු සිටි බවට 16% (661) ක් ද, වෙනත් පුද්ගලයෙකු සිටි බවට 2% (81) ක් ද ලෙස තොරතුරු අනාවරණය විය.

**ප්‍රස්තාරය 22 - සිසුන්ගේ ගැටලු විසඳීමට සහාය වූ පුද්ගලයන්ගේ සංයුතිය**




**මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත 2016/17**

වර්තමානය තුළ මත්ද්‍රව්‍ය භාවිත කළ හා භාවිත නොකළ සිසුන් තම ගැටලු විසඳාගැනීමට හෝ සාකච්ඡා කිරීමට සහාය ලබාගත් එක් එක් පාර්ශ්වයන්හි ඉහත ප්‍රතිශත අගයන් සන්සන්දනාත්මකව විශ්ලේෂණය කිරීමේ දී සිය ගැටලු විසඳාගැනීමට දෙමාපියන් හෝ ගුරුවරුන් සිටින බවට, මත්ද්‍රව්‍ය භාවිත කරන සිසුන්ට සාපේක්ෂව මත්ද්‍රව්‍ය භාවිත නොකරන සිසුන් දැක්වූ ප්‍රතිශතය ඉහළ අගයක් ගෙන ඇත. දෙමාපියන් හෝ ගුරුවරුන් හැර සෙසු පාර්ශ්වයන්ගෙන් ගැටලු විසඳාගැනීමට හෝ සාකච්ඡා කිරීමට සහාය ලබාගත් සිසුන් පිළිබඳව සැළකිල්ලට භාජනය කළ විට දී මත්ද්‍රව්‍ය භාවිත නොකරන සිසුන්ට සාපේක්ෂ මත්ද්‍රව්‍ය භාවිත කරන සිසුන් දක්වන ප්‍රතිශත අගයන්හි ඉහළ බවක් දක්නට ඇත. මත්ද්‍රව්‍ය භාවිත කරන සිසුන් සිය ගැටලු විසඳාගැනීමට හෝ සාකච්ඡා කිරීමට


දෙමාපියන් නොමැති විට දී වැඩි වශයෙන් මිතුරන්ගේ සහාය ලබාගෙන ඇති බවත්, මිතුරන් ද නොමැති විට දී වෙනත් පිරිස් සමග සිය ගැටලු විසඳාගැනීමට ඔවුන් යොමු වී තිබුණ බවත් අනාවරණය විය.

මේ අනුව පැහැදිලි වන්නේ සිසුන් සිය ගැටලු වලට විසඳුම් සෙවීමේදී සමවයස් කණ්ඩායම් සමග සාකච්ඡා කිරීම මත්ද්‍රව්‍ය භාවිතයට පෙළඹීමේ අවධානම වැඩි කරන සාධකයක් බවයි.

## 2.6 සිසුන් මත්ද්‍රව්‍ය භාවිත නොකිරීමට හේතු

සමීක්ෂණය තුළ මත්ද්‍රව්‍ය භාවිත කරන සිසුන් 4% (206) ක් වූ අතර 96% (4869) ක් දැනට මත්ද්‍රව්‍ය භාවිත නොකරන බවත් සමීක්ෂණය තුළින් අනාවරණය විය. මත්ද්‍රව්‍ය භාවිත නොකරන සිසුන්ගෙන් මත්ද්‍රව්‍ය භාවිත නොකිරීමට හේතු වූ කරුණු විමසා බැලීමේදී අතර පහත තොරතුරු අනාවරණය විය.

**ප්‍රස්තාරය 27 - සිසුන් මත්ද්‍රව්‍ය භාවිත නොකිරීමට හේතු සාධක**




මූලාශ්‍රයː සමීක්ෂණ දත්ත 2016/17

මත්ද්‍රව්‍ය භාවිත නොකරන සිසුන්ගෙන් 72% ක් මත්ද්‍රව්‍ය ශරීර සෞඛ්‍යයට අහිතකර නිසාත්, 38%ක් මත්ද්‍රව්‍ය භාවිතය නරක පුරුද්දක් ලෙස සලකන නිසාත්, භාවිත නොකරන බවට ප්‍රකාශ කර තිබුණි. ඊට අමතරව මත්ද්‍රව්‍ය වැඩසටහන් තුළින් ලැබී ඇති දැනුම නිසා 36% ක් ද දෙමාපියන්ගේ අවවාද පිළිපදින නිසා 28% ක් ද මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ ලැබූ දැනුම නිසා 36%ක් ද මත්ද්‍රව්‍ය භාවිත කරන පරිසරයක් තමාගේ නිවස හා පවුල තුළ නොමැති නිසා බවත් 38% ක් ද මත්ද්‍රව්‍ය භාවිත නොකරන බවට අනාවරණය විය.

මේ අනුව සමීක්ෂණය තුළ මත්ද්‍රව්‍ය භාවිත නොකරන සිසුන්ගෙන් බහුතරයකට මත්ද්‍රව්‍ය භාවිතයෙහි අහිතකර ප්‍රතිවිපාක පිළිබඳ ලබා ඇති අවබෝධය, මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි යොමු නොවී සිටීමට හේතුවී ඇති බව මෙහිදී නිගමනය කළ හැකිය.

## 2.7 මත්ද්‍රව්‍ය පිළිබද සිසුන් තුළ පැවති දැනුම හා ආකල්ප

### 2.7.1 මත්ද්‍රව්‍ය පිළිබඳ සිසුන්ගේ දැනුම

මත්ද්‍රව්‍ය භාවිතය හා භාවිතය තුළින් ඇතිවන ප්‍රතිවිපාක පිළිබඳ පාසල් සිසුන් සතු දැනුම පරීක්ෂා කිරීම ද මෙම සමීක්ෂණය තුළින් සිදු කරන ලදී. නියැදියට අයත් පාසල් සිසුන් 5,075 අතුරින් 4,423 දෙනෙකු එනම්, 87% ක් මත්ද්‍රව්‍ය පිළිබඳව අසා තිබුණි. 13% (652) ක් මත්ද්‍රව්‍ය පිළිබඳ නොදන්නා බව ප්‍රකාශ කර තිබුණි.

"ඕනෑම මනෝකාරක ද්‍රව්‍යයක් වු කලී රෝගයක් වැළැක්වීම හෝ සමනය කිරීමේ විභව්‍යතාවයකින් යුතු හෝ කායික හෝ මානසික සුවතාව වැඩිදියුණු කළ හැකි විභව්‍යතාවක් සහිත ද්‍රව්‍යය " මත්ද්‍රව්‍යය ලෙස වෛද්‍ය විද්‍යාව තුළ අර්ථකථනය කර ඇත. (ISSUP,2014, Universal Treatment Curriculum No 01)

ඖෂධවේදී විග්‍රහයට අනුව "ජෛව රසායනිකව හෝ ශරීරයේ පටක හෝ ඉන්ද්‍රියන්ගේ ක්‍රියාවලිය කායික විද්‍යාත්මකව වෙනසකට ලක් කරන ඕනෑම රසායනයක් ඖෂධයක් ලෙස හැදින්විය හැකිය." ( ISSUP,2014, Universal Treatment Curriculum No 01)

තවද පොදු විග්‍රහයට අනුව "වෛද්‍යමය නොවූ හේතු මත භාවිතා කරනු ලබන්නා වූ ද්‍රව්‍ය මත්ද්‍රව්‍ය., ලෙස හැදින්විය හැකිය. (ISSUP,2014, Universal Treatment Curriculum No 01)

සිසුන් තුළ මත්ද්‍රව්‍ය පිළිබද මෙම මූලික අදහස කෙබඳු ආකාරයෙන් ස්ථාපිත වී ඇද්ද යන්න මෙම සමීක්‍ෂණය තුළ සලකනු ලැබීය.

මත්ද්‍රව්‍ය යනු කුමක්ද යන්න සම්බන්ධයෙන් සිසුන් විසින් ඉදිරිපත් කර ඇති අදහස් විශ්ලේෂණය කිරීමේදී ඔවුන් මත්ද්‍රව්‍ය යන්න බහුවිධ දෘෂ්ටි කෝණයන් තුළින් හඳුනා ගෙන තිබූ බව අනාවරණය විය. එහිදී බහුතර සිසුන් පිරිසක් මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් පුද්ගලයාගේ මානසික හා ශාරීරික සෞඛ්‍යයට, සමාජයට ඇතිවන හානිකර තත්ත්වය පිළිබඳව නිවැරදි කරුණු හා මත සඳහන් කර තිබුණි. එම කරුණු හා මත පහත පරිදි විය.

**මත්ද්‍රව්‍ය භාවිතය මඟින් පුද්ගලයාගේ ශාරීරික හා මානසික සෞඛ්‍යයට, සමාජයට ඇතිවන බලපෑම පිළිබඳ නිවැරදි කරුණු හා මත**

| |
|---|
| "ශරීරය සහ මනස රෝගී කරන මෙන්ම අඩපණ කරන, පවුල් ප්‍රශ්න හා සමාජ ගැටලු, සෞඛ්‍ය ගැටලු ඇති කරන සිත හා මනස රවටන මත්වන විටෙක මරණය පවා ගෙන දෙන ද්‍රව්‍යයක් ... |
| නීත්‍යානුකූල නොවන දෙයක්... |
| ලෝකයට තර්ජනයක්ව පවතින ද්‍රව්‍යයකි ... |
| මිනිසාට ලංවීමටවත් නොදිය යුතු දෙයක් ... |
| ශරීරයට අහිතකර වූ රසායන ද්‍රව්‍ය වලින් නිපදවා ඇති, මිනිසුන් නොමග යවන, ජීවිතය විනාශ කරන දෙයක් ... |
| ජීවිතය වෙනස්ම මට්ටමකට ගෙනෙන විෂ ජාතියක්... |

| |
|---|
| ළමා පරිභෝජනයට නුසුදුසු මිනිස් මනස විකෘති කරන දෙයක්... |
| අපව ගිල දැමීමට එන මාරයා... |
| මිනිසුන්ගේ ජීවිතය කෙළසන ඔවුන්ගේ සැප සම්පත් නැති කරන රාක්ෂයෙකි... |
| උසස් මනසකින් යුතු මනුෂ්‍ය වර්ගයාව පිළිකුලට පත්කරන, ප්‍රශ්න ඇති කරන, ලෙඩ රෝග බෝ කරන රාක්ෂයෙක්... |
| මිනිස් ශරීරයත්, මනසත්, මනුසත්කමත්, සමාජයත් විනාශ කිරීමට මිනිසා තාවකාලිකව පිස්සෙක් බවට පත් කිරීමට ගන්නා ද්‍රව්‍යයක්... |
| මේ ලෝකයම, ඒ වගේම කුඩා ළමුන් පවා වැරදි ක්‍රියාවන් සඳහා පොළඹවන දෙයක්... |
| තමන්ට තමන්ව පාලනය කළ නොහැකි ද්‍රව්‍යයක්... |
| මත්ද්‍රව්‍ය භාවිතය කළහොත් මත්වී දිගටම එයට ඇබ්බැහි වන දෙයක්... |
| මුදල් නිකරුණේ වැය කිරීමට සිදුවන දෙයකි... |
| මිනිසුන් තම මානසික තත්ත්වය සහමුලින්ම කනපිට හරවාගෙන ආතතියෙන් කටයුතු කරන තත්ත්වයට පත්කරන දෙයක්... |
| මිනිස් ජීවිත වලට ආරවුල් ගෙනෙන, ළමුන් නොමග යැවීමට නිෂ්පාදනය කර ඇති, මිනිසා මුළුමනින්ම ගිල දමන මත් රකුසෙකි... |
| මානසික වශයෙන් පහළ මට්ටමක සිටින පිරිස් මිත්‍යා අදහස් නිසා භාවිතා කරන දෙයක්... |
| තමන්ගේ දුර්වලකම් නවතා ගන්න සමාජයේ place එකක් ගන්න පාවිච්චි කරන දෙයක්... |
| ජීවිතය විනාශ කරන මෙන්ම සතුට නැති කරන විෂ ද්‍රව්‍යයක්... ” |

**මූලාශ්‍රයః සමීක්ෂණ දත්ත 2016/17**

මත්ද්‍රව්‍ය සම්බන්ධ අදහස් ඉදිරිපත් කළ සිසුන් අතර ඇතැම් සිසුන් මත්ද්‍රව්‍ය වර්ග හා මත්ද්‍රව්‍ය භාවිත කරන ක්‍රම පිළිබඳව ද තොරතුරු දක්වා තිබුණි. එවැනි අදහස් අතර,

**මත්ද්‍රව්‍ය වර්ග පිළිබඳව සිසුන් දක්වා තිබූ අදහස්**

| |
|---|
| “දුම්වැටි, කුඩු, හොරොයින් ,KG, තුල්, මාවා, බියර්, අරක්කු, රම්, විස්කි ආදිය... |
| අරක්කු කුඩු ගංජා වැනි ඇබ්බැහි වන දේවල්... |
| මත්වීමට ගන්නා කෑමක් හෝ බීමක්... |
| එන්නත් කරගැනීමෙන්, පානය කිරීමෙන් හෝ ආග්‍රහණය කිරීමෙන් ශරීරගත කරගන්නා දෙයකි... |
| දීර්ඝකාලීන අතුරු ආබාධ ඇති කරන, නිකොටින් ආදී විවිධ ද්‍රව්‍ය යොදා සකස් කරනු ලබන දෙයකි... |
| ශරීරයට අහිතකර වූ ඇබ්බැහිකම මත පාවිච්චිය සඳහා යොමුවන දියරයක් ,කුඩු වර්ගයක් හෝ පෙති වර්ගයක් ... |
| පිටරටින් අප රටට ගෙන එන ද්‍රව්‍යයකි...” |

**මූලාශ්‍රයః සමීක්ෂණ දත්ත 2016/17**

මෙහිදී ඇතැම් සිසුන් මත්ද්‍රව්‍ය වර්ග හා මත්ද්‍රව්‍ය භාවිත කරන ආකාරය පිළිබඳව අදහස් ඉදිරිපත් කර තිබූ අතර එමගින් පැහැදිලි වන්නේ ඔවුන් ජීවත්වන තම පරිසරය හා ඇසුරු කරන පුද්ගලයින්ගේ චර්යා රටාවන් තුළ එවැනි දෑ නිරීක්ෂණය කර ඇති බවයි.

තවද මත්ද්‍රව්‍යවල ඇති ජෛව විද්‍යාත්මක බලපෑම හා එහි රසායනික සංයුතිය පිළිබඳව ද සිසුන් විසින් අදහස් දක්වා තිබුණි.

ඇතැම් සිසුන් විසින් ඉදිරිපත් කළ පහත අදහස් විශ්ලේෂණය කළ විටදී අනාවරණය වන්නේ සිසුන් මීට පෙර මත්ද්‍රව්‍ය අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් තුළින් පෝෂණය වී ඇති බවයි.

**ජෛව විද්‍යාත්මක බලපෑම හා එහි රසායනික සංයුතිය පිළිබඳ දැක්වූ අදහස්**

| |
|---|
| "රුධිර පීඩන මට්ටම වැඩිකරන හෝ ශරීරයට යම් උත්තේජනයක් ලබාදෙන ද්‍රව්‍යයක්... |
| සෞඛ්‍යට හානි පමුණුවන රසායනික ද්‍රව්‍යයක්... |
| විෂ රසායනිකයක්... |
| මිනිසාගේ ශරීරයට අහිතකර මානසික සිහිය නැති කරන/විකෘති කරන ද්‍රව්‍යයක්... |
| ඇබ්බැහි වන දෙයක් ..." |

මූලාශ්‍රයඃ **සමීක්ෂණ දත්ත** 2016/17

බහුතර සිසුන් පිරිසක් මත්ද්‍රව්‍ය වල අයහපත් පැතිකඩ පිළිබඳ නිවැරදි අදහස් ඉදිරිපත් කළත් ඇතැම් සිසුන් මත්ද්‍රව්‍ය භාවිතය පිළිබද වැරදි මත, එනම් මිථ්‍යා මත වල තවදුරටත් එල්බ සිටින බව සිසුන් ඉදිරිපත් කළ පහත ආකාරයේ ප්‍රකාශ වලින් තහවුරු වේ.

**මත්ද්‍රව්‍ය භාවිතය පිළිබද දක්වා තිබූ මිත්‍යා මත**

| |
|---|
| "මිනිසුන්ට කළ නොහැකි දේ කරන අත්භූත භයානක ද්‍රව්‍යයක්... |
| මත්වන දෑ එකතුකොට යම්කිසි රසවින්දනයක් ලබාදීමට තිබෙන දෑ... |
| විවිධ පුද්ගලයින් තමන්ට ඇති ශක්තිය, හීනකම නිසා මත්වීමට ගන්නා විවිධ ද්‍රව්‍ය... |
| ක්ෂණිකව උත්තේජනයන්ට ක්‍රියාකර ශරීරය අවනත කරන දෙයකි... |
| මත්වන දෑ එකතු කොට යම්කිසි රසවින්දනයක් ලබාදීමට තිබෙන දෑ... |
| කායික මානසික අවශ්‍යතා ඉටුකරගැනීමට භාවිත කරන විෂ සහිත ද්‍රව්‍ය... |
| අත්‍යවශ්‍ය දෙයක්... |
| මිනිසුන් විනෝදයට/ආශ්වාදයක් සඳහා භාවිතා කරන ද්‍රව්‍යයක් ලෙස... |
| තාවකාලික විනෝදයක් ලබාගැනීම සඳහා නිපදවූ දේවල්... |
| ආශාවන් ඉටුකරගැනීමට භාවිත කරන දෑ... |
| කෙටිකාලීන සතුටට පත්වන යමක්... |
| ළමා මට්ටමෙන් පරිභෝජනය කිරීමට නුසුදුසු දේවල්... |


මූලාශ්‍රයඃ **සමීක්ෂණ දත්ත** 2016/17

සිසුන් විසින් ඉදිරිපත්කර ඇති ඉහත අදහස් විශ්ලේෂණය කර බලන විට සිසුන් මෙවැනි අදහස් වල එල්බ ගෙන සිටිනුයේ කිසියම් මත්ද්‍රව්‍යක් භාවිතයෙන් ලද වැරදි අත්දැකීම් හෝ සිය මත්ද්‍රව්‍ය භාවිත කරන මිතුරන්, පවුලේ සමාජිකයින් හෝ සිය සමීපතම පුද්ගලයින් හරහා ලද මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ අත්දැකීම් සහ මිථ්‍යා මත ඔවුන් තුළ ස්ථාපිත වීමේ ප්‍රතිඵලයක් ලෙස බව ප්‍රකාශ කළ හැකිය.

### 2.7.2 මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ දැනුවත්භාවය හා දැනුම ලබාගත් මූලාශ්‍ර

මත්ද්‍රව්‍ය භාවිත කිරීම තුළින් ඇතිවන අහිතකර ප්‍රතිවිපාක පිළිබඳව හෝ, මත්ද්‍රව්‍ය භාවිතයෙන් වැළකීමට අවශ්‍ය උපදෙස්, දැනුම, ලබා දෙන්නා වූ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් වලට සිසුන් සම්බන්ධ වී තිබේද යන්න සමීක්ෂණයේ දී විමසා බලන ලද අතර ඒ අනුව සිසුන්ගෙන් 74% (3,741) ක් කුමන හෝ දැනුවත්කිරීමේ වැඩසටහනකට සම්බන්ධ වී තිබූ අතර සිසුන්ගෙන් 26% (1,334) ක් දැනුවත් කිරීමේ වැඩසටහන් වලට සහභාගි වී නොතිබුණි. කුමන හෝ නිවාරණ වැඩසටහනකට සහභාගී වූ සිසුන් අතරින් 70% (2,601) ක් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහනකට සහභාගී වී තිබූ බව අනාවරණය විය. 11% (395) ක් මත්ද්‍රව්‍ය වලින් වැළකීම සඳහා උපදෙස් ලබා දෙන වැඩසටහන්වලට සහභාගි වී තිබූ අතර 10% (381) ක් මත්ද්‍රව්‍ය සම්බන්ධ විෂයානුබද්ධ පාඩම්වලට සහභාගී වී තිබුණි. 9% (354) ක් මත්ද්‍රව්‍ය භාවිතයෙන් සිදුවන සෞඛ්‍ය ගැටලු පිළිබඳව දැනුවත් වී තිබූ බව අනාවරණය විය.

**ප්‍රස්තාරය 28 - මත්ද්‍රව්‍ය භාවිතයේ ප්‍රතිවිපාක පිළිබඳ සිසුන්ගේ දැනුවත්භාවය**




**මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත 2016/17**

"මත්ද්‍රව්‍ය නිවාරණය" යනු මත්ද්‍රව්‍ය භාවිතය ආරම්භ කිරීම වැළැක්වීමට ගන්නා ක්‍රියාවලියක් හෝ මත්ද්‍රව්‍ය භාවිත කිරීම සම්බන්ධ ගැටලු වර්ධනය සීමා කිරීමක් වන අතර නිවාරණ ප්‍රයත්නයන්හිදී පුද්ගලයා හෝ ඔවුන්ගේ වටපිටාව කෙරෙහි අවධානය යොමු කළ හැකිය." (SCODC, September, 2008)

කිසියම් පුද්ගලයෙකු මත්ද්‍රව්‍ය අත්හදා බැලීමෙන් වළක්වා ගත හැකි නම් ඔහු එම මත්ද්‍රව්‍යය සඳහා ඇබ්බැහි වීමෙන්ද වලක්වා ගත හැකිය. ඇබ්බැහි වීමෙන් පසු ප්‍රතිකාර කිරීමට වඩා මත්ද්‍රව්‍ය භාවිතය

සඳහා යොමුවීමට පෙර ඉන් වලක්වා ගැනීම, වඩාත් ප්‍රශස්ත වූත් ප්‍රායෝගික වූත් උපක්‍රමය ලෙස දැක්විය හැකිය. (Prevention is better than cure) එබැවින් පාසැල් සිසුන් තුළ "මත්ද්‍රව්‍ය නිවාරණය" පිළිබඳ වඩාත් ධනාත්මක අදහසක් ස්ථාපනය වී තිබීම වැදගත් වන අතර මෙම සමීක්ෂණයේදී පාසල් සිසුන්ගේ මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධ දැනුම හා අවබෝධය විමසනු ලැබූ අතර එහිදී සිසුන් " මත්ද්‍රව්‍ය නිවාරණය" යන්න පහත පරිදි විග්‍රහ කර තිබුණි.

සමීක්ෂණය තුළ නියැදියට සම්බන්ධ වූ සිසුන් අතරින් බහුතරයක් නිවාරණය සම්බන්ධයෙන් නිවැරදි අදහස් දක්වා තිබුණද මත්ද්‍රව්‍ය නිවාරණය යන්න වඩාත් පරිපූර්ණ අර්ථ නිරූපණයක් ඔවුන්ගේ පිළිතුරු තුළින් විද්‍යමාන නොවූ බව ප්‍රකාශ කළ හැකිය.

සිසුන්ගෙන් බහුතරයක් "මත්ද්‍රව්‍ය නිවාරණය" යන්න "මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධ දැනුම හා උපදෙස් ලබාදෙන ප්‍රතිකාර ක්‍රියාවලියක් " ලෙස අර්ථකථනය කර ඇති බව පහත අදහස් විශ්ලේෂණ කිරීමෙන් නිගමනය කළ හැකිය.

" මත්ද්‍රව්‍යයට ඇබ්බැහි වූ අයට මත්ද්‍රව්‍ය මඟින් ඇතිවන ප්‍රතිවිපාක පිළිබඳව අවබෝධයක් ලබාදී එයින් වැළකීම...

මත්ද්‍රව්‍ය භාවිතයෙන් තොර සමාජයක් ඇති කිරීම සඳහා මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් දැනුවත් කිරීම...

මත්ද්‍රව්‍ය භාවිත කරන්නන්ට ප්‍රතිකාර කිරීම...

මත්ද්‍රව්‍ය ඇබ්බැහි වූ පුද්ගලයන් ඉන් මුදවා ගැනීමට හා භාවිතය අවම කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දීම මෙන්ම ප්‍රායෝගිකව එය ක්‍රියාත්මක කිරීම...

මත්ද්‍රව්‍ය භාවිතයෙන් පීඩා විඳින්නන් යහමඟට ගැනීම...

මත්ද්‍රව්‍ය වලට පෙළඹුන පුද්ගලයන් ඉන් මුදවාගැනීම, මත්ද්‍රව්‍ය තුරන් කිරීම, බෙදාහරින්නන් හා ගෙන්වන්නන් මර්දනය කිරීම ආශ්‍රිත ක්‍රියාවලියකි...

මත්ද්‍රව්‍ය භාවිතය අවම කිරීම..."

"මත්ද්‍රව්‍ය නිවාරණය" යන්න මත්ද්‍රව්‍ය භාවිතයේ අහිතකර ප්‍රතිවිපාක පිළිබඳ අවබෝධයක් ලබා දෙන පුද්ගලයා හා ප්‍රජාව පදනම් කරගත් ප්‍රායෝගික ක්‍රියාවලියක් ලෙස ද, සිසුන් සුළු පිරිසක් විසින් හඳුනාගෙන ඇති බව පහත අදහස් මඟින් පැහැදිලි වේ.

"මත්ද්‍රව්‍ය වලින් සිදුවන අහිතකර ප්‍රතිවිපාක වලින් වැළකී සිටීමට දායක වන ප්‍රායෝගික වැඩපිළිවෙලකි...

මත්ද්‍රව්‍ය හේතුවෙන් ඇතිවන ශාරීරික, මානසික, සමාජයීය හා අධ්‍යාත්මික වශයෙන් වූ අහිතකර බලපෑම් මැඩපැවැත්වීමට කටයුතු කිරීම...

මත්ද්‍රව්‍ය වලින් ඇත් වී ජීවිතය විනාශ කරගැනීමෙන් වැළකී සිටින්නට උපදෙස් ලබාදීම...

යම් ප්‍රදේශයක හෝ ස්ථානයක මත්ද්‍රව්‍ය භාවිතා කරන පුද්ගල සංඛ්‍යාව අඩු කිරීම හා එම ප්‍රදේශයෙන් මත්ද්‍රව්‍ය ඉවත් කිරීම...

මත්ද්‍රව්‍ය භාවිතය තමාගෙනුත්, අන් අයගෙනුත්, සමාජයෙනුත් ඉවත්කර දැමීමට කටයුතු කිරීම...

මත්ද්‍රව්‍ය භාවිතය නැවැත්වීමට පිළියම් යෙදීම සහ එයින් ඇතිවන අහිතකර බලපෑම් නිරාකරණය

| |
|---|
| කිරීමට යොදාගන්නා උපක්‍රමයක්... |
| මත්ද්‍රව්‍ය නැති කිරීම... |
| " මත්ද්‍රව්‍යයන්ට ඇබ්බැහි නොවූ අයට මත්ද්‍රව්‍ය මඟින් ඇතිවන ප්‍රතිවිපාක පිළිබඳව අවබෝධයක් ලබාදී එයින් වැළකීම... |
| මත්ද්‍රව්‍ය ආදීනව සම්බන්ධව ප්‍රජාව දැනුවත් කර ඔවුන් එයින් මුදවා ඒවායින් වලකාලීම/ මුදවා ගැනීම. |


සමීක්ෂණය තුළ සිසුන්ගෙන් බහුතරයක් "මත්ද්‍රව්‍ය" යනු කුමක්ද? යන්නට පිළිතුරු දක්වා තිබුණද මත්ද්‍රව්‍ය නිවාරණය යනු කුමක්ද? යන්න සම්බන්ධව සාපේක්ෂව අඩු ප්‍රතිචාර ප්‍රමාණයක් දක්වා තිබිණි. තවද මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධව සිසුන් විසින් ඉදිරිපත් කළ එක් එක් අදහස් විශ්ලේෂණය කළ විටදී මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ පෙර සඳහන් පොදු අර්ථකථන හා සසඳන කල්හි සිසුන්ගෙන් සුළු පිරිසක් මත්ද්‍රව්‍ය නිවාරණය නිවැරදි ලෙස හඳුනාගෙන තිබූ නමුත් බහුතරයක් තුළ මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධයෙන් පරිපූර්ණ අවබෝධයක් නොතිබුණ බව ඔවුන්ගේ අදහස් තුළින් විද්‍යමාන විය.

මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධයෙන් සිසුන් තුළ පූර්ණ අවබෝධයක් නොමැති වීමෙන් සිසුන් මත්ද්‍රව්‍ය අත්හදා බැලීම හෝ අඛණ්ඩ භාවිතය කෙරෙහි යොමුවිය හැකි බවත් මේ අනුව සිසුන් තුළ මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධ තවදුරටත් දැනුම යාවත්කාලීන කළ යුතුව ඇත.

### 2.8.3 සිසුන් ජීවත්වන ප්‍රදේශ තුළ පවතින සමාජ හා සෞඛ්‍ය ගැටලු පිළිබඳ දැනුවත් බව

මත්ද්‍රව්‍ය භාවිතය නිසා සිදුවන සෞඛ්‍ය, සමාජ, පාරිසරික ගැටලු හා ඒ අශ්‍රිත නීතිවිරෝධී ක්‍රියාකාරකම් හා අපචාරී ක්‍රියා පිළිබඳව සිසුන්ගේ දැනුම විමසා බැලූ අතර සිසුන්ගෙන් 53% (2694) ක් එවැනි ක්‍රියා පිළිබඳ දැනුවත් වී තිබුණු අතර 47% (2381) ක් ඒ පිළිබඳව නොදන්නා බව ප්‍රකාශ කර තිබුණි.

ප්‍රස්තාරය 29 - **සමාජ අපගාමී හා සමාජ අපචාරී ක්‍රියා පිළිබඳ සිසුන්ගේ දැනුම**




මූලාශ්‍රයඃ සමීක්ෂණ දත්ත 2016/17


සිසුන් ප්‍රකාශ කළ පරිදි ඔවුන් ජීවත්වන සමාජ පරිසරය තුළ ප්‍රධාන වශයෙන් මත්ද්‍රව්‍ය භාවිතය නිසා සමාජීය හා පාරිසරික ගැටලු මෙන්ම වෙනත් නීති විරෝධී ක්‍රියා සිදුවන බව අනාවරණය විය.

නියැදිය තුළ එවැනි ගැටලු ඇතැයි ප්‍රකාශ කළ සිසුන්ගෙන් 47% (1265) ක් මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධ ගැටලු පවතින බව ප්‍රකාශ කර තිබිණ. සිසුන් ජීවත්වන පරිසරය අවට මිනිසුන් මත්ද්‍රව්‍ය අලෙවිය හා ජාවාරම වැනි කටයුතු වල නිරත වන බව ද සිසුන්ගෙන් 22% (592) ක් ද අඩදබර හා කලකෝලාහල පවතින බවට 13% (344) ක් ද පරිසර දූෂණයක් සිදුවන බවට 7% (183) ක් ද සෞඛ්‍ය ගැටලු පවතින බවට 7% (189) ක් ද ප්‍රකාශ කර තිබුණි. තවද ළමා අපචාර/අපයොජන, ස්ත්‍රී දූෂණ, ගණිකා වෘත්තිය, සොරකම් කිරීම්, වංචා කිරීම් වැනි සමාජ විරෝධී ක්‍රියාවන් ද දරිද්‍රතාවය වැනි ගැටලු ද සිසුන්ට නිරීක්ෂණය වී ඇති අතර එවැනි දෑ 2% හෝ ඊට අඩු මට්ටමක පවතින බවත් අනාවරණය විය.

### 2.7.4 මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් පිළිබඳව සිසුන්ගේ දැනුවත්භාවය

සිසුන් ජීවත්වන ප්‍රදේශයේ මත්ද්‍රව්‍ය භාවිතය නිසා ගැටලු වලට මුහුණ දුන් පුද්ගලයින් පිළිබඳව සිසුන්ගේ දැනුවත්භාවය පිළිබඳව විමසන ලදි. සිසුන්ගෙන් 65% (3275) ක් මත්ද්‍රව්‍ය භාවිතය නිසා විපතට පත් එවැනි පුද්ගලයින් තම ගම් ප්‍රදේශවල ජීවත්වන බවට තමා දැනුවත් බවත් සිසුන්ගෙන් 35% (1800) ක් මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් පිළිබඳව නොදන්නා බවත් ප්‍රකාශ කර තිබුණි.

**ප්‍රස්තාරය 30 - මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් පිළිබඳව සිසුන්ගේ දැනුවත්භාවය**




මුලාශ්‍රයඃ සමීක්ෂණ දත්ත 2016/17

ජීවත් වන ප්‍රදේශය තුළ මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් ගැටලුවලට මුහුණ දුන් පුද්ගලයින් සිටින බවට දැනුවත් සිසුන්ගෙන් 56% (1846) ක් සිය අසල්වැසියන් එවැනි ගැටලුවලට මුහුණ දී ඇති බව ප්‍රකාශ කර ඇත. තවද සිසුන්ගෙන් 11% (351) ක් තම යහලුවන් ද 9% (308) ක් තම ඥාතීන් ද මත්ද්‍රව්‍ය භාවිතය නිසා ගැටලුවලට මුහුණ දී ඇති බව ප්‍රකාශ කර ඇත. මේ අනුව පැහැදිලි වන්නේ සිසුන්ගේ පවුලේ සාමාජිකයින්, ඥාතීන් හා අසල්වැසියන්, මිතුරන් මත්ද්‍රව්‍ය භාවිත කරන බවත් ඔවුන් එවැනි පරිසරයක් තුළ ජීවත් වන බවත්ය.

වගුව 20 - ජීවත් වන ප්‍රදේශය තුළ මත්ද්‍රව්‍ය භාවිතය නිසා ගැටලුවලට මුහුණ දුන් පුද්ගලයින් පිළිබද දැනුවත්භාවය

| තමා දන්නා පුද්ගලයින්ගේ සම්බන්ධතාවය | සංඛ්‍යාව | ප්‍රතිශතය% |
|---|---|---|
| පවුලේ සාමාජිකයින් | 136 | 4% |
| අසල්වැසියන් | 1,846 | 56% |
| ඥාතීන් | 308 | 9% |
| යහලුවන් | 351 | 11% |
| පිළිතුරු නොදුන් සංඛ්‍යාව | 876 | 27% |
| එකතුව | 5075 | 100% |

මූලාශ්‍රයඃ සමීක්ෂණ දත්ත 2016/17

**2.7.5 පාසල් මත්ද්‍රව්‍ය නිවාරණ කමිටුවල සාමාජිකත්වය**


සිසුන් මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීමේ ඉඩකඩ අවම කිරීම උදෙසා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය ඇතුළු රජයේ සහ රාජ්‍ය නොවන ආයතන විසින් පාසල් සිසුන්, දෙමාපියන්, ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වනු ලබයි. තවද සිසුන්ගේ දැනුම කුසලතා, නිපුණතා සංවර්ධනය කිරීමේ අරමුණින් මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු පිහිටුවා ඇති අතර මෙම කමිටු වල (School Quality Society) සාමාජිකත්වය පිළිබඳව සිසුන්ගෙන් විමසන ලදි.

සිසුන්ගෙන් 8% (408)ක් පමණක් දැනට මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු වල සාමාජිකයන් වූ අතර 92% (4667)ක් ම මත්ද්‍රව්‍ය නිවාරණ කමිටුවලට සහභාගී වී හෝ සාමාජිකත්වය ලබා නොතිබුණි.

**2.8.6 මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් සඳහා සහභාගි වීමට සිසුන් තුළ ඇති අවශ්‍යතාවය**

මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් වලට සහභාගී වීමට සිසුන් තුළ ඇති කැමැත්ත හා අවශ්‍යතාවය පිළිබඳව මෙම සමීක්ෂණයේ දී විමර්ශනය කළ අතර එවැනි වැඩසටහන් සඳහා සහභාගීවීමට සිසුන් 81% (4088) ක් තම කැමැත්ත ප්‍රකාශ කර තිබිණ. සිසුන් 19% (987) ක් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් වලට සහභාගීවීමට අකමැත්ත ප්‍රකාශ කර තිබිණ. මේ අනුව පැහැදිලි වන්නේ සිසුන් තුළ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් සම්බන්ධයෙන් විෂය පිළිබඳ දැනුම ලබාගැනීමට අවශ්‍යතාවක් පවතින බවයි.

ප්‍රස්තාරය 31 - සිසුන් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් වලට සහභාගි වීමේ සංයුතිය




මූලාශ්‍රයෘ සමීක්ෂණ දත්ත 2016/17

මත්ද්‍රව්‍ය භාවිත කිරීම හෝ නොකිරීම මඟින් මත්ද්‍රව්‍ය නිවාරණය කෙරෙහි සිසුන් දක්වන කැමැත්ත වෙනස්විය හැකි ද යන්නත් මෙහිදී අධ්‍යයනය කළ අතර ඒ සඳහා එක් දිනක් හෝ මත්ද්‍රව්‍ය භාවිත කළ, දැනට මත්ද්‍රව්‍ය භාවිතයේ යෙදෙන හා මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි කෙදිනකවත් යොමුවී නොමැති එක් එක් සිසුන්ට ප්‍රතිශතයක් ලෙස සලකමින් දත්ත විශ්ලේෂණය සිදු කරන ලදී.

එක් දිනක් හෝ මත්ද්‍රව්‍ය භාවිත කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස සිසුන් 24% ක් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් වලට සහභාගි වීමට සිය අකමැත්ත ප්‍රකාශ කර තිබිණි. එමෙන්ම දැනට කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස 26% ක් මෙවැනි වැඩසටහන් වලට සහභාගි වීමට අකමැත්ත ප්‍රකාශ කර තිබූ අතර කිසිදිනක මත්ද්‍රව්‍ය භාවිත නොකළ සිසුන්ට ප්‍රතිශතයක් ලෙස සිසුන් 18% ක් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් වලට සහභාගිවීමට සිය අකමැත්ත ප්‍රකාශ කර තිබිණ. මේ අනුව පැහැදිලි වන්නේ කිසිදිනෙක මත්ද්‍රව්‍ය භාවිත නොකළ සිසුන්, එක් දිනක් හෝ මත්ද්‍රව්‍ය භාවිත කළ හා දැනට මත්ද්‍රව්‍ය භාවිත කරන සිසුන්ට වඩා අඩු ප්‍රතිශතයක් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් වලට සහභාගි වීමට අකමැත්ත ප්‍රකාශ කර තිබූ බවයි. මේ අනුව එක් දිනක් හෝ මත්ද්‍රව්‍ය භාවිත කළ හෝ දැනට මත්ද්‍රව්‍ය භාවිත කරන සිසුන් තුළ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් පවතින නැඹුරුතාව, මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් වලට සහභාගි වීමට දක්වන අකමැත්ත තුළින් තවදුරටත් පැහැදිලි කර ගතහැකි වේ.

එවැනි වැඩසටහන් වලට සහභාගී වීමට කැමැත්ත ප්‍රකාශ කළ සිසුන්ගෙන් ඒ සඳහා පහත හේතු සාධක ඉදිරිපත් කර තිබුණි.

මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් වලට සිසුන් සහභාගි වීම තුළින් මත්ද්‍රව්‍ය භාවිතයේ අහිතකර ප්‍රතිවිපාක පිළිබඳ ඔවුන්ට අවබෝධයක් ලබාගැනීමටත් මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවිය හැකි අවදානම් සහිත සිසුන්ට එයින් වැලකී සිටීමටත් අවස්ථාවක් වනු ඇත. එය සිසුන්ට පෞද්ගලික වශයෙනුත් සමාජීය වශයෙනුත් ඉතා වටිනා අවස්ථාවක් ලෙස දැක්විය හැකිය. මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්

වලට සහභාගී වීමට කැමැත්ත ප්‍රකාශ කළ සිසුන් එයට හේතු ලෙස ඉදිරිපත් කරන ලද කරුණු පහත පරිදි ප්‍රධාන අංශ 2 ක් යටතේ විශ්ලේෂණය කරන ලදී.

- **දැනුම ලබා ගැනිමට**

| |
|---|
| "මත්ද්‍රව්‍ය උවදුර ගැන දැනගෙන ඒවා භාවිතා කරන්නන් ඉන් මුදවා ගැනීමට... |
| සමස්ත සමාජයම දැනුවත් කිරීමට... |
| මත්ද්‍රව්‍ය වල අහිතකරභාවය පිළිබඳ අවබෝධයක් ලබා දෙන නිසා... |
| මත්ද්‍රව්‍ය වල අහිතකර ප්‍රතිඵල අන්අයට කියාදිය හැකි නිසා... |
| මත්ද්‍රව්‍ය පිළිබඳ නොදන්නා කරුණු දැන ගැනීමට... |
| මත්ද්‍රව්‍ය භාවිතයෙන් වැලකීමට උපදෙස් ලබා ගැනීම සඳහා ... |
| රට  තුළ මත්ද්‍රව්‍ය නිවාරණය සිදුකරන අන්දම ඉගෙන ගැනීමට... |
| මත්ද්‍රව්‍යන්  වලින් ඇතිවන රෝගාබාධ දැනගැනීමට... |
| මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ දැන ගැනීමට... |
| මත්ද්‍රව්‍ය ශරීරයට අහිතකර වන්නේ ඇයිද යන්න අවබෝධ කර ගැනීමට... " |

- **අන් අය මත්ද්‍රව්‍ය භාවිතයෙන් මුදවා ගැනීම හා සමාජ යහපත උදෙසා**

| |
|---|
| "සමාජයේ යහපත උදෙසා... |
| යහපත් පුරවැසියෙක් ලෙස ජීවත් වීමට... |
| මත්ද්‍රව්‍ය නිවාරණයට සහාය වීමට... |
| මත්ද්‍රව්‍ය නිසා සිදුවන දුරාචාරය හා සෞඛ්‍යයට සිදුවන හානිය වැලැක්වීමට... |
| සමාජයට අපවිසින් කළ යුතු වගකීමක් ලෙස සිතා... |
| රටේ ජනතාවගේ හොද සෞඛ්‍ය ආරක්ෂාව උදෙසා... |
| මත්ද්‍රව්‍ය භාවිතයෙන් සිදුවන විපත් අවම කර ගැනීමට... |
| අයහපත් දේට අකමැති නිසා  යහපත් දේ ලබා ගැනීමට ..." |
| "මත්ද්‍රව්‍ය භාවිතය නැති කිරීමට... |
| මත්ද්‍රව්‍යයෙන් තොර රටක් බිහිකිරීම සඳහා ... |
| පාසැල තුළ මත්ද්‍රව්‍යයට යොමුවී සිටින අය ඉන් මුදවා ගැනීම... |
| මත්ද්‍රව්‍ය භාවිතය අවම කිරීමට සහය විය හැකි නිසා... |
| මත්ද්‍රව්‍ය වලින් තොර ලොවක් මතු පරපුරට ලබාදීම උදෙසා... |
| මත්ද්‍රව්‍ය භාවිතකරන අයට ආදර්ශයක් වීමට... " |

ඉහත ප්‍රකාශ කර ඇති කරුණු තුළින් පැහැදිලි වන්නේ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් පැවැත්වීම තුළින් ලැබිය හැකි ප්‍රතිඵල සම්බන්ධයෙන් සිසුන් තුළ යම් අවබෝධයක් තිබූ  බවයි. එවැනි අවබෝධයක් සිසුන් තුළ පැවතීම පුද්ගලිකව ඔවුන් මත්ද්‍රව්‍ය භාවිතයට යොමු නොවී වැළකී සිටීමට හේතු වී ඇති බවයි.

## 03. නිගමන

සමීක්ෂණයේ දත්ත විශ්ලේෂණය අනුව පහත නිගමනවලට එළඹිය හැකිය.

- පාසැල් සිසුන් අතර මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳව දත්ත විශ්ලේෂණය කළ විට මෙම නියැදිය තුළින් සුළුතරයක් සිසුන් කුමන හෝ මත්ද්‍රව්‍යයක් එක්වරක් හෝ භාවිත කර තිබුණි. එය 16% කි. නිතර මත්ද්‍රව්‍ය භාවිත කරන සිසුන් 6% ක් නියැදියෙන් හමුවිය. මේ අනුව පාසැල් සිසුන් සුළුතරයක් මත්ද්‍රව්‍ය භාවිත කරන බවත් එම සුළුතරය විසින් පාසැල තුළ සිදුකරනු ලබන පෙළඹවීම් මත හා විවිධ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් පාසැල් සිසුන්ට විවිධ මත්ද්‍රව්‍ය හඳුන්වා දීමට කටයුතු කිරීමත් යන ප්‍රබල සාධක මත මත්ද්‍රව්‍ය භාවිත කරන පාසැල් සිසුන්ගේ සංඛ්‍යාව මෑත කාලීනව ක්‍රමික වර්ධනයක් දැකගත හැකි බව නිගමනය කළ හැකිය.
- මත්ද්‍රව්‍ය අත්හදා බැලූ හෝ දැනට භාවිත කරන සිසුන් ගත්කල බහුතරයක් සිසුන් අතර දුම්බීමේ (සිගරට්) 5.52% ක් ද ප්‍රවණතාවයක් පෙන්වූ අතර දෙවනුව මද්‍යසාර/බියර් 4.6% ක් ද සහ තෙවනුව දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන (දුම්කුඩු) 3% ක ප්‍රවණතාවයක් දක්නට ලැබුණි.
- අධ්‍යයනයට ලක්කළ දිස්ත්‍රික්ක අතුරින් කොළඹ, මහනුවර හා පුත්තලම යන දිස්ත්‍රික්ක සැළකිල්ලට ගත් විටදී සිසුන්ගේ බහුවිධ මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය ඉහළ යෑමක් ඇති බව නිගමනය කළ හැකිය.
- සමීපතම පුද්ගලයින් හරහා සිසුන් වැඩි වශයෙන් සිගරට්, මද්‍යසාර, බියර් හා දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන (දුම්කුඩු) වැනි ප්‍රාථමික මත්ද්‍රව්‍ය කෙරෙහි යොමුවීම නිසා සිසුන්ගෙන් බහුතරයක් අනෙකුත් මත්ද්‍රව්‍ය වලට සාපේක්ෂව සිගරට්, මද්‍යසාර, බියර් හා දුම්කුඩු වැනි මත්ද්‍රව්‍ය කෙරෙහි යොමුවීමක් දක්නට ඇත. එමෙන්ම මත්ද්‍රව්‍ය භාවිත නොකරන සිසුන් ද ඉහත මත්ද්‍රව්‍ය අත්හදා බැලීම හෝ භාවිතය කෙරෙහි යොමුවීමේ ඉහළ අවදානමක සිටින බවත් මෙහිදී නිගමනය කළ හැකිය.
- පාසැල් සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයට පරිසර සාධක ඉතා ඉහලින් බලපා ඇති බවත් සිසුන් ඇසුරු කරන සමීපතම මිතුරන්, සිසුන් ජීවත්වන නිවසේ සමාජිකයින්, අසල්වැසියන් හා ප්‍රජාවගේ මත්ද්‍රව්‍ය භාවිත තත්ත්වයන්, ඔවුන්ගේ හැසිරීම් රටාවන් හා ඔවුනොවුන්ගේ මත්ද්‍රව්‍ය සම්බන්ධ ආකල්ප, කිසියම් සිසුවෙකු මත්ද්‍රව්‍ය අත්හදා බැලීම හෝ භාවිත කිරීම කෙරෙහි සෘජුවම බලපාන බව විශ්ලේෂිත තොරතුරු මගින් නිගමනය කළ හැකි විය. ඒ අනුව සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි ඔවුන්ගේ පරිසරය විශාල බලපෑමක් කරන බව අනාවරණය විය.
- සිසුන්ට මත්ද්‍රව්‍ය භාවිතයෙන් වැළකී සිටීමට දෙමාපියන්ගේ ආදරය හා රැකවරණය අත්‍යවශ්‍ය බව මෙහිදී අනාවරණය වූ අතර දෙමාපියන්ගේ ආදරය හා රැකවරණය අවම මට්ටමක පවතින අවස්ථාවන්හිදී හා එවැනි අවස්ථාවන්හි දී සිසුන් මත්ද්‍රව්‍ය වලට යොමුවීමේ ප්‍රවණතාවක් පවතින බව නිගමනය කළ හැකි විය.
- තවද සිසුන්ගේ දෙමාපියන්ගේ අධ්‍යාපන මට්ටම, සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි බලපෑම් කළ කළ හැකි බවත් නිගමනය කළ හැකි විය.

- සිසුන් ඉලක්ක කරගනිමින් විවිධ පිරිස් විසින් මත්ද්‍රව්‍ය ජාවාරම් සිදුකරන බවත් සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ගේ අනිසි බලපෑම් ද හේතුවී ඇති බවද නිගමනය කළ හැකි විය.
- ඇතැම් පාසැල්වල මත්ද්‍රව්‍ය භාවිත කරන සිසුන්ව පාසැල් තුළ ප්‍රසිද්ධ කිරීම, දඩුවම් කිරීම හා පාසැලේ ශිෂ්‍යභාවයෙන් ඉවත් කිරීම් ආදි සිදුවීම් සිදුව ඇති බවට තොරතුරු අනාවරණය කර ගත හැකි විය. එසේ කිරීම තුළින් සිසුන් තවදුරටත් මත්ද්‍රව්‍ය භාවිතයට පෙළඹවීමේ ඉඩ ප්‍රස්ථා වැඩිවන බව තහවුරු විය.

## 04. යෝජනා

- ✓ **අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, අධ්‍යාපන අමාත්‍යාංශය හා අනෙකුත් පාර්ශවකරුවන් ඒකරාශී වීමෙන් සමස්ථ පාසැල් පද්ධතිය තුළ අඛන්ඩව ක්‍රියාත්මක කළහැකි මත්ද්‍රව්‍ය නිවාරණ හා ප්‍රතිකාර වැඩසටහනක් ස්ථාපිත කිරීම.**

  කොළඹ, මහනුවර හා පුත්තලම යන දිස්ත්‍රික්ක වල අන්තරායකර ඖෂධ වන ගංජා හා මනෝවර්තක ගණයේ ඖෂධ (පෙතිවර්ග) ක්‍රමයෙන් ප්‍රචලිතවීමේ ප්‍රවණතාවක් දක්නට ඇති බැවින් එම දිස්ත්‍රික්කයන් සඳහා විශේෂ අවධානයක් යොමුකර ගංජා හා මනෝවර්තක ගණයේ ඖෂධ භාවිතය තුරන්කිරීම සඳහා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් ආරම්භ කළ යුතු වේ. නියැදියේ හෙරොයින් අත්හදා බැලූ සිසුන් දෙදෙනෙකු හමුවුවද කොළඹ දිස්ත්‍රික්කයේ හෙරොයින් සුලභතාවය සහ භාවිතයේ වර්ධනය සමග පාසැල් සිසුන් කෙරෙහි ද අවධානමක් ඇත. එබැවින් මේ පිළිබඳව ද අවධානය යොමුකළ යුතුය.
- ✓ **මත්ද්‍රව්‍ය නිවාරණය හා එහි වැදගත්කම පිළිබඳව සිසුන්ගේ මනසේ වඩාත් අවධාරණය වන පරිදි දැනුම් පරිචයන් පාසැල් විෂය නිර්දේශය තුළට ඇතුලත් කිරීම.**

  මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි යොමුවූ සිසුන් පාසැලේ ශිෂ්‍යභාවයෙන් ඉවත් කිරීම, ප්‍රසිද්ධ කිරීම හෝ දඩුවම් කිරීම වැනි ක්‍රියාමාර්ග මේ සඳහා සාර්ථක විසඳුම් නොවන බැවින් ඔවුන්ට මත්ද්‍රව්‍ය භාවිතයෙන් ඉවත් වීමට හා මත්ද්‍රව්‍ය භාවිතය හා සම්බන්ධ ඔවුන්ගේ පෞද්ගලික ගැටලු විසදා ගැනීමට අවස්ථා උදා කර දිය යුතුය. ඒ සඳහා උපදෙස් හා අවශ්‍ය පරිසරය සකසා දීම වඩාත් ප්‍රතිඵලදායක වන අතර මේ සඳහා පාසලේ සුදුසුකම් ලත් ගුරුවරයෙකු උපදේශකවරයෙකු ලෙස පුහුණු කිරීම හෝ සෑම පාසැලකටම උපදේශන ගුරුවරුන් බඳවා ගැනීම.
- ✓ **නීතිය ක්‍රියාත්මක ආයතන මෙම ජාවාරම් සම්බන්ධව විශේෂ අවධානයක් යොමුකර ජාවාරම් සම්බන්ධ ඉහළ පෙළ පුද්ගලයින් හඳුනාගැනීම හා නීතිය ක්‍රියාත්මක කිරීම සිදුකළ යුතු වේ.**

  පාසැල් කාලයෙන් අනතුරුව සිසුන් ගැවසෙන ස්ථාන හා උපකාරක පන්ති අවට මත්ද්‍රව්‍ය අලෙවි කරන වෙළඳසැල් ඇද්දැයි හදුනා ගැනීම හා එවැනි ස්ථාන සම්බන්ධව නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ වැඩසටහනක් නීතිය ක්‍රියාත්මක හා බලාත්මක ආයතන ඒකාබද්ධව සැලසුම් කිරීම හා කඩිනමින් ක්‍රියාත්මක කිරීම.

## ආශ්‍රිත ග්‍රන්ථ

UNDESA, (January, 2013). Retrieve from http://www.un.org/esa/socdev/documents/youth/ fact-sheets/ youth - definition.pdf

ISSUP, (2014).Universal Treatment Curriculum No 01, Physiology, and Pharmacology for Addiction Professionals Publication of United States of America

SCODC, (September, 2008). Retrieved from http://www.scodc.org/tag/drug-prevention/

Lewis, (August, 2017). Retrieved from https://www.livestrong.com/article/79017-factors-influence-drug-abuse/

National Dangerous Drugs Control board. Handbook of Drug Abuse Information in Sri Lanka. rajagiriya: National Dangerous Drugs Control board; 2017. 70 p.